

# 2012

# වාර්ෂික වාර්තාව

## සීමාසහිත හලාවත වැවිලි සමාගම

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය

# අන්තර්ගතය

## පිටු අංකය


අපගේ දැක්ම, මෙහෙවර හා වටිනාකම් .................... 01
ආයතනික විස්තර .................... 02
ඓතිහාසික වර්ධන අවස්ථා (පොල් වගාව හා සමාගම) .................... 03
මූල්‍ය සාරාංශය .................... 04
විශේෂිත අංක .................... 05
2012 වසරේ වැදගත් සිදුවීම් .................... 06
සභාපතිතුමන්ගේ සමාලෝචනය .................... 11
අධ්‍යක්ෂ මණ්ඩලය .................... 16
ජ්‍යෙෂ්ඨ කලමනාකාරීත්වය .................... 17
කලමනාකරණ විමර්ශණය .................... 18

- භාණ්ඩාගාරයට වැඩිම ලාභාංශ ලබාදීම .................... 18
- ඉහල පොල් ඵලදාවක් .................... 18
- නියඟ හානි .................... 20
- අවම වර්ෂාපතනය හා වැසි වැටුණු දින .................... 21
- විවිධ කෘෂි දේශගුණික කලාප වල පිහිටි හවැස පොල්වතු .................... 24
- විද්‍යානුකූල ප්‍රතිපත්ති - වැවිලි කලමනාකරණය හා සංවර්ධනය .................... 24
- පොහොර ප්‍රතිපත්ති .................... 25
- වගාකිරීමේ ප්‍රතිපත්ති .................... 27
- පලිබෝධ හා රෝග කලමනාකරණ ප්‍රතිපත්ති .................... 27
- අගය එකතු කිරීමේ කර්මාන්ත හා නවෝත්පාදන ප්‍රතිපත්ති.................... 28
- මානව සම්පත් ප්‍රවර්ධන ප්‍රතිපත්ති .................... 29

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව .................... 30

- සාරාංශගත ඒකාබද්ධ මූල්‍ය දර්ශක .................... 30
- ක්‍රියාකාරකම්, අධ්‍යක්ෂවරු, විගණන කමිටුව හා ව්‍යවස්ථාපිත දීමනා .................... 31
- වත්කම්, ආයෝජන, මූල්‍ය වාර්තා, වාර්ෂික මහා සභා රැස්වීම .................... 31 - 32

මූල්‍ය සමාලෝචනය.................... 33
ආයතනික පාලන ප්‍රකාශය .................... 36
අධ්‍යක්ෂ මණ්ඩල වගකීම පිළිබඳ ප්‍රකාශය.................... 37
මූල්‍ය වාර්තා

- ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව .................... 38
- විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශය .................... 39
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය .................... 40
- ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය .................... 41
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය .................... 42
- ගිනුම්කරණ සටහන් .................... 43 -74

පසුගිය දශකයේ සාරාංශගත ප්‍රතිඵල .................... 75
විසි වැදෑරුම් විද්‍යාත්මක සංවර්ධන උපාය මාර්ග .................... 76 -77
වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැනුම්දීම .................... 78
පෙරකලාසි අයදුම්පත .................... 79

## අපගේ
# දැක්ම

වඩාත් විද්‍යානුකූලව හා ලාභදායීව පාලනය කරනු ලබන
ශ්‍රී ලංකාවේ හොඳම පොල් ආශ්‍රිත වැවිලි සමාගම බවට පත්වීම.



## අපගේ
# මෙහෙවර

පොල් වගාවේ සම්පත් හා වත්කම්
විද්‍යාත්මකව සහ වානිජ්‍යමය ලෙස සංවර්ධනයෙන්
තිරසාරවූ ඉහළ ලාභයක් සමගම විභව ඵලදාවක් සහ ඵලදායීතාවයක් ලැබීමට
කැපවීමෙන් කටයුතු කරන අපේ ප්‍රවීන කාර්ය මන්ඩලය දිරිමත්ව බල ගැන්වීමෙන්
වත්මන් මෙන්ම අනාගත සියලු කොටස් කරුවන්ට වාසි අත්වන අන්දමින්
ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යක් බවට පත්කිරීමේ මහඟු ජාතික ක්‍රියාවලියට දායක වෙමු.

## අපගේ
# වටිනාකම්

| | |
|---|---|
| අපි අගය කරන්නෙමු | අවංකත්වය, කැපවීම, පක්ෂපාතී බව, විනය සහ කලට වේලාවට වැඩකිරීම |
| අපි හඹායන්නෙමු | අවශ්‍යතාවය හා ඉල්ලුම මත, පොල් වගාවට හා මාතෘ භූමියට සේවය කිරීම |
| අපි රැක ගන්නෙමු | නවෝත්පාදන, සුදුසුකම් සපිරි හා කුසලතා පිරිපුන් වෘත්තීයත්වය |
| අපි ලබා ගන්නෙමු | ජයග්‍රහණ දිනා ගැනීම, කාර්ය මණ්ඩලය බලාත්මක හා අභිප්‍රේරණය කිරීම තුළින් |
| අපි සළකන්නෙමු | තර්ජන සහ ගැටළු, අපගේ අභියෝගයන් සහ අවස්ථාවන් ලෙස |
| අපි ගරු කරන්නෙමු | රහසයබවට, නිදහස්බවට, විවෘත බවට හා දැහැමි බවට |
| අපි බලාපොරොත්තුවෙමු | පිළිගැනීම හා ගරුත්වය |
| අපි ශක්තිමත් කරන්නෙමු | මානව සම්පත් දියුණුව සහිත කණ්ඩායම් ක්‍රියාවලිය |

# ආයතනික විස්තර

| | | |
|---|---|---|
| **සමාගමේ නාමය** | : | හලාවත වැවිලි සමාගම |
| **ප්‍රධාන කාර්යාලය** | : | "කප්රුක සෙවන"<br>අංක 165, පුත්තලම පාර, හලාවත, 61000 |
| **කොළඹ කාර්යාලය** | : | බිම් මහල, CDA ගොඩනැගිල්ල,<br>අංක 1, ඩියුක් පාර, කොළඹ 01. |
| **සංස්ථාපනය කළ දිනය** | : | 1992 ජූනි 11 වැනි දින |
| **සමාගම් ලියා පදිංචි අංකය** | : | PB 703 (නව අංකය : 2007 අංක 07 දරන නව සමාගම් පනත)<br>N(PBS/CGB) 122 (පැරණි අංකය: 1982 අංක 17 සමාගම් පනත) |
| **නෛතික තත්ත්වය** | : | 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ, 1992 ජූනි 18 දින ගැසට් අංක 719/15 මගින් ස්ථාපනය කරන ලද පූර්ණ රජයට අයිති සමාගමකි.<br><br>ජනතා වතු සංවර්ධන මණ්ඩලය JEDB (IV) ට අයත්ව තිබූ, පුත්තලම දිස්ත්‍රික්කයේ සියලුම වැවිලි වත්කම්, ගැසට් පත්‍රයට අනුකූලව, හලාවත වැවිලි සමාගම වෙත පවරන ලද අතර, පසුව වසර 53 දක්වා බදු ගිවිසුම්, ජනවසම විසින් හලාවත වැවිලි සමාගම සමග අත්සන් කරන ලදි. |
| **කොටස් හිමිකම්** | : | සමාගමේ සියලු කොටස්වල අයිතිය (100%) එහි ස්වර්ණමය කොටස් සමග හිමිකරුවන ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ මහා භාණ්ඩාගාර ලේකම් විසින් උසුලනු ලබයි. |
| **කොටස් ප්‍රාග්ධනය** | : | විශේෂ වරප්‍රසාද යටතේ ස්වර්ණමය කොටසද ඇතුලත්ව රුපියල් දහයේ (රුː 10/-) කොටස් 20,000,001 ක් මහා භාණ්ඩාගාරය සතුය. |

**අධ්‍යක්ෂක මණ්ඩලය - 2013 පෙබරවාරි 01 දිනට** :

| | |
|---|---|
| ආචාර්ය සුනිල් ජයසේකර මහතා | සභාපති/ප්‍රධාන විධායක නිළධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඒ එම් චන්ද්‍රපාල මහතා | විධායක අධ්‍යක්ෂක සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| කේ ඒ ශාන්ත ආර් ඩයස් මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂක සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ප්‍රියංගනී ලියනගේ මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ භාණ්ඩාගාර නියෝජිත |
| එස් චන්ද්‍රා එස් ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඩී ඒ ඩී රුවන් ධනන්සූරිය මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| එම් එස් එම් සකුල්ලා මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| අයි එම් ආර් විදානගමගේ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

| | | |
|---|---|---|
| **බාහිර විගණකවරුන්** | : | අයියර් සහ සමාගම<br>වරලත් ගණකාධිකාරීවරුන්,<br>චාටර් නිවස<br>අංක 65/2, සර් සිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. |
| **බැංකුකරුවන්** | : | ලංකා බැංකුව සහ මහජන බැංකුව |
| **සමාගම් ලේකම්වරුන්** | : | කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් පුද්ගලික සමාගම<br>අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07 |

# ඓතිහාසික වර්ධන අවස්ථා - පොල්වගාව හා සමාගම

**පොල්** (*Cocos nucefra L., Arecaceae – Palmae*) **:** දකුණු ආසියාවේ හෝ මධ්‍යම ඇමරිකාවේ උපත.

**ශ්‍රී ලංකාව :** රාවනා රජු, කුවෙනි සමඟ තැඹිලි පානය කර ඇත. දුටුගැමුණු රජු (ක්‍රි.පූ. 161-137) පොල් රා, මහාවංශයට අනුව අග්බෝ රජු II (ක්‍රි.පූ. 589) පොල් වැලිගම සිට දෙවුන්දර දක්වා වගා කර ඇත.

**1658 ලන්දේසි ඇල :** කොප්පරා අපනයන : (හලාවත පුත්තලම කොළඹ ප්‍රවාහනය) : පොල් ප්‍රධානම තෙල් ප්‍රභවය

**1898 පලුගස්වැව වත්ත :** (අක්කර 1,800 විශාලතම තනි වතු ඒකකය): පොල් වගා කිරීම.

**1974 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම (ඉප්‍රකො) :** විශාල වගාවන් (අක්.50) ජනතා සන්තක කර ඉප්‍රකොඩ වෙත පවරන ලදී. (1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත)

**1976 ජනවසම (ජනතා වතු සංවර්ධන මණ්ඩලය) :** හා ශ්‍රීලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත සියලුම වගාවන් නැවත පවරන ලදී. (1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත, ගැසට් පත්‍රය අංක 199/IM 1976 පෙබ 06 වන දින).
ජනවසම IV (හලාවත පුත්තලම පොල් වතු). ජනවසම V (කුරුණෑගල කොළඹ වතු)

**1992 ජූනි 11 දින හලාවත වැවිලි සමාගම (හවැස) :** පිහිටුවීම 1982 සමාගම් පනත අනුව N(PBS/CGB) 122).
(1987 අංක 23 දරන රාජ්‍ය සංසංථා හෝ රජයට අයත් ව්‍යාපාරික ආයතන රාජ්‍ය සමාගම් බවට පත්කිරීමේ පනත) හවැස:
පුත්තලම හලාවත පොල් වතු (අක්කර 14,706). කුවැස කුරුණෑගල (අක්. 13,476).
ජනවසම (හලාවත පුත්තලම) පොල් වතු නැවත හලාවත වැවිලි සමාගමට දිගු බද්දට පවරන ලදී.

**1992 ජූනි 11 :** හලාවත වැවිලි සමාගම (හවැස CPL) කළමනාකාරිත්වය පුද්ගලීකරණයට ලක් කිරීම :
කළමනාකරණ නියෝජිත : වයඹ වැවිලි පුද්ගලික සමාගම : (Wayamba Plantations Pvt Ltd: WPPL)
පුද්ගලික කළමනාකරණ නියෝජිත ගාස්තුව ලාභ කොටස් පදනමේ ප්‍රතිශතය මත පදනම් වේ.

| | | |
|---|---|---|
| WPPL :1992 ජූනි 18 – 2008 මැයි 31) | සභාපති - WPPL | : බර්ටි සිල්වා මයා |
| | කළමනාකරණ අධ්‍යක්ෂ - WPPL & CPL | : ඩබ්. එල්. බොස්ට්‍රා |

**2008 මැයි 31 :** WPPL පුද්ගලික කළමනාකරණ ගිවිසුම අහෝසි කරන ලදී. (කළමනාකරණ ගිවිසුම කලින් අවසන් කිරීම නිසා හවැස ඉතුරුම් මුදල් වලින් රු. මිලි. 124 ක වන්දියක් වවැපුස වෙත ගෙවන ලදී.)

**2008 මැයි 31 :** රාජ්‍ය කළමනාකාරිත්වය : හවැස ක්‍රමෝපායික රාජ්‍ය ආයතනයක් (SSOE) ලෙස පාලනය.

**සභාපතිවරු : ජනවසම (ජනතා වතු සංවර්ධන මණ්ඩලය – මධ්‍යම අධ්‍යක්ෂක මණ්ඩලය : 1976)**

| | | |
|---|---|---|
| **1976 සිට 1977** | කේ. එච්. ජේ. විජේදාස මයා | සභාපති - ජනවසම |
| **1978 සිට 1988** | පී. ආර්. සෙනෙවිරත්න මයා | සභාපති - ජනවසම |
| **1988 සිට 1993** | එම්. ඒ. එල්. පෙරේරා මයා | සභාපති - ජනවසම |

**සභාපතිවරු : ජනවසම අධ්‍යක්ෂක මණ්ඩලය IV (හලාවත : 1977)**

| | | |
|---|---|---|
| **1977 සිට 1983** | ඊ. අමරසිංහ මයා | සභාපති - ජනවසම මණ්ඩලය IV (හලාවත) සහ V (කුරුණෑගල) |
| **1983 සිට 1990** | ලක්ෂ්මන් රත්නවීර මයා | සභාපති - ජනවසම මණ්ඩල IV සහ V |
| **1990 සිට 1992** | ෆෙරෝස් දි අල්විස් මයා | සභාපති - ජනවසම මණ්ඩල IV (හලාවත) |
| **1992 ජූනි 11** | 1982 සමාගම් පනත යටතේ හලාවත වැවිලි සමාගම පිහිටුවන ලදී. එන් (PBS/CGB)122 | |

**සභාපතිවරු : හලාවත වැවිලි සමාගම (හවැස : 1992 ජූනි 11 පිහිටුවන ලදී.)**

**1992 ජූනි 11 සිට 2008 මැයි 31 :** වයඹ පුද්ගලික වැවිලි සමාගම මගින් පුද්ගලික කළමනාකාරිත්වය

**2008 මැයි 31 සිට :** සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සමග නැවත රජයේ කළමනාකාරිත්වයට

| | | |
|---|---|---|
| **1992 සිට 1997** | ආර්. එස්. ජයරත්න මයා | සභාපති - හවැස සහ ලේකම් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය MPI |
| **1997 සිට 1998** | ඩික්සන් නිලවීර මයා | සභාපති - හවැස සහ අමාත්‍යාංශ ලේකම් MPI |
| **1998 සිට 2000** | එම්. එෆ්. මොහාදීන් මයා | සභාපති - හවැස සහ ජනාධිපති ලේකම් කාර්යාලය |
| **2000 සිට 2003** | කේ. ඒ. එස්. ගුණසේකර මයා | සභාපති - හවැස සහ අමාත්‍යාංශ ලේකම් MPI |
| **2003 සිට 2004** | වයි. ජී. විජේරත්න මයා | සභාපති - හවැස සහ අමාත්‍යාංශ අතිරේක ලේකම් MPI |
| **2004 සිට 2006** | එස්. අබේවික්‍රම මයා | සභාපති - හවැස සහ අමාත්‍යාංශ ලේකම් MPI |

**1992 ජූනි 23 සිට 2008 මැයි 31 :** පී. ජයසිංහ මයා සභාපති - හවැස

**2008 මැයි 31 සිට 2010 මැයි 17 :** පී. ජයසිංහ මයා සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි - හවැස
**2010 මැයි 18 සිට** ආචාර්ය සුනිල් ජයසේකර සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි - හවැස

# මූල්‍ය සාරාංශය

| | 2012 රු. '000 | 2011 රු. '000 | වෙනස % |
|---|---|---|---|
| **සාරාංශ ප්‍රතිඵල** | | | |
| පොල් නිෂ්පාදනය (ගෙඩි) | 15,807,770 | 14,527,770 | 9 |
| ශුද්ධ අලෙවි සාමාන්‍ය (ගෙඩියකට රුපියල්) | 21.26 | 25.33 | (16) |
| ආදායම | 339,051 | 322,909 | 5 |
| දළ ලාභය | 123,733 | 163,228 | (24) |
| පොලිය සහ බදු පෙර ලාභය | 111,209 | 118,969 | (7) |
| බදු පෙර ලාභය | 86,225 | 95,771 | (10) |
| බදු පසු ලාභය | 77,975 | 77,670 | 0 |
| රඳවාගත් ලාභය | 587,623 | 584,648 | 1 |
| ගෙවූ ලාභාංශ | 75,000 | 75,000 | 0 |
| මුළු ලාභාංශ (1992 සිට 2012) | 341,650 | | |
| **මූල්‍ය තත්ත්වය** | | | |
| ජංගම නොවන වත්කම් | 602,610 | 560,326 | 8 |
| මේරූ/නොමේරූ වගා | 410,033 | 354,712 | 16 |
| ජංගම වත්කම් | 454,231 | 519,019 | (12) |
| තොග | 82,606 | 94,295 | (12) |
| මුළු වත්කම් | 1,056,841 | 1,079,345 | (19) |
| ජංගම වගකීම් | 60,149 | 90,605 | (34) |
| දීර්ඝ කාලීන වගකීම් | 209,070 | 204,092 | 2 |
| කොටස් ප්‍රාග්ධනය | 200,000 | 200,000 | - |
| කොටස්කරුවන්ගේ අරමුදල් | 787,623 | 784,648 | - |
| **මූල්‍ය දර්ශක** | | | |
| ජංගම අනුපාතය (වාර) | 7.55 | 5.77 | 31 |
| ක්ෂණික අනුපාතය (වාර) | 6.18 | 4.69 | 32 |
| දළ ලාභ අනුපාතය % | 36.49 | 44.71 | (18) |
| කොටසක ඉපයීම් රු. | 3.90 | 3.88 | 0 |
| ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) - % | 9.92 | 9.86 | 1 |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE) - % | 11.16 | 11.97 | (7) |
| ජංගම වත්කම් වලට ජංගම වගකීම | 0.06 | 0.08 | (32) |
| පොලී ආවරණ (වාර) | 4.45 | 5.13 | (13) |

# විශේෂිත අංක - හලාවත වැවිලි සමාගම

| | |
|---|---|
| 1,524 | අක්කර 1,524 ක්වූ පලුගස්වැව වත්ත (හලාවත රාජකදලුව) ලෝකයේ විශාලතම තනි පොල් වත්ත වේ. 1898 දී බවර් සමාගම විසින් වවන ලද මෙම පොල් වත්ත ජානමය වශයෙන් ඉතා ඉහළ පොල් ගස් වලින් සමන්විතය. |
| 341,650,000 | රු.341,650,000 වැඩිම ලාභාංශයක් භාණ්ඩාගාරයට ගෙවූ එකම වැවිලි සමාගම ලෙස ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් අභිබවමින් ප්‍රසාදයට ලක්ව ඇත. |
| 51 | එක් ගසකට ගෙඩි 51 ක්වූ වැඩිම පොල් ඵලදායිතාව 2012 වර්ෂයේ පැවති දැඩි නියගය තුළද ලබා ගනිමින් වැවිලි සමාගම් අතරින් ප්‍රමුඛ ස්ථානය ගනු ලැබුයේ හලාවත වැවිලි සමාගම යි. |
| 253,932,800 | රු. 253,932,800 ක්වූ වැඩිම ඉඩම් බදු කුලිය 1992 සිට ප්‍රාදේශීය වැවිලි සමාගම් පිහිටුවීමෙන් පසු භාණ්ඩාගාරයට ගෙවා ඇත්තේද හලාවත වැවිලි සමාගම යි. |
| 308,878,915 | රු. 308,878,915 ක්වූ ඉහළ ආදායම් බදු වියදමක් දරා හලාවත වැවිලි සමාගම වගකීම් ඉටුකර ඇත. |
| 23,881,866 | රු. 23,881,866 හිඟයකින් තොරව 2012 වසරේදී සේවා නියුක්තිකයින්ගේ ව්‍යවස්ථාපිත ගෙවීම් වන අර්ථ සාධක, සේවා භාරකාර සහ පාරිතෝෂිත මුදල් වශයෙන් ගෙවමින් වැවිලි සමාගමක් වශයෙන් සිය වගකීම් හලාවත වැවිලි සමාගම විසින් ඉටුකර ඇත. |
| 50,970 | නව වගා, යටි වගා සහ පොල් පැල පාළු සිටුවීම යනාදී ස්වරූපයෙන් පොල් පැල 50,970 සමාගමේ වතුවල 2012 වසරේ දී සිටුවීම. |
| 1,106,750 | ගුණාත්මක බීජ පොල් 1,106,750 ක් පොල් වගා කිරීමේ මණ්ඩලයට 2012 දී ලබා දෙමින්, අමාත්‍යංශය විසින් මෙහෙයවූ පොල් සංවර්ධන වැඩසටහනට, හලාවත වැවිලි සමාගම ප්‍රධාන ලෙසට දායක වීම. |
| 491,086 | ගුණාත්මක පොල් පැල 491,086 ක් පොල් වගා කිරීමේ මණ්ඩලයට 2012 වසරේදී, හලාවත වැවිලි සමාගම විසින් සපයන ලදී. |
| 38,140 | පොල් ගස් 38,140 ක් 2012 වසරේ ඇතිවූ දරුණු නියගය නිසා විනාශ වුවද (1986 පසු ඇතිවූ දරුණුම නියගය) 2012 වසරේදී ගෙඩි මිලියන 15,807 වූ ඉහල පලදාවක් ලබා ගැනීමට හේතු පාදක වූයේ විද්‍යානුකූල පොහොර යෙදවීම්, වැටුනු ගෙඩි ඇහිලීම සහ කාර්යක්ෂම ක්ෂේත්‍ර කළමනාකරණ ක්‍රියා මාර්ගයි. |
| 2011.04.29 | 2011.04.29 දින ලොව පළමු ඇසරියා මයිටා පාලනය කරන විලෝපිතයන් අභිජනනය සහ මුදා හැරීමේ රසායනාගාරය, සමාගමේ හලාවත පලුගස්වැව වතුයායේ පිහිටුවා, පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාත්මක ආධාර ඇතිව, පොල් වගාවට හානි කරන ඇසරියා ගුරෙරෝනිස් මයිටාවන් ආහාරයට ගන්නා නියෝසෙලස් බරාකි විලෝපිතයන් අභිජනනය කර මුදා හැරීම පටන් ගැනීම. |
| 2012.02.23 | 2012 පෙබරවාරි 23 දින සමාගමේ බිංගිරිය, කිනියාම වතුයායේ 'කප්රුවන' (SanRamonx Dwarf Green) වැඩි ඵලදායී සහ නියගයට ඔරොත්තු දෙන පළමු බීජ තවාන, ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස, පොල් පර්යේෂණ ආයතනය සමග පිහිටුවන ලදී. |

# 2012 වසරේ වැදගත් සිදුවීම්

හලාවත වැවිලි සමාගම 2012 වසර ආරම්භ වූයේ නව සංවර්ධනය පිළිබඳ නොයෙකුත් ඇපේක්ෂා සහ අලුත් බලාපොරොත්තු ඇතිවයි. කෘෂිකර්මයට අදාළ කාර්යක්‍ෂමතාව, ඵලදායිතාව හා ලාභදායි ව්‍යවසායක් වශයෙන් හලාවත වැවිලි සමාගම ප්‍රසිද්ධියක් ඉසිලී ය. සමාගමේ, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සහ සමස්ත කළමනාකරණයේ අරමුණ වන්නේ තරගකරුවන් අතරින් වඩාත් ප්‍රතිලාභ ලබන සමාගමක් ලෙස ඔසවා තබමින් රටෙහි සමෘද්ධිය වර්ධනය කිරීමයි.

සමාගම් පනතට අනුව හලාවත වැවිලි සමාගම වාණිජ ව්‍යවසායක් වුවද එහි පූර්ණ අයිතිය රජය සතුව ඇති හෙයින් රජයේ සංවර්ධන වැඩසටහන් සහ ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියා කළ යුතුවේ.

ජනතා වතු සංවර්ධනය සම්බන්ධව හා පොල් ක්ෂේත්‍රයට අදාළව නව අමාත්‍යංශයක් පිහිටුවීමෙන් පසුව (හලාවත වැවිලි සමාගම එක් ආයතනයකි.) ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමා 'කප්රුක නවෝදය (2011 - 2016)' ජාතික පොල් සංවර්ධනය නමින් පොල් කර්මාන්තයේ සීඝ්‍ර වර්ධනයට හා ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට අරමුණු 8 ක් මුල් කර ගත් වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී.

එම ජාතික වැඩ පිළිවෙලේ පහත සඳහන් අරමුණු හලාවත වැවිලි සමාගම මෙහෙවර හා සෘජු සම්බන්ධතාවක් ඇත.

1, 2016 වසර අවසන් වන විට පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3650 ක් දක්වා වැඩි කිරීම.
2. එකී අරමුණ ඉෂ්ට කිරීම සඳහා අදාළ ගස් ප්‍රමාණයද වැඩි කිරීම.
3. විවිධාංගිකරණය මගින් ඵලදායිතාව සහ ආදායම වැඩි කර ගැනීම.
4. පරිසර හිතකාමී සහ ආර්ථික වශයෙන් වාසිදායි පොල් හා සම්බන්ධ කර්මාන්ත ආරම්භ කිරීම.
5. පොල් හා සම්බන්ධ භාණ්ඩ වල ගුණදායිකත්වය සහා අලෙවිකරණ හැකියාව වර්ධනය කර ගෝලීය වෙළඳපොලේ තරගකාරී මිලකට ගෙන එමින් විදේශ විනිමය උපයා ගැනීම.
6. තාක්‍ෂනය යාවත්කාලීන කිරීමෙන් පොල් කර්මාන්තයේ වෙනස්වන අවශ්‍යතාවයන් සපුරා ගැනීම.

එබැවින්, එකී ජාතික අරමුණු සපුරා ගැනීම උදෙසා 2012 වර්ෂයේ හලාවත වැවිලි සමාගම එම වැඩ පිළිවෙලේ සමීප පාර්ශවයක් ලෙස, විශේෂ අවධානය යොමු කරන ලදී. එසේම හලාවත වැවිලි සමාගම සංවර්ධන වැඩසටහන්ද වර්ෂය තුළ එම අරමුණු ළඟා කර ගැනීම පිණිස සකසන ලදී.

විවිධ පාලානාධිකාරීන් යටතේ ශත වර්ෂ ගණනාවක්ම පාලනය වුවද, තම නිෂ්පාදනයන් කර්මාන්තයට අමු ද්‍රව්‍ය සපයන්නෙක්ගෙන් එහා ගෙන යාමට සමාගම උත්සාහ කර නොතිබුනි. එනමුත් වර්තමාන පාලනාධිකාරිය, 2012 වර්ෂයේදී, හැකි සෑම අවස්ථාවකදීම, අගය එකතු කළ හා වඩාත් ලාභදායි නව නිපැයුම්, සමාගමේ න්‍යාය පත්‍රයට එක් කර ගන්නා ලදී. ඒ හා සමගම ඉලක්ක අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය විද්‍යාත්මක හා තාක්‍ෂනික යෙදවුම්ද වැවිලි කළමනාකරණය පිණිස යොදවන ලදී. ඒ සඳහා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්‍ෂනය කිරීම හා ඇගැයීම් යන ක්‍රමවේද භාවිතා කරමින් නව පද්ධති, ක්‍රමවේදයන් හා නවීන කළමනාකරණ මෙවලම් ද හලාවත වැවිලි සමාගම කළමනාකරණය පිණිස යොදා ගනිමින් සමස්ථ වැවිලි පරිපාලන යාන්ත්‍රයම ප්‍රතිව්‍යුහගත කිරීමත්, අලෙවිකරණ අවස්ථාවන් සොයමින් මැදිහත්වීමත් සිදු කරනු ලැබී ය.

ඉහත කී අපේක්ෂාවන් ඉටු කර ගැනීම පිණිස පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී

### 1. පරිපාලනය ප්‍රතිව්‍යුහගත කිරීම

- අලෙවි අංශය වැඩි දියුණුවට 'අලෙවි සංවර්ධන අංශය' ලෙස අලෙවි ප්‍රවර්ධනයද ඇතුළත් කිරීම.
- සැලසුම් සහ අධීක්‍ෂණ අංශයක් එක් කරනු ලැබීම.
- 'සංවර්ධන විගණන සංකල්පය' මූලික කරගනිමින් අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම.
- නෛතික සහ අධීක්‍ෂනය අංශයක් පිහිටුවීමෙන් වතු අධිකාරිවරුන් /වතු නිලධාරීන් කෘෂි නොවන සහ බාහිර සම්බන්ධතාවයන්ගෙන් මුදවාගෙන ඔවුන්ගේ මුලු කාලයම තම රාජකාරියට යෙදවීමට අවස්ථාව සලසා දීම. මෙමගින් කාර්යක්‍ෂමතාව ඉහළ යන අතර විනය පවත්වාගෙන යමින් සමාග මේ යහ පාලනයක් ඇති කෙරෙනු ඇත.

# 2012 වසරේ වැදගත් සිදුවීම්...

## 2. පොල් පොල

පොල් සංවර්ධන අධිකාරය මගින් පවත්වන පොල් වෙන්දේසියේ නිෂ්පාදන අලෙවි කිරීමේදී ඉහල සාධාරන මිලක් සහ මුදල් ලබාගැනීම ප්‍රමාදවීම ආදිය වේ. මෙම තත්ත්වය යටතේ පොල් ගෙඩි සහ කොප්පරා ඉවත් කිරීමට ක්‍රමයක් නොමැතිව එම තොග වතු වල එකතු වීමට හේතු විය. මෙය සමාගමේ මුදල් සංසරණයට බාධාවක් වූ හෙයින් එම ප්‍රශ්නයට පිළියමක් වශයෙන් හලාවත ප්‍රධාන කාර්යාලයේදී පොල් පොල පිහිටුවන ලද්දේ විනිවිද විවෘත තරඟකාරී ලෙස මිල කවරවල බහා සියලු අයදුම්කරුවන් ඉදිරියේ විවෘත කේවල් ක්‍රමයක් යටතේ ය.

කොළඹ පොල් වෙන්දේසියට පිවිසීමට නොහැකි සුළු හා මධ්‍යම ප්‍රමාණයේ ප්‍රාදේශීය ගැණුම්කරුවන්ටද හලාවත පොල් පොල අවස්ථාව සලසා දේ. ගැණුම්කරුවන් 34 දෙනෙක් සම්බන්ධවූ එම පළමුවෙනි වෙන්දේසිය 2012 පෙබරවාරි 20 දින පැවැත්වීය. ප්‍රථම දින පිරිවැටුම රුපියල් මිලියන 6 ඉක්මවූ අතර පොල් වෙන්දේසියේදී මුදල් ලබා ගැනීමට සාමාන්‍යයෙන් ගතවන දින 45 ක් වෙනුවට දින 7 ක් තුළ මුළු ආදායම එකතු කර ගැනීමට හැකි විය. ඊට අමතරව, එම පොල් විකිණීම පොල් සංවර්ධන අධිකාරීයේ වෙන්දේසිය මගින් සිදු කළා නම් අධිකාරියට ගෙවිය යුතු වූ රුපියල් 75,000 ක කොමිස් මුදලද සමාගම ට ඉතිරි කර ගැනීමට සමත් විය.

2012 වසර අවසානයේදී හලාවත පොල් පොලේදී ගෙඩි මිලියන 4 අලෙවි කිරීමටත් රුපියල් මිලියන 75.8 ක පිරිවැටුමක් උපයමින් පොල් වෙන්දේසියට ගෙවිය යුතු වූ රුපියල් මිලියන 1.3 ක්ද ඉතිරි කිරීමට සමත් විය.

## 3. ක්‍රියාකාරි සැලැස්මක් සහ කෘෂිකාර්මික ක්‍රියාකාරි දිනදර්ශනයක් හඳුන්වා දීම

ඒකාබද්ධ සැලසුමේ ඉලක්ක සපුරා ගැනීම් වස් එක් එක් වතුයායට ක්‍රියාකාරී සැලැස්මක් සමග කෘෂිකාර්මික ක්‍රියාකාරි දිනදර්ශනයක් හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලදී. සෑම ක්‍රියාකාරිත්වයක් සමඟ දිනයන්ද වගකීම ක්‍රියාත්මක කිරීමේ සෑම මට්ටම් වල අයට, එනම් මුරකරු සිට ඉහළට, පැහැදිලි සීමාවන් සහ වගකීම් බෙදා බාර දෙන ලදී. මීට අමතරව, වර්ෂය තුළ සියලුම සේවා නියුක්තිකයකුෙම පරිපාලන සහායක සිට නියෝජ්‍ය සාමන්‍යාධිකාරි දක්වා ප්‍රගති ඇගයීමක් සිදු කෙරුණි. වසර 2012 අවසන් වන විට සමාගමේ නිලධාරීන්ගේ ප්‍රගති ඇගයීම අවසන් කරන ලදී. සම්පූර්ණ කරන ලද එම ඇගයීමෙන් අනාවරණයවී ඇත්තේ සමාගමේ උන්නතිය සඳහා අවශ්‍ය ප්‍රමාණයට ඔවුන්ගේ කාර්යක්ෂමතාව සහ ධාරිතාව වර්ධනය කිරීමට නම් පුහුණුව සහ සුපරීක්ෂණය වර්ධනය කළයුතු බවයි.

## 4. අමු ද්‍රව්‍ය මගින් අගය එකතු කළ නිම භාණ්ඩ නිෂ්පාදනය

- පලුගස්වැව වතුයායේ පොල් තෙල් මෝලක් ඉදිකිරීම
  රුපියල් මිලියන 6 ක වටිනාකමක් ඇති පැයට කිලෝ 200 ක කොප්පරා බහාලීමේ ධාරිතාවක් ඇති තෙල් නිස්සාරණ යන්ත්‍රය ඉන්දියාවෙන් ආනයන කර පිහිටුවන ලදී. දැන් එය ගුණාත්මක පිරිසිදු තෙල් නිෂ්පාදනයට සූදානම් ය.

- පුත්තලමේ තම්බපණ්ණි වතුයායේ කජු පිරිසැකසුම් කිරීමේ ඒකකයක් පිහිටුවීම
  හෙක්ටෙයාර් 812 ක වගා කර ඇති එල දරණ කජු ගස් 39,417 න් 2012 වර්ෂයේදී මෑත අතීතයේ ඉහලම අස්වැන්නක් වන කජු මෙට්‍රික් ටොන් 68 ක් ලබා ගැනීමට සමත් විය. එල දරන කජු ගස් 35,660ක් හෙක්ටෙයාර් 726.55 ක වගා කර ඇත්තේ තම්බපණ්ණි වතුයායේ ය. විකල්පයක් නොමැති හෙයින් මෙතෙක් කල් සමාගමේ කජු නිෂ්පාදනය පවතින මිල ගණන් වලට අලෙවි කරන ලද්දේ අමුද්‍රව්‍යක් වශයෙන් රසකැවිලි නිෂ්පාදකයින්ටයි. වෙළඳපොළේ කජු මිල ඉතා පහත තත්ත්වයක පැවතීම හේතුකොට ගෙන ඉන් වැඩි ප්‍රතිලාභයක් සමාගමට නොලැබුනි. ඊට පිළියමක් වශයෙන් මෙම තත්වයෙන් ගොඩ ඒම සඳහා සහ අලෙවි අවස්ථා වර්ධනය කර ගනු පිණිස 2012 වර්ෂයේදී අගය එකතු කළ කජු නිපැයුම් නිෂ්පාදනය ආරම්භ කරන ලදී.
  කජු ලෙලි ගැසීම, රෝස්ට් කිරිම සහ ඇසිරීමට අවශ්‍ය යන්ත්‍ර දැනටමත් සවිකරමින් පවතින අතර ලබන වසරේ අස්වැන්නත් සමග සේවා පහසුකම් ද වැඩි කරමින් අමතර වැඩි ආදායමක් සමාග මට ලබා ගැනීමට එම ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත.

# 2012 වසරේ වැදගත් සිදුවීම්...

- කජු පුහුලම් වලින් පර්යේෂණාත්මකව මිහිරි වයින් නිෂ්පාදනය

සාමාන්‍යයෙන් කජු පුහුලමත් සමග ඇතිවන නමුත් පළතුරක් ලෙස හෝ පානයක් ලෙස සමහරුන් භාවිතා කළද වැඩි වශයෙන් පුහුලම් කිසියම් ආර්ථික වාසියක් නොගෙනම ගස් යට වැටී අපතේ යන්නේ ඉක්මණින් නරකවන සුලු සහ ඒවායේ නීරස හේතුකොට ගෙනයි.

නමුත් බ්‍රසීලයේ, තායිලන්තයේ සහ ඉන්දියාවේ කජු පුහුලම් යොදා ගනිමින් මධ්‍යසාරය ඇතිව හෝ නැතිව මිහිරි වයින් වර්ග සාදනු ලබන අතර එහි ඇති සෞඛ්‍යමය ගුණාංග විදේශිකයින් ආකර්ෂනය කිරීමටද සමත් වී ඇත.

හලාවත වැවිලි සමාගම 2012 වර්ෂයේදී තම්බපණ්ණි වතුයායේ කජු පුහුලම් කිලෝ ග්‍රෑම් 50 ක් යොදා පැරණි පාරම්පරික වට්ටෝරුවකට අනුව මිහිරි වයින් සෑදීමට පර්යේෂණාත්මක උත්සාහයක් දැරීය. මෙම අත්හදා බැලීමේ ක්‍රියාවලියේදී සමාගමේ වයින් පර්යේෂකයින් කජු පුහුලමේ නීරස කොටස ඉවත් කිරීමටත් එහි ඇති මූලික සුවඳ හා රසය තබා ගැනීමටත් සමත් වීම ජයග්‍රහණයකි.

පෙරීම සහ ගුණාත්මකභාවයේ අඩුවීමක් නොමැතිව කල් තබා ගැනීමේ ප්‍රශ්න කිහිපයක් සම්බන්ධව පොල් පර්යේෂණ මධ්‍යස්ථානයේ තාක්ෂණික සහයෝගය ඇතිව තවදුරටත් පර්යේෂණ කරමින් පවතී. මෙම පර්යේෂණය සාර්ථක වුවහොත් විදේශිකයින්ගේ වෙළඳ පොල ආකර්ෂනය කර ගැනීමටත්, සේවා පහසුකම් වැඩි කිරීමටත් සමාගමට ආදායම් වැඩි කර ගැනීමටත් හැකි වනු ඇත.

**5. වතුයාය වල අවශ්‍යතාවයන්ට සරිලන සේ පලුගස්වැව යාන්ත්‍රික වැඩපළ පුනර්වර්තනය කිරීම**

වතුයායවල යාන්ත්‍රික අවශ්‍යතා සැපයූ පලුගස්වැව ප්‍රදේශ යාන්ත්‍රික වැඩපල ඌන උපයෝජනයට භාජනය වී තිබුණි. තාක්ෂණික සුපරීක්ෂකවරයෙකු බාරයේ පැවති මෙම වැඩපල මගින් වතුපිටි, වාහන සහ කෘෂි උපකරණ අලුත්වැඩියා කිරීම සිදු කළ අතර යන්ත්‍ර, වතුර බවුසර්, ට්‍රැක්ටර් ආදියද අලුත් වැඩියා කිරීම අවම වියදමකින් සිදු කිරීමෙන් සමාගමට වාසි අත් විය. මීට අමතරව, දැනට ඉදිවෙමින් පවතින පොල් තෙල් යන්ත්‍රාගාරයේ වැඩ කටයුතු වලට උපකාරී වෙයි.

**6. කොළඹ ප්‍රධාන කාර්යාලය ඩියුක් පාරේ CDA ගොඩනැගිල්ලට මාරු කිරීම**

හලාවත වැවිලි සමාගමේ කෙළඹ නාගරික කාර්යාලය පිහිටා තිබුණේ ජනවසමට අයත් ටී,බී,ජයා මාවත, මරදාන පාරේ පිහිටි ගොඩනැගිල්ලක රුපියල් මිලියන 1.2 ක මාසික කුලියකටය. එම නාගරික කාර්යාලයේ අධික මාසික කුලිය සමාගමට බරක් විය. 2012/04/05 දී හලාවත වැවිලි සමාගම ගරු අමාත්‍යතුමාගේ කාලෝචිත මැදිහත්වීම යටතේ සිය නාගරික කාර්යාලය පොල් සංවර්ධන අධිකාරී ගොඩනැගිල්ලට මාරු කරමින් රු. 360,000/ මාසික කුලියට ගත් අතර එමගින් රු: 800,000 ක මාසික ඉතිරියක් ද ලබා දෙන ලදී.

**7. පහසු කළමනාකරණය සහ වැඩි ආර්ථික ප්‍රතිලාභ සඳහා පොකුරු වතුයාය ලෙස ඒකාබද්ධ කිරීම**

අඩු ලාභ ලබමින් භූගෝලියව එකිනෙකට ළංව පිහිටි හලාවත වැවිලි සමාගමේ වතුයාය පොකුරු වතු ලෙස ඒකාබද්ධ කිරීමත් එමගින් පිරිවැය පහත දමා සංවර්ධනට උපරිම අවධානය යෙදීමටත්, සමස්ත කළමනාකරණයම වගකිව යුතු එක් පොකුරු කළමනාකරුවෙකු (අධිකාරී) යටතේ පාලනය කිරීමටත්, යෝජනා විය. විසිර තිබූ අංශ සහ ඒකක ලාභදායි මධ්‍යස්ථාන ලෙස දෙවැනි මට්ටමේ සහකාර අධිකාරී/භාරකාර නිලධාරියෙක් යටතේ පාලනය කරමින් ප්‍රධාන පොකුරු කළමනාකරුට වගකිව යුතු බවටත් යෝජනා විය.

ඒ අනුව කජු ආශ්‍රිත භාණ්ඩ සංවර්ධනයටත් භෝග විවිධාංකරණය කෙරෙහි වැඩි අවධානය යොමු කිරීමත් ප්‍රථමයෙන්ම ආසන්නව පැවති පුත්තලම සහ මංගලඑළිය ප්‍රදේශ වතු ඒකාබද්ධ කරනු ලැබුවේ 2012 ජුනි මාසයේය. මෙම වතුයාය දෙකම වියලි කලාපයේ පිහිටි අතර කජු සහ පොල් ප්‍රධාන භෝග වශයෙනුත් අඩු ලාභ ලබමින් සිටි ඒකක දෙකක් විය. පහත පෙන්වන ආකාරයට සැලකිය යුතු ලාභයක් මෙම වතු ඒකාබද්ධ කිරීමෙන් 2012 වර්ෂයේදී ලැබී ඇත.

# 2012 වසරේ වැදගත් සිදුවීම්...

| 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|
| වතුයාය | මුළු ගෙඩි නිෂ්පාදනය | ලාභය/ අලාභය රු. | වතුයාය | මුළු ගෙඩි නිෂ්පාදනය | ලාභය/ අලාභය රු. |
| පුත්තලම | 815,168 | 1.2 මිලියන | තම්බපණ්ණි | 2.6 මිලියන | 15.0 මිලියන |
| මංගලඑළිය | 779,667 | (2.3මිලියන) | | | |

**8. මානව සම්පත් අභිවර්ධනය**

2010 සිදු කරන ලද SWOT සමාලෝචනයකදී හෙළිදරව් වූ සම්භාව්‍ය දුර්වලතාවක් වන්නේ නිශ්චිත සේවක සංඛ්‍යා පද්ධතියක් නොමැතිවීම සහ මානව සම්පත් අභිවර්ධන පද්ධතියක් නොමැති වීමයි. පුහුණු වෘත්තීමය කාර්ය මණ්ඩලයක් ඕනෑම ආයාතනයක කොඳු නාරටියයි. මෙයට ප්‍රතිකර්මයක් වශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ සහ ජාතික වැවිලි ආයතනයේ (NIPM) සම්පත්ලාභීන් ලවා පුහුණු කිරීම් වලට ප්‍රමුඛතාවක් දෙන ලදී. පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් මධ්‍යම සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩල අයට විෂයට අදාල විදේශ රටවල පුහුණු කිරීමට බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව සිදු කිරීමට ඇති හැකියාවන් පිළිබඳවද සොයා බැලීමක් දැනට සිදු කරමින් පවතී.

සියලුම කළමනාකරණ සහායකයින්ට සහ ඊට අදාල අනෙකුත් සේවානියුක්තයින්ට "වතුයාය ගිණුම්කරණය හා මුල්‍ය පාලනය" සම්බන්ධ ප්‍රථම වැඩසටහන සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සහ අනෙකුත් වතුවල පවත්වන ලදී. එම පුහුණු කිරීම් මාලාවේ දෙවැන්න "ව්‍යාපෘති කළමනාකරණය සහ ඉලක්ක ලබා ගැනීම" 2012 මැයි මස 18 වන දින මධ්‍යම සහ ජ්‍යේෂ්ඨ ශ්‍රේණි සඳහා පවත්වන ලදී.

**9. සමාගමේ සේවක සංඛ්‍යාව සහ සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුමත කර ගැනීම**

සමාගමේ සිදුවන වෙනස්කම් වලට අනුරූපීව දැනට පවත්නා සේවක සංඛ්‍යාව පිළිබඳ සමාලෝචනයක් සිදු කර වේතන හා සේවක සංඛ්‍යා කමිටුවට ඉදිරිපත් කළ යෝජනාවලට සාර්ථක ප්‍රතිඵලයක් නොමැති විය. කෙසේ වුවද, 2012/05/04 දින අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය විසින් ඉදිරිපත් කළ ප්‍රතිව්‍යුහගත පටිපාටියට අදාල සංශෝධිත නව සේවක සංඛ්‍යාව සහ හලාවත වැවිලි සමාගම ට සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට සමත් විය.

ප්‍රමුඛතාවයක් සේ සලකා වසරතුලදී නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරී (වැවිලි) පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය පියවර ගනු ලැබීය.

**10. පොල් වගා කළමනාකරණ පරිගණක ජාලගත මෙහෙයුම් පද්ධතියක්**

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍ය ගරු ජගත් පුෂ්පකුමාර මැතිතුමා විසින් ක්‍රියාත්මක කළ ජාතික පොල් වගා ක්ෂේත්‍ර සංවර්ධන වැඩ පිළිවෙල යටතේ අමාත්‍යතුමා හඳුන්වා දුන්, අමාත්‍යාංශය යටතේ ඇති සියලුම වැවිලි සමාගම්වල දත්ත සෘජු පරිගණක ජාලගත කරමින් සමාගමේ පොල් වගා කළමනාකරණ ජාලගත මෙහෙයුම් පද්ධතියක්ද ක්‍රියාත්මක කරන ලදී. ක්ෂේත්‍රයේ සියලුම වතුවලින් ජාල ගත කරන මූලාශ්‍ර මගින් දත්ත හා අදාල තොරතුරු දිනපතා ලබා ගැනීමට හැකි මෙය එවන් ප්‍රථම ජාල ගත පද්ධතිය යි. සෑම වතුයායකම දිනපතා සේවක පැමිණීම, පොල් අස්වැන්න ආදී තොරතුරු මෙහි දැක්වේ.

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන හලාවත වැවිලි සමාගම මෙම අධීක්ෂණ පද්ධතිය මගින් ලබා දෙන තොරතුරු මගින් පොල් වැවිලි සමාගම් කළමනාකරණය පිළිබඳ සහ සහයෝගය මගින් යාවත්කාලීන වීමට හැකියාව ලබා ගෙන ඇත. මෙම පද්ධතියෙන් එකතු කර ගන්නා දත්ත සහ තොරතුරු යොදා ගනිමින් හලාවත වැවිලි සමාගම තම ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වර්ධනය

# 2012 වසරේ වැදගත් සිදුවීම්...

කිරීමට අවස්ථාව සලසාගෙන ඇත. පද්ධතිය හඳුන්වාදීමෙන් පසු හලාවත වැවිලි සමාගමේ හොරකම් සහ වංචා අවම කර ගැනීමටද එය භාවිතා කර ගෙන ඇත.

### II. ජාතික පොල් වගා වැඩසටහනට හලාවත වැවිලි සමාගමේ දායකත්වය

ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ මෑත අතීතයේ නියඟයෙන් සහ පොල් වගාවට ඇතිවූ රෝග හේතුවෙන් විනාශයට පත් පොල් ගස් වෙනුවට පොල් වගා මණ්ඩලය ක්‍රියාත්මක කරන ජාතික පොල් සිටුවීමේ සහ පුනරුත්ථාපන වැඩ සටහනට හලාවත වැවිලි සමාගම වගකීමක් වශයෙන් දායකවූයේ බීජ පොල් මිලියනයක් සහ පොල් පැල 300,000 ක් ලබා දීමෙනි. 2012 වර්ෂයේදීවූ දරුණු නියඟයෙන් ඵල දරණ පොල් ගස් 38,140 ක් හලාවත වැවිලි සමාගමේ වියළි කලාපයේ පොල් වතු වල විනාශ වී ඇත.

# සභාපතිතුමාගේ සමාලෝචනය

2012 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වසර සඳහා පිළියෙළ කරන ලද හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අප සමාගමේ ඉතිහාසයේ ප්‍රථම වතාවට අනුමත කාලසීමාව තුලදී ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

පසුගිය වසර හා සසැඳීමේදී මෙම වසරේ ලාභය වැඩිවු අතර 2012 වසරේ පැවති දැඩි නියඟයද අභිබවා වැඩි පොල් නිෂ්පාදනයක් ලැබීමටත් අප සමාගමට හැකි විම සතුටකි. සමාගමට අයත් වතුයාය පිහිටා ඇත්තේද පුත්තලම වැනි ශුෂ්ක වියළි කලාපයේ වීම මෙහිදී සැළකිය යුතු වැදගත් කරුණකි.

## කළමනාකරණය සහ අමාත්‍යාංශය

2010 නොවැම්බර් 26 දින අලුතින් පිහිටවූ පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ (MCDJED) පොල් කර්මාන්තයට අදාල ආයතන වන අප හලාවත වැවිලි සමාගම ඇතුළු පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා මණ්ඩලය, පොල් සංවර්ධන මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය සහ කුරුණෑගල වැවිලි සමාගම සමග ශක්තිමත් ප්‍රතිලාභ ලබමින් ක්‍රියාත්මක වුණි.

අප සමාගමද අමාත්‍යාංශයේ මග පෙන්වීම මත අදාල තාක්ෂණික හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල සමගින් 'කප්රුක නවෝදාව' ජාතික පොල් සංවර්ධන සැලසුම 2011 - 2016 ට සමගාමී වන අප සමාගමේ 'උපායශීලී සංස්ථාපිත සැලසුමට (2010/2011 2015) අනුකූලව ක්‍රියා කරන ලදී.

2012 වර්ෂයේදී සියලුම පාර්ලිමේන්තු උපදේශක කමිටු රැස්වීම් වලට සහභාගීවු අතර සමාගම පිළිබඳ කිසිදු ප්‍රශ්නයක් පැන නොනැගිණි.
අනුරාධපුර, ඔයාමඩුවේ පැවති 'දැයට කිරුළ 2012' ප්‍රදර්ශනයට අපගේ සමාගමද අමාත්‍යාංශය සමග සහභාගී වූ අතර එහිදී අප සමාගම එළිදැක්වූ අපගේ වතුයාය වල කාර්යක්ෂම තාක්ෂණ සහ නව මෙවලම් පරිහරණය කැපී පෙනුන අතර පොල් වගාකරුවන්ගේ දැඩි අවධානයට සහ ප්‍රසංශාවටද යොමු විය.

සභාපති වශයෙන් මා,ජ්‍යේෂ්ඨ නිලධාරීන් සමග අමාත්‍යාංශ සමාලෝචන රැස්වීම් වලට සහභාගී වූ අතර එහිදී අප සමාගම විසින් ගන්නා ලද සාධණීය සහ කාර්යක්ෂම කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධව ඇගයීමට හා ප්‍රසාදයටද ලක්වූ බව සිහි කරන්නේ ඉමහත් සතුටිනි.

## පොල් නිෂ්පාදනය

හලාවත වැවිලි සමාගමේ බොහොමයක් වතු පිහිටා ඇත්තේ වියළි ශුෂ්ක කලාපයේවු (DL3 - 32% පමණද, IL3 - 59% පමණ සහ අන්තර් දේශගුණික කලාප IL3 -9%) අතර 2012 වසරේ පැවති දරුණු නියඟ තත්ත්වයන් යටතේ වුවත් 2012 වර්ෂයේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 15.8 ක් වු අතර 2011 දී එළදාව ගෙඩි මිලියන 14.5 ක් විය. 2012 වර්ෂයේ දී මෙලෙස ඉහල ප්‍රතිඵලයන් ලබා ගැනීමට හැකිවූයේ විද්‍යාත්මක කළමනාකාර යෙදවුම් (පොහොර, කොළ රොඩු වැසීම, ශෂ්‍ය විද්‍යා තාක්ෂණය ආදී) සහ වැටුණු පොල් ඇහිලීම ආදී සාධණීය ක්ෂෙත්‍ර කළමනාකරණ සුපරීක්ෂනය හේතුකොට ගෙනයි.

ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලය සමග අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව පවත්වන රැස්වීම් වලදී පොල් නිෂ්පාදනයේ වෙනස්වීම් සහ නියඟයෙන්, උෂ්ණත්වයෙන්, සුළගෙන්, සාපේක්ෂ ආර්ධතාවයෙන්, පරාගනයෙන්, පොහොර යෙදීමෙන්, අකාලයේ පොල් වැටීම සහ නිසරු ගෙඩිහට ගැනීම, නොමේරූ ගෙඩි වැටීම සහ පුහු ගෙඩි සෑදීම, වැටුනු ගෙඩි සොරකම් කිරීම යන කරුණු සහ ඒවායින් ඇතිවන බලපෑම් සම්බන්ධව දීර්ඝ ලෙස විද්‍යාත්මක සමාලෝචනයන් කරන ලදී.

පැල පොල් සහ ලාබාල පැල වියළී මැරීයාමෙන් වළකුණු පිණිස අතිරේක වාරි ක්‍රමද සපයන ලදී. එහෙත් වැඩුණු ගස් වලට ජලය සැපයීම අපහසු වූයේ වියළි කලාපයේ ජලය සැපයීම කෙසේ වුවත් වියළි කලාපයේවු පොල් වතු වල දරුණු නියං සමයේදී බීමට පවා ජලය හිඟ වීම හේතු කොට ගෙනය.

2012 වසරේදී පොල් නිෂ්පාදනය තවත් වැඩි කර ගැනීමට නොහැකි වුයේ දැඩි නියඟය හේතුවෙන් මේරූ වැඩුනු පොල්ගස් 38,140 ක් වියලීයාමෙන්, ජීව කාලය අවසන් වීමෙන් සහ වියළි කලාපයේ ඇති පරිසර ව්‍යසන හේතුකොට ගෙන වසර තුළ මැරී යාම හේතුවෙන්ය. (2011 එල දරන මුළු ගස් ප්‍රමාණය 353,113 ක් වූ අතර 2012 වසර අවසානයේ එය එල දරන ගස් 312,456 දක්වා අඩු විය).

කෙසේවුවද, අහිතකර බලපෑම් අඩු කර ගැනීමට හැකිවූයේ නිර්දේශ කරනු ලැබූ කෘෂි කළමනාකරණ තාක්ෂණ ක්‍රමවේද එනම්, කොළ රොඩු වැසීම, DFR-CRI වැනි පෝෂ්‍ය පදාර්ථ පොහොර යෙදීම ආදී විද්‍යාත්මක කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙනි.

මීට අමතරව, වතු සුපරීක්ෂණය වැඩිදුරටත් ශක්තිමත් කරමින් කැපවීමෙන් සහ කාර්යක්ෂමව වැටුනු සියලුම ගෙඩි ඇහිලීමටත්ල සොරකම් අවම කිරීමට වතුයාය වටේ කටුකම්බි වැටවල් සහ සජීවී කටු පඳුරු (කැක්ටස්) වැවීමත්, වීදුරු කටු ඇල්ලීම ආදී ක්‍රම, විශේෂයෙන්ම සොරකම් වැඩි ජනාකීර්ණ ප්‍රදේශ වල සහ මාර්ග අසල සිදු කෙරීමත් නිසාය.

## ලාභය

2012 වසරේදී වෙළඳපොළ මිල ගණන් වල ශුද්ධ සාමාන්‍ය අගය (NSA) පහළ මට්ටමක්වු ගෙඩියක සාමාන්‍ය අගය රු. 21 ක පමණ ලෙස උච්චාවචනය වූවද, 2011 දී ගෙඩියක සාමාන්‍ය අගය රු. 25), අත්‍යවශ්‍ය කෘෂිකාර්මික වැඩ

# සභාපතිතුමාගේ සමාලෝචනය...

සහ වෙනත් නඩත්තු සහ නව සංවර්ධන වැඩ වලට මුදල් යෙදවීමෙන් පසු 2012 වර්ෂයේ බදු පසු ලාභය (PAT) රු. මිලියන 77.9 ක සුළු ඉහළ යාමක් පෙන්නුම් කළ අතර එය 2011 වසරේදී රු. මිලියන 77.6 ක් විය.

අලෙවි පිරිවැය උපායශීලීව පාලනය කරන ලද්දේ තීරණාත්මක ආයෝජන ප්‍රතිලාභ (ROI) වැඩියෙන් ලැබෙන කෘෂිකාර්මික ක්‍රමවේදයන් අනුගමනය කිරීම තුලිනි. එය පැසසුම් ලැබිය යුතු කළමනාකාරී උපක්‍රමයක් විය.

ඉහත කී ප්‍රතිලාභ ක්‍රම අනුගමනය කරමින්ම, හලාවත වැවිලි සමාගම රු. මිලියන 199 ක් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සහ කෙටි කාලීන ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ලැබූයේ අනාගත උපායශීලී සංස්ථාපිත කෘෂිකාර්මික සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සාධණීය කාර්යක්‍ෂම කළමනාකරණ සැලසුමක් ලෙසිනි. මූලික ව්‍යාපාරය වන පොල් එසේම පවතිද්දී අගය එකතු කළ පොල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන මගින් ලැබෙන ඉහළ ආයෝජන ප්‍රතිලාභ ගැනද සැලකීමට ගැනීමෙනි.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුමැතිය මත වාර්ෂික මහා සභා රැස්වීමේදී සනාථ කිරීමෙන් අනතුරුව, අමාත්‍යාංශයේ අනුමැතියද ඇතිව අප සමාගම ලාභාංශ වශයෙන් රු. මිලියන 75 ක් 2012 වසරේදී, භාණ්ඩාගාරයේ අරමුදල් තර කිරීම පිණිස භාණ්ඩාගාරයට දෙන ලදී. එම ක්‍රියාව භාණ්ඩාගාරයේ සහ ඉහළ මට්ටමේ ප්‍රසාදයට ලක් විය.

ඒ අනුව භාණ්ඩාගාරයට වැඩිම ලාභාංශ මුදලක් වන රුඃ මිලියන 341.6 ක් ලබා දුන් එකම ප්‍රාදේශීය වැවිලි සමාගම ලෙස අප හලාවත වැවිලි සමාගම ආඩම්බරයෙන් හඳුන්වා දී ඇති අතර තවත් රුඃ මිලියන 253.1 ක් වතු කල්බදු වශයෙන්ද රු. මිලියන 308 ක් අයබදු වියදමක් වශයෙන්ද දරා ඇත. මේ සියල්ල සිදු කරනු ලැබූයේ ව්‍යවස්ථාපිත සේවක දීමනා (සේ.අ.සා. අරමුදල්, සේ.භා. අරමුදල්, පාරිතෝෂිත දීමනා) ප්‍රසාද දීමනා, දිරි දීමනා හා සියල්ලමත් ගෙවනු ලැබූ අතරේදීමය.

## ජයග්‍රහණ සහ දායකත්වයන්

**'විද්‍යාත්මකව පොල් සංවර්ධනය'**

මෙම වාර්ෂික වාර්තාවේ සඳහන් වන පරිදි 2012 වර්ෂයේදීද සමාගම 2010 වර්ෂයේ ආරම්භ කරන ලද සහ අනුමැතිය දෙන ලද විද්‍යාත්මක කළමනාකරණ ක්‍රමවේදයන් නව අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ අඛණ්ඩව සිදු කරන ලදී.

කළමනාකරණය විසින් 2012 වර්ෂයේදී 'කප්රුක සුරකිමු' නම්වූ ඇසරියා මයිටා විනාශ කිරීම සඳහා විලෝපීය අභිජනන පර්යේෂණාගාර දෙකක් හලාවත පලුගස්වැව සහ දිවුලපිටියේ කටුකෙන්ද යන වතුයාය වල ඉදිකරන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යඥයින්ගේ මග පෙන්වීම යටතේ මෙවා කාර්යක්‍ෂමව කළමනාකරණය කරමින් පර්යේෂණාගාර දෙකම විලෝපිතයින් මුදා හරිමින් පවතින අතර මෙය පොදු/පුද්ගලික සම්බන්ධතාවය පෙන්නුම් කරන වැදගත් අවස්ථාවකි (PPP).

## වැටුනු පොල් ගෙඩි ඇහිඳීම

විශේෂයෙන්ම පොල් මිල වැඩි කාලවලදී, විශාල ප්‍රමාණයක් වන සියලුම වැටනු ගෙඩි ඇහිඳීම සම්බන්ධව ක්ෂේත්‍ර සුපරීක්‍ෂණ කළමනාකරණය වර්ධනය කැපවීමෙන් සහ අභිප්‍රේණය තුලින් වතු අධිකාරීන්, ස්ථාන භාර නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ මුරකරුවන් පවා සති අන්ත වල සහ නිවාඩු දින වලදී ද සේවයට යොමු කිරීමෙන් ද පුද්ගලික පරිපාලන කාලයේදී (1992 - 2008) අතහැර දමා තිබූ ඔවුනට අත්‍යාවශ්‍ය විදුලි බලය, වහල නඩත්තු කිරීම ජලය හා වැසිකිළි, ඇඳන් සහ මේස ආදියද ප්‍රතිසංස්කරණය කරන ලදී.

වැටුනු ගෙඩි ඇහිඳීම වැඩිවීමට හේතු පාදකවූ අනෙක් කරුණු නම් ක්‍රියාත්මක කල විද්‍යානුකූල, සාධනීය සහ කාර්ක්‍ෂම ක්ෂේත්‍ර කළමනාකරණ ක්‍රමවේදයි. එනම්, විගණකවරුන්, අධිකාරීන් සහ සහකාර සමාන්‍යාධිකාරීන් විසින් කළ නිත්‍ය පිළිවෙත්, අහඹු සහ බුද්ධිමය තොරතුරු ආදී ක්‍රමවේදයන් මගින් විශාල වතුයාය වල ගෙඩි හොරකම් කිරීම හෝ මග ඇරීම් ආදිය අවම හෝ සම්පූර්ණයෙන් නවතා දැමීමයි.

## දැව වගා කිරීම

වතුයාය සීමාවල, වැටවල් අසල සහ පොල් වගාවට හෝ වෙනත් බෝග වගාවට නුසුදුසු පොළොවේ 2010 ආරම්භ කළ දැව ගස් වගා කිරීම 2012 වර්ෂයේද එසේම වඩා විශාලව සිදු කරන ලදී. පොල් පර්යේෂණ ආයතනයේ පස් සුදුසුකම් වර්ගීකරණයට අනුව S5 සහ S6 පස් සමාගමේ වතුයාය තුල 'ක්ෂේමභූමි' ප්‍රදේශ වශයෙන්ද, සේවානියුක්තයන්ට අවශ්‍ය පළතුරු සහ දර සැපයීමටද උපකාරී වේ.

එසේම පරිසර හිතකාමී වාතාවරණයක් ඇතිවීමෙන් මී මැස්සන්, සමනලයින් ගැවසීමෙන් ගස්වල පරාගනයටද රුකුලක් වේ. වර්තමානයේ වගා කර ඇති දැව වර්ග නම් තේක්ක (356) මාගෝසා (2,225) කොස් (1,196) කුඹුක් (356) මැහෙගනී (338) ටර්පන්ටයින් (319) බුරුත (89) සහ ග්ලිරිසීඩියා (50,000) ක් ය.

## පශු සම්පත් ව්‍යාපෘති

පොල් වගාව සහ පශු සම්පත් සංකලනය හරහා වැඩි ඵලදායිතාවක් ඇතුළුව ප්‍රතිලාභ සහ වැඩි ආදායමක් ද, රැකියා අවස්ථාද සමාගමට ලැබේ. දැනට මී ගවයින් 355 ක් හා බැටළුවන් 690 ක් සමාගමේ වතුයාය සතුව ඇති අතර 2012 වසරේ මී ගව කිරි ලීටර් 36,296 ක් නිෂ්පාදනය කර එතුලින් අගය එකතු කළ භාණ්ඩ වශයෙන් යෝගට් 33,996 ක් සහ මී කිරි හට්ටි 21,054 ක් නිපදවන ලදී.

# සභාපතිතුමාගේ සමාලෝචනය...

## සමාගමේ වතු සමග ගම්මුන් අතර සබැඳියාව

පාරම්පරික පුරුද්දක් වන ගම්මුන් සහ වතුයාය අතර සබැඳියාව වැඩසටහන යටතේ වතුයායේ පදිංචි සේවානියුක්තයන්ගේ සහ අසල්වැසි ගම්මුන්ගේ ගවයින්ට තණකොළ ආහාර කැවීමට සමාගම අවසර දී ඇත. මේ මගින් වල් පැල කළමනාකරණය හා ගොම සහ මුත්‍රා මගින් කාබනික පොහොර සහ පෝශනයන්ද වතුයායට ලැබේ.

## වතු තුළ පොල් ප්‍රවාහනයට කරත්ත යොදා ගැනීම

පොල් ප්‍රවාහනයට කරත්ත සඳහා කරත්ත ගවයින් 37 ක් සමාගමේ වතු වල ඇත. රෝද 4 ට්‍රැක්ටර් වලට වැය වන අධික ප්‍රවාහන ගාස්තු අඩු කර ගැනීමට මෙය උපකාරී වේ. මී ගවයින් භාවිතා කර ගනිමින් විශේෂයෙන් සැලසුම් කළ බර විශාල කරත්ත වතු වල වැලි සහ දුෂ්කර කෂේත්‍ර පාරවල් වල පොල් ප්‍රවාහනයට යොදවන එකම වතුයාය පලුගස්වැව වීම විශේෂත්වයකි.

## අගය එකතු කළ පිරිසැකසීම් කර්මාන්ත

ඉන්දියාවෙන් ආනයනය කල නව පොල් තෙල් නිස්සාරණ යන්ත්‍රයක් පලුගස්වැව වතුයායේ සවි කර ඇත්තේ ගුණාත්මක පොල් තෙල් නිෂ්පාදනයටත් රැකියා බිහි කිරීමට 'උපායශිලී ව්‍යාපාර ඒකකයක් (SBU) ලෙසයි. ආරම්භයේදී නිස්සාරණය කළ පොල් තෙල් වල ගුණාත්මක බව ඉහළ තත්ත්වයක පැවතියද තව තවත් ගුණාත්මක බව ඉහළ නැංවීම සහ ගුණාත්මක ප්‍රමිතීන් එකසේ පවත්වා ගෙන යාම පිණිසත් පොල් පර්යේෂණ ආයතනය සමග තවදුරටත් පරීක්ෂණ කරමින් පවති.

ප්‍රතිවර්ති අනුකලනය යොදා ගනිමින් ගුණාත්මක පොල් තෙල් නිෂ්පාදනය කරන එකම වැවිලි සමාගම අප හලාවත වැවිලි සමාගම වන අතර එමගින් පාරිභෝගිකයින්ට දැරිය හැකි සාධාරණ මිලකට වෙළඳපොළේ ඇති කලවම් කළ තෙල් වෙනුවට පිරිසිදු පොල් තෙල් ලබා ගැනීමත්, පිසීම පිණිස ආනයනය කරන අධි මිලැති තෙල් වර්ග අවම කිරීමෙන් රජයට විදේශ විනිමය ඉතිරි කර ගැනීමත් ආදී සමාජ ආර්ථික වාසි බොහොමයක් අපට ලැබෙනු ඇත.

අත්හදා බැලීම් සාර්ථකවූ වහාම අලුත් නමකින් මෙම පොල් තෙල් අලෙවි කිරීමට අපේක්ෂා කෙරේ.

## කජු පිරිසැකසීම

වියළි කලාපයේ බොහෝ වතු වල කජු වගා කරමින් පැවතුනත් වතුයාය වලින් කජු පුහුලම් ඉවත දමන අතර කජු පුහුලම් වල ඇති රසායනික ද්‍රව්‍යයන් ඔක්සීකරණය තුලින් ඇති වන නීරස ඉවත් කර පුහුලම් වලින් කජු වයින් සහ කජු පානයක් සෑදීම පිණිස අත්හදා බැලීම් සිදු කරමින් පවතී. තවද ස්වංක්‍රීය කජු ලෙලි ගැසීමේ යන්ත්‍ර පුත්තලමේ තම්බපණණි වතුයායේ මේවන විට සවිකරමින් පවති.

## පොල් සංවර්ධන අධිකාරයේ පොල් වෙන්දේසිය සහ පොල් පොල හරහා පොල් විකිණීම

පොල් සංවර්ධන අධිකාරය මගින් පවත්වන පොල් වෙන්දේසියේ 2010 ජුනි මස අධ්‍යක්ෂ මණ්ඩලය ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව (මේදිනට පෙර කල) "සීමිත පුද්ගලික" මිල කැඳවීම් විකිණීම් වෙනුවට විවෘත, විනිවිද සහ තරගකාරී මිලකට පොල්, කොප්පරා පාර්සල් සහ වෙනත් කෘෂි භාණ්ඩ අලෙවිය පොල් සංවර්ධන අධිකාරයේ පොල් වෙන්දේසිය මගින් වෙන්දේසි විකිණීමටත් පොල් ලෙලි, කජු, දැව සහ සතුන් අලෙවිය සඳහා පුවත්පත් දැන්වීම් ප්‍රසිද්ධ කිරීමත් සිදු කරන ලදී.

පහළ මිල ගණන් හේතු කොට පොල් සංවර්ධන අධිකාරයේ පොල් වෙන්දේසියේදී නොවිකුණු පොල් පාර්සල් හලාවත ප්‍රධාන කාර්යාලයේදී සෑම මසකම පළමුවෙනි සහ තුන්වැනි සඳුදා දිනකම පෙරවරු 10 ට කුඩා පරිමාණ ගැනුම්කරුවන්ගේ සහභාගීත්වයෙන් විවෘත, විනිවිද සහ තරගකාරී මිලකට ඉහළ මිල ගණන් වලට අලෙවි කරන ලදි. සමාගමට ප්‍රතිලාභ ලැබෙන පරිදි දැන්වීම් පුවරු දෙකක් හලාවත පුත්තලම් පාරේ කාර්යාල ගේට්ටුව අසල සහ පලුගස්වැව වතුයාය ගේට්ටුව ඉදිරිපිට ඉදි කරන ලදී.

මැරුණු ගස්, වැටුනු පොල් අතු,දැව, පොල් ලෙලි පාවිච්චියට නොගන්නා භාණ්ඩ ආදිය පුවත් පත් දැන්වීම් මගින් ප්‍රසම්පාදන කමිටුව විසින් ජාතික ප්‍රසම්පාදන නිර්දේශ වලට අනුකූලව අලෙවි කරන ලදී.

සමාගමේ වත්කම්. සම්පත් හා නිෂ්පාදන වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පලුගස්වැව වතුයාය රජයේ සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරින්ගේ ආරක්ෂක සේවය 2010 වසර සිට ලබා ගැනීමට කටයුතු කෙරිණි. එමගින් සමාග මට වාසි රැසක් ඇති වූ අතර එතෙක් ලබා ගත් පුද්ගලික ආරක්ෂක කොන්ත්‍රාත්කරුගේ සේවාව නවතා දමන ලදී.

## සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ආරක්ෂාව

වසර තුළදී සිවිල් ආරක්ෂක නිලධාරින් පලුගස්වැව වතුයායේ ආරක්ෂාව පවත්වාගෙන යාමට සමාගමට සහාය වූ අතර එමගින් පලුගස්වැව වතුයායේ වත්කම් සොරකම් වලින් ආරක්ෂා කර ගැනීමටත්. වතුයායේ පදිංචි සේවානියුක්තයන්ගේ විනය පවත්වා ගෙන යාමටත් රුකුලක් වූයේය. පොලිසියේ සහායද සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නිරතුරුව ලැබුණි.

# සභාපතිතුමාගේ සමාලෝචනය...

සියලු රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධ ආයතන ආරක්ෂක අමාත්‍යාංශයෙන්, ආරක්ෂක සේවා ලබා ගැනීම අවධානයට යොමු කරමින් නිකුත් කර ඇති චක්‍රලේඛය පිළිබඳව සැලකිලිමත්වීම මෙහිදී සඳහන් කළ යුතු වන්නේය. මේ වන විට මෙමගින් අත් වී ඇති වාසි සමාගම අධ්‍යනය කරමින් සිටින අතර පිරිවැය, වාසි, විමසුම් හා වෙනත් උපායමාර්ග තත්ත්වයන් පිළිබඳව සළකා බලමින් වෙනත් තෝරාගත් වතු සඳහාද ඔවුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කෙරේ.

## මානව සම්පත් සංවර්ධනය

අප සමාගමේ වටිනාම සම්පත, අපගේ මානව සම්පත බව අප දැඩිව සලකන අතර මෙහිදී වතුවල සේවය කරන කාර්ය මණ්ඩල ඉතා වැදගත් වෙමින් වැවිලි වත්කම් වලට වැඩි වටිනාකම් එකතු කරමින් ඉහල නිෂ්පාදිතය, ඵලදායිතාවය, ආදායම් හා ලාභය අත්පත් කර දෙමින් සමාගමේ කොටස්කරුවන් හා උනන්දුවක් දක්වන්නන් හට වාසි රැසක් අත් කර දේ.

පොල් පර්යේෂණ ආයතනය හා වෙනත් සංවිධාන මගින් කල පුහුණුවීම් සමගම අදාල මානව ප්‍රවර්ධන වැඩසටහන් සිදු කරන අතර කාර්යසාධන ඇගයීම් ක්‍රමවේදයට අනුකූලව කාර්ය මණ්ඩල සේවා හා දායකත්ව පිළිගැනුම සහ දිරිදීමනා වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම කළමනාකාරිත්වය විසින් සිදු කරනු ලැබේ.

අප සමාගමේ කළමනාකාරිත්ව වැඩසටහන් අවධාරණය කරන්නේ විද්‍යාණුකූල සහ වාණිජ කළමනාකරණ ක්‍රියාවලියක් මගින් තිරසාර උසස් ඵලදාවක් සහ ලාභයක් ලබා ගැනීමටයි. එහිදි පිළිගැනීම, පාරිතෝෂිත, කර්යසාධන දිරි දීමනා මෙන්ම නිවර්තන සහ දඬුවම් මගින් පක්ෂපාති, කැපවූ සහ විනය ගරුක කළමනාකරණ වැඩසටහන් යොදා ගැනේ.

නිල නිවාස භාවිතා කිරීම හා වතු තුළම පදිංචිවීමේ ඇති වැදගත්කම හා වාසි පිළබඳව වතු අධිකාරිවරුන් සහ කෙෂ්ත්‍ර කාර්ය මණ්ඩල දැනුවත් කර ඇත. වතු අධිකාරිවරු සහ කෙෂ්ත්‍ර කාර්ය මණ්ඩල නිවාඩු දිනයන්ද ඇතුළුව හැකි සෑම අවස්ථාවකදීම වතුතුළ ඇති නිල නිවාස වලම පදිංචි වීමෙන් අත්වන වාසි සම්බන්ධව සහ එමගින් අස්වැන්න ආරක්ෂාවීම ගැනත් නිරතුරුව අවධාරණය කර ඇත. විශාල පොල් වතු වල අස්වැන්න නෙළු පසු වතු අධිකාරිවරුන්ගේ කළමනාකරණ වගකීම් වන්නේ එම අස්වැන්න, වත්කම් ආරක්ෂා කර ගැනීමයි. වතු අධිකාරිවරුන්ගේ අධීක්ෂණය, නිරීක්ෂණය අඩු වීමෙන් පහසුවෙන් අහිමි විය හැකි විවෘත ස්ථානවල ඇති සියලු නිෂ්පාදිත/වත්කම් වල (පොල් ගොඩවල්, භූමිය හා වගා) ප්‍රධාන "භාරකරුවන්" ඔවුන් බවද කළමනාකාරිත්වය ඒත්තු ගන්වා ඇත.

වසර තුළ සියලුම වතු කාර්යමණ්ඩල බංගලා/වාසස්ථාන /ලයින් කාමර නඩත්තු කර හෝ අලුත්වැඩියා කර විදුලි බලය, ජලය සහ වැසිකිළි පහසුකම්ද ලබා දී ඇත. මූලික හා අත්‍යාවශ්‍ය වන විදුලිය අප සමාගමේ සෑම සේවා නියුක්තයකුගේම නිවසවලට ලබා දී ඇති බව වාර්තා කරන්නේ ඉමහත් සතුටිනි.

## සති අන්තයේ සහ නිවාඩු දිනවල කෙෂ්ත්‍ර පරීක්ෂාව

සති අන්තයේ සහ නිවාඩු දින වල සිදු කළ අහඹු සහ විද්‍යානුකූල කෙෂ්ත්‍ර පරීක්ෂණ වලදී එම කළමනාකරණ ක්‍රමවේදයට ප්‍රසාදය දැක්වූ කෙෂ්ත්‍ර කාර්ය මණ්ඩලය සභාපතිතුමා/ප්‍රධාන විධායක නිලධාරි තුමා පෙන්වා දුන් ආකාරයට වත්කම් (පොල්) ආරක්ෂාකරමින් වතු නිළ නිවාස වලම පදිංචි ව සිටි බව අනාවරණය විමද ඉමහත් සතුටකි.

## සැලසුම් කළ වාර්ෂික කාල රාමුව

2010 ජූනි මස සිට සියලුම අධිකාරිවරුන්ගේ මාසික ප්‍රගති සමාලෝචනය හා ජ්‍යේෂ්ඨ කළමනාකරණ ඇගයීම්ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පෙර සැලසුම් කළ වාර්ෂික දින/කාල රාමුවට අනුව සිදු කරනු ලැබුනි. 2013 වර්ෂයේ දින/කාල රාමුවද සූදානම් කර ඇත.

සියළුම වැදගත් සිදුවීම් පෙර සැලසුම් කර තිබීමෙන් විශේෂයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ විගණන රැස්වීම් කාල රාමුවට අනුව පැවැත්වීමෙන් සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය පෙන්වූ ආදර්ශවත් විනයගරුත්වය, සියලුම කාර්ය මණ්ඩලයේත් සියලුම ප්‍රතිලාභීන්ගේද පැසසුමට ලක් වූ බව ඔවුන්ගේ විනයගරුක හැසිරීම් වලින් අනාවරනය වී ඇත.

## සමාගමේ වාර්ෂික වාර්තාවන්

2010 ට පෙර හලාවත වැවිලි සමාගම වාර්ෂික වාර්තා පිළියෙළ කර නොතිබුණි. වර්තමාන කළමනාකරණය දැඩි උත්සාහයක් යොදා 2010 මැයි සිට දත්ත රැස්කර 2007, 2008 සහ 2009 වාර්ෂික වාර්තා පිළියෙළ කර, මුද්‍රණය කර අවශ්‍ය පිටපත් සංඛ්‍යාව, අමාත්‍යාංශයට ද අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවටද ලබා දෙන ලදී.

2010 සහ 2011 වාර්ෂික වාර්තා මුද්‍රණය කර ඇති අතර ඒවා අමාත්‍යාංශයටද, අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉක්මනින්ම භාර දෙනු ඇත.

සාමාන්‍ය බාහිර විගණන කටයුතු ප්‍රමාදය අවම කර ගනු වස් වර්තමාන බාහිර විගණකවරු වන අයියර් සහ සමාගමට කෙෂ්ත්‍ර විගණන කටයුතු 2012 දෙසැම්බර් මස සිට ආරම්භ කරන ලෙස දන්වන ලද අතර ඔවුන් 2013 මැයි මස වන විට බාහිර වතු කෙෂ්ත්‍ර විගණන කටයුතු අවසන් කර විගණන වාර්තාව සහ විගණන නිර්දේශද කළමනාකරණ ලිපියද සමග භාර දුන් බව පවසන්නේ ඉමහත් සතුටිනි. ඉතිහාසයේ ප්‍රථම වතාවට ව්‍යවස්ථාපිත කාල රාමුව වන

# සභාපතිතුමාගේ සමාලෝචනය...

ජුනි මස අවසානයට පෙර 2012 වාර්ෂික වාර්තාවද පිළියෙළ කිරීමට සමාගමට එමගින් හැකියාව ලැබුණි.

අප හලාවත වැවිලි සමාගම ඉතිහාසයේ පළමු වරට 2012 වර්ෂය සඳහා උපායශීලී සාමූහික සැලසුමක්ද, ක්‍රියාකාරී මෙහෙයුම් සැලසුමක් හා ප්‍රසම්පාදන සැලසුමක්ද පිළියෙළ කර සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

අවශ්‍ය සේවක සංඛ්‍යාව සහ සේවයට බඳවා ගැනීමේ පටිපාටියක් සකසා ජාතික වේතන හා සේවක සංඛ්‍යා කොමිසමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමටත් 2012/10/25 දින මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත්, වර්තමාන කළමනාකරණය සමත්විය.

හලාවත වැවිලි සමාගමේ කළමනාකරණය සේවකයින් බඳවා ගැනීමේ පටිපාටියට අනුව වර්තමාන සේවක සංඛ්‍යාව අනුගත කරමින් සිටින අතර ඇතිවන පුරප්පාඩු පිරිවීම සඳහා විවෘත පුවත්පත් දැන්වීම් මගින් අයදුම් පත් කැඳවා සුදුසු සේවකයින් ඉදිරියේදී බඳවා ගනු ඇත.

## අමාත්‍යාංශයේ ජාලගත වෙබ් ආශ්‍රිත ඇගයීම

දිනපතා පෙරවරුවේ සහ පස්වරුවේ වැටුනු ගෙඩි එකතු කිරීම, කැඩූ ගෙඩි, සේවක හා කාර්ය මණ්ඩල පැමිණීමේ වාර්තා සාදා එම දත්ත යාවත්කාලීන කරන්නාවූ අමාත්‍යාංශයේ ජාලගත වෙබ් ආශ්‍රිත ඇගයීමේ පද්ධතිය සමග හලාවත වැවිලි සමාගම ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත. මෙමගින් අහිමි විය හැකි ගෙඩි, සේවක පැමිණීම පිළිබඳ ප්‍රශ්න ආදිය සම්බන්ධව සාධනීය සහ කාර්යක්ෂම කළමනාකරණය කිරීමටත් එතුළින් පරිපාලන සහ මූල්‍ය වාසි රැසක් අත් කර ගැනීමටත් හලාවත වැවිලි සමාගම ට හැකියාව ලැබුණි.

එවැනි ක්‍රියා පද්ධතියක් ආරම්භ කිරීම සහ සහාය ලබාදීම සම්බන්ධව ගරු අමාත්‍යතුමාටත්, ලේකම්තුමා ඇතුළු අමාත්‍යංශ කාර්ය මණ්ඩයලටත් ස්තුතිවන්ත වෙමු.

## තුති පිදීම

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලු තරාතිරමක කාර්ය මණ්ඩල වෙනුවෙන් පුද්ගලික කළමනාකරණ නියෝජිතයාගෙන් (1992 සිට 2008 දක්වා) 2008 මැයි මස සිට කළමනාකරණය රජයට පවරා ගැනීමේ දූරදර්ශී තීරණය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාටත්, රජයට සහ අමාත්‍ය මණ්ඩලයටත් අපගේ ඉහළම කෘතවේදීත්වය පළ කර සිටින අතර, එමගින් භාණ්ඩාගාර දායකත්වයන් සඳහා සමාගමේ ඉහළ ලාභයෙන් භාණ්ඩාගාරය වෙත ලාභාංශ කොටස් ලබාදීමටද අප සමාගම සමත් විම සතුටකි.

සමාලෝචිත වර්ෂයේදි සමාගම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පැවති අතර අපගේ අමාත්‍යවරයා වන ගරු ජගත් පුෂ්පකුමාර මැතිතුමා විසින් ලබා දුන් මගපෙන්වීම හා සහායත්, අමාත්‍යාංශයේ ලේකම් නිහාල් සෝමවීර මහතා, අතිරේක ලේකම් බණ්ඩාරනායක මහතා සහ අමාත්‍යංශ නිලධාරීන් විසින් උපදේශන හා කාරුණික උනන්දු කරලීම් සහ අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගමේ ක්‍රියාකාරකම් සිදු කරලීමට දැක්වූ සහාය හා දායකත්වයද අගය කරන අතර හිටපු ලේකම් අනුර සිරිවර්ධන මහතාගේ සහයත් අපි අගය කරන්නෙමු.

වතු අධිකාරි, සහකාර වතු අධිකාරි, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල මෙන්ම වතු වල සේවය කරන අපගේ වටිනාම මානව සම්පත වන සේවක ප්‍රජාවේ සියලු දෙනා විසින් කළමනාකරණයට තම සහාය සහ සහයෝගය පුද කර ඇති එය ඉමහත් සතුටකි.

අවංකත්වයෙන් හා කැපවීමෙන් කටයුතු කළ කාර්ය මණ්ඩලයේ සියලු දෙනා විසින් ඉටු කළ සේවා හා දායකත්වය පිළිබඳව අප සමාගම ආඩම්බර වෙමු.

අවසාන වශයෙන් සමාගමේ උපායශීලී ආයතනික සැලැස්මට අනුව අපගේ සියලු කටයුතු ගැන උනන්දුවක් දක්වන්නන් හට බලාපොරොත්තු වූ ප්‍රතිඵල සමාලෝචිත වසර තුළදී සාක්ෂාත් කර ගැනීමට අප සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි ලෙස විශ්වාසය හා මගපෙන්වීම, උනන්දුව, සහය හා කරුණාවන්ත බව ලබා දුන් මාගේ හිතවත් චන්ද්‍රපාල විධායක අධ්‍යක්ෂතුමාට සහ අධ්‍යක්ෂත මණ්ඩලයේ සියලුම සහෘද අධ්‍යක්ෂතුමන්ලා වෙතද මාගේ හද පිරි කෘතවේදීත්වය අවංකව පිරි නමමි.

(ආචාර්ය සුනිල් ජයසේකර)
B.Sc (Chemistry Hons, Peradeniya, SL),
Ph.D (Queensland, Australia), C.Chem,

සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
හලාවත වැවිලි සමාගම

24 මැයි 2013

# අධ්‍යක්‍ෂ මණ්ඩලය (2012)

## 01. ආචාර්ය සුනිල් ජයසේකර

B.Sc (Chemistry Hons, Peradeniya), Ph.D (Queensland, Australia), C.Chem.

සභාපති/ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික

61 / 12B, මානෙල් මාවත, පරණ කැස්බෑව පාර, නුගේගොඩ.

071 4439944

| | |
|---|---|
| 1a. **සභාපති/ප්‍රධාන විධායක නිලධාරි හලාවත වැවිලි සමාගම** | 2010 මැයි 18 සිට අද දක්වා |
| 1b. අධ්‍යක්‍ෂ වැවිලි, උපායමාර්ගික ව්‍යාපාර කළමනාකරණ ඒජන්සිය (SEMA), ජනාධිපති ලේකම් කාර්යාලය. | 2006.06.01 සිට 2010.06.20 |
| 1c. සභාපති/කළමනාකාර අධ්‍යක්‍ෂ (ANCL) ලේක් හවුස් | 2005.12.12 සිට 2006.05.30 |
| 1d. සභාපති, තේ පර්යේෂණ මණ්ඩලය, තලවකැලෙ (TRI) | 2004.07.28 සිට 2005.12.11 |
| 1e. අධ්‍යක්‍ෂ වැවිලි, සීමාසහිත හලාවත වැවිලි සමාගම | 2002.03.01 සිට 2004.07.26 |
| 1f. සභාපති/ප්‍ර.වි.නි. පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) | 1994.09.27 සිට 2001.12.07 |
| 1g. පාංශු විද්‍යාඥ - SPND, පොල් පර්යේෂණ ආයතනය (CRI) | 1978 සිට 1994 |

## 02. ඒ. එම්. චන්ද්‍රපාල මහතා

අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික සහ විධායක අධ්‍යක්‍ෂ

301, කෝට්ටේ පාර, නුගේගොඩ 077 3321551

2a. **පලාත් සභා අමාත්‍යාංශයේ හිටපු ලේකම්, විශ්‍රාමලත්** SLAS **විශේෂ පංති නිලධාරි**

## 03. කේ. ඒ. ශාන්ත ආර්. ඩයස් මහතා

අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික සහ ක්‍රියාකාරි අධ්‍යක්‍ෂ

3/65, කොටවෙහෙර, පැරගහකැලේ, අම්පාර 077 8462505

## 04. ප්‍රියංගනි ලියනගේ මහත්මිය

අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය

4a. **ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණි** PED, **මහා භාණ්ඩාගාරය** 0777 898 841

## 05. චන්ද්‍රා ප්‍රනාන්දු මහතා

අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික

අංක 3, ෂර්බර් උද්‍යානය, කොළඹ 04. 011 2580561 & 011 2553321

5a. **විශ්‍රාමලත් පොලිස්පති** (IGP), **අතිගරු ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක**

## 06. අයි. එම්. ආර්. විදානගමගේ මහතා

අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික

'තරිඳු', බුද්ධියගම, වීරකැටිය. 077 3088478

## 07. ඩී. ඒ. ඩී. රුවන් දනන්සූරිය මහතා

අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික

26/4, ඇල්ල වත්ත, කටුවාවල මාවත, බොරලැස්ගමුව. 0777 593422, 011 2516885

7a. **විශ්‍රාමලත් නියෝජ්‍ය අධ්‍යක්‍ෂ – ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

## 08. එම්. එස්. එම්. සකාවුල්ලා මහතා

අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික

54 / 2, මඩම්පැල්ල පාර, කොච්චිකඩේ. 0777 555884

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

## 2012 දෙසැම්බර් 31 දිනට

**01. ආචාර්ය සුනිල් ජයසේකර**
B.Sc (Chemistry Hons, Peradeniya), Ph.D (Queensland, Australia), C.Chem.
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි — 071 4439944

**02. ඒ. එම් චන්ද්‍රපාල මහතා**
විධායක අධ්‍යක්‍ෂ — 077 3321551
(2011 නොවැම්බර් 08 සිට බලපවත්නා පරිදි පත් කරන ලදී)

**03. පුරප්පාඩු වී ඇත**
සාමාන්‍යාධිකාරි

**04. ඩී. ජී. ඒ. ආර්. ද සිල්වා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි (වැවිලි)

**05. ආර්. එම්. ආර්. බී. රත්නායක මහතා**
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි — 071 8478569

**06. ඩබ්ලිව්. එල්. ඩී. ප්‍රනාන්දු මහතා**
සහකාර සාමාන්‍යාධිකාරි :වැවිලි ඉන්ජිනේරු* — 077 7364907

**07. එච්. පී. එම්. ඩබ්ලිව්. හේමචන්ද්‍ර මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක — 071 8441536

**08. බී. හෙට්ටිආරච්චි මහතා**
වතු අධිකාරි, තම්බපණ්ණි පළාත් වතුයාය — 071 8413943

**09. ඒ. දිසනායක මහතා**
වතු අධිකාරි, බිංගිරිය පළාත් වතුයාය — 077 2249046

**10. ඩබ්ලිව්. එම්. පී. වීරසේකර මහතා**
වතු අධිකාරි, මාදම්පේ පළාත් වතුයාය — 071 8998155

**11.ඒ. ඒ. එස්. ඩබ්ලිව්. හේරත් මහතා**
වතු අධිකාරි, හලාවත පළාත් වතුයාය — 071 8730613

**12. ජේ. එච්. ප්‍රනාන්දු මහතා**
වතු අධිකාරි, පලුගස්වැව පළාත් වතුයාය — 071 4244248

**13. සී. ඩයස් මහතා**
වතු අධිකාරි, දිවුලපිටිය පළාත් වතුයාය — 077 3586974

**14. බී. එම්. යූ. බී. බස්නායක මහතා**
වතු අධිකාරි, නිකවැරටිය පළාත් වතුයාය — 077 3156774

# කළමනාකරණ විමර්ශනය

## භාණ්ඩාගාරයට වැඩිම ලාභාංශ ලබාදීම

2008 මැයි මස සිට එනම් කළමනාකරණය රජයට පවරා ගත් අප හලාවත වැවිලි සමාගම 2009 අප්‍රේල් 01 දින ලාභාංශ ලෙස රුපියල් මිලියන 30 ක් මහා භාණ්ඩාගාරයට ගෙවා ඇත. කෙසේ වුවද, භාණ්ඩාගාරයට ලාභාංශ වැඩි කිරීමට 2010 මැයි මස 18 දින පත්වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති අතර 2011 මාර්තු 17 වන දින රුපියල් මිලියන 75 ක් ගෙවන ලදී. මේ වසරේ සැප්තැම්බර් මස 24 දින තවත් මිලියන 75 ක් මහා භාණ්ඩාගාරයට ලාභාංශ වශයෙන් ගෙවන ලදී.

ඒ අනුව රුපියල් මිලියන 341.6 ක ඉතිහාසගත ඉහලම ලාභාංශ ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරයට ගෙවන ලද එකම ප්‍රාදේශීය වැවිලි සමාගම බවට අප සමාගම පත් වී ඇත. මීට අමතරව, කල් බදු වශයෙන් රුපියල් මිලියන 253.9 ක් සහ අයබදු වශයෙන් රුපියල් මිලියන 308 ක්ද වියදමක් ලෙස දරා ඇත. තවද සේවානියුක්තයින්ගේ ව්‍යවස්ථාපිත (සේ.අ.සා.අරමුදල්/සේවා භාර අරමුදල්/පාරිතෝෂිත දීමනා) ආදී ගෙවීම් ද කාර්යසාධන දිරි දීමනා/ප්‍රසාද ආදීයද ගෙවා ඇත. මෙතුළින් රාජ්‍ය ආයතන පාලනය කිරීමට ඇති හැකියාවත් 'පුද්ගලීකරණය' නොකර එතුළින් රජයට, භාණ්ඩාගාරයට, සේවකයින්ට සහ ජනතාවට වාසි වන අන්දමින් අවංකව, කාර්යක්ෂම හා විද්‍යානුකූල පරිපාලන ක්‍රමවේද අනුගමනය කළ හැකි බව විදහා දක්වයි.

| වසර | බදු පසු ලාභය (PAT) රු. මිලියන | ඉඩම් කල් බදු ගෙවීම් රු. මිලියන | අය බදු ගෙවීම් | මහා භාණ්ඩාගාරයට ගෙවූ ලාභාංශ රු. මිලියන | ලාභාංශ ගෙවූ දිනය |
|---|---|---|---|---|---|
| 2008 | 10,508,992 | 19,423,848 | 24,761,558 | 0 | - |
| 2009 | 98,097,427 | 22,589,936 | 22,595,354 | 30 | 01 අප්‍රේල් 2009 |
| 2010 | 75,255,857 | 23,877,564 | 38,907,219 | 0 | - |
| 2011 | 77,669,662 | 25,620,628 | 18,101,554 | 75 | 17 මාර්තු 2011 |
| 2012 | 77,974,847 | 27,619,040 | 8,250,497 | 75 | 24 සැප්. 2012 |




## ඉහළ පොල් ඵලදාවක්

**දැඩි නියගය තිබියදීත් (ගසකට ගෙඩි 51 ක්)**

2012 වර්ෂයේදී නෙලා ගනු ලැබූ පොල් නිෂ්පාදනය ගෙඩි 15,807,753 ක්වූ අතර 2011 වර්ෂයේ නිෂ්පාදනය වූ ගෙඩි 14,527,770 ට සාපේක්ෂව ඉහළ යාමක් පෙන්නුම් කළ අතර 2012 නොවැම්බර් දක්වා සහ ඉන් පෙර වර්ෂ දෙකකම පැවති දැඩි නියඟය (2012 දෙසැම්බර් ජල ගැල්මට පෙර) අතර වුවද 2011 ගසකට ගෙඩි 41 වෙනුවට 2012 ගසකට ගෙඩි 51 ක් වූ ඉහළ ඵලදායිතාවයක් වාර්තා කරයි. සමාගමේ පොල් වතු බොහොමයක් වියලි කලාපයේ පිහිටා තිබියදීත් මෙය ලඟා කරගෙන ඇත. (about 32% in DL3, 59% in IL3, and only 9% in Intermediate IL1 Agro-Climatic Zones).

අඛණ්ඩ ඵලදායි වර්ධනය වැනි විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවූයේ පොල් පර්යේෂණ ආයතනය නිර්දේශ කළ විද්‍යානුකූල පොහොර DFR (පස සහ පත්‍ර විශ්ලේෂනය මගින් අස්වනු සීමාකරන පෝෂපදාර්ථ සහිත) යෙදීමේ ක්‍රමවේදය සමාගම විසින් අනුගමනය කිරීමත්, සුදුසු ශෂ්‍ය විද්‍යාත්මක තාක්‍ෂනික ක්‍රම එනම් කොළ රොඩු වැස්ම, පසෙහි ජලය රඳවා ගැනීමත් (විශාල වලවල් තුල පොල් ලෙලි) භාවිතා

# කළමනාකරණ විමර්ශනය...

කිරීමත් කැපවීමෙන් හා වැටුනු ගෙඩි කාර්යක්ෂමව ඇහිඳීමේ සැලස්මත්, දැඩි කළමනාකරණ සුපරීක්ෂණය යටතේ වතුයාය වටා ඇති වැටවල් ශක්තිමත් කිරීම, කටුකම්බි ගැසීම, කටු පඳුරු සිටුවීම සහ වීදුරු කටු යෙදවීමෙන් හොරකම් වලට ඇති ඉඩ අවම කිරීමත් හේතු කොට ගෙනය.

**සමාගමේ පොල් නිෂ්පාදනය, ඵලදායිතාව, වැඩුනු ඵල දරන ගස් සහ ශ්‍රී ලංකා වාර්ෂික පොල් නිෂ්පාදනය**

| වර්ෂය | පොල් අස්වැන්න (ගෙඩි) | වෙනස YOY % | ඵල දරන පොල් ගස් (ගණන) | වෙනස YOY % | ඵලදායිතාව වසරකට/ ගසකට/ගෙඩි | ශ්‍රී ලංකා නිශ්පාදනය ගෙඩි මිලියන | වෙනස YOY % |
|---|---|---|---|---|---|---|---|
| 1992 | 20,782,648 | - | 421,875 | -3% | 49 | 2,296 | 0 |
| 1993 | 19,145,214 | -8% | 407,512 | 5% | 47 | 2,164 | -6% |
| 1994 | 21,382,314 | 12% | 426,722 | 3% | 50 | 2,622 | 21% |
| 1995 | 22,603,156 | 6% | 441,379 | -4% | 51 | 2,755 | 5% |
| 1996 | 19,336,658 | -14% | 421,760 | -4% | 46 | 2,546 | -8% |
| 1997 | 19,235,974 | -1% | 412,006 | -2% | 47 | 2,630 | 3% |
| 1998 | 18,921,808 | -2% | 415,718 | 1% | 46 | 2,522 | -4% |
| 1999 | 21,348,626 | 13% | 393,360 | -5% | 54 | 2,828 | 12% |
| 2000 | 23,216,882 | 9% | 399,454 | 2% | 58 | 3,096 | 9% |
| 2001 | 21,829,630 | -6% | 395,435 | -1% | 55 | 2,769 | -11% |
| 2002 | 15,031,795 | -31% | 413,465 | 5% | 36 | 2,392 | -14% |
| 2003 | 17,585,652 | 17% | 402,937 | -3% | 44 | 2,562 | 7% |
| 2004 | 18,354,614 | 4% | 401,602 | 0% | 46 | 2,591 | 1% |
| 2005 | 14,391,265 | -22% | 408,006 | 2% | 35 | 2,515 | -3% |
| 2006 | 17,070,324 | 19% | 411,968 | 1% | 41 | 2,785 | 11% |
| 2007 | 17,815,317 | 4% | 395,762 | -4% | 45 | 2,869 | 3% |
| 2008 | 16,280,051 | -9% | 378,333 | -4% | 43 | 2,908 | 1% |
| 2009 | 18,632,247 | 14% | 380,000 | 0% | 49 | 2,762 | -5% |
| 2010 | 18,256,007 | -2% | 340,586 | -10% | 54 | 2,317 | -16% |
| 2011 | 14,527,770 | -20% | 353,113 | 4% | 41 | 2,808 | 9% |
| 2012 | 15,807,753 | 9% | 312,456 | -12% | 51 | 2,940 | 5% |

පස හා ජල ප්‍රමාණය, නියඟය, උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ධතාවය, පලිබෝධ හා රෝග, පරාගනය හා පොහොර යෙදීමේ ක්‍රමවේදය, ගෙඩි හට ගැනීම්, කුරුම්බැට්ටි ඇද හැලීම, නොමේරු ගෙඩි හැලීම හා පුහු ගෙඩි සෑදීම ආදී හේතු පොල් නිෂ්පාදනයට විශාල වශයෙන් බලපායි.

සමාගමේ වතු බොහොමයක් වියලි කෘෂි දේශගුණයක් සහිත කලාපයේ පිහිටි නිසා පැල සහ ළපටි ගස් වියළි මැරී යාම වළක්වනු පිණිස අමතර වාරික්‍රම මගින් ජලය සපයන ලදී. බීමට පවා වතු වල පොලොවේ ජලය නොමැතිකම නිසා නියං වසර තුල බොහෝ පොල් වතුවලට අතිරේක වාරිමාර්ග සැපයීමක්ද ප්‍රායෝගිකව කළ නොහැක.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යේෂ්ඨ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩල සමග මාස්පතා පවත්වනු ලබන ඇගයීම් රැස්වීම් වලදී පොල් නිෂ්පාදනය සහ නියඟය, උෂ්ණත්වය, සාපේක්ෂ අර්ධතාවය, සුළං, පරාගනය හා පොහොර යෙදීමේ ක්‍රමවේදය, ගෙඩි හට ගැනීම්, කුරුම්බැට්ටි ඇද හැලීම, නොමේරු ගෙඩි හැලීම හා පුහු ගෙඩි සැදීම බලපෑම් මගින් සිදුවන වෙනස්කම් ගැන විමර්ශනය කරන ලබයි.

# කළමනාකරණ විමර්ශනය...

ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය සහ ලෝකයේ විවිධ රටවල පොල් ආශ්‍රිත පර්යේෂණ වලින් හෙළි වී ඇත්තේ පොල් නිෂ්පාදනය ජල හිඟ කමින් සහ පාරිසරික 'ආතති' (උෂ්ණත්වය,ආර්ධතාවය, සුළං, පරාග නය, ප්‍රභාසංස්ලේෂණ විකිරණය හිරු එළිය ආදී) කායික විද්‍යමය සංවර්ධන අවදිය වන මුල් වසර තුනේදී අස්වැන්නට මුලාරම්භයේ සිටම බලපෑම් ඇති කරන බවයි.




වැසි ජලයෙන් පෝෂණය වන වෙනත් කෘෂි වගා මෙන් නොව පසු ගිය වසර 03 තුළ පාලනයකින් තොරව (2010 සිට 2012 දක්වා) පැවති අහිතකර නියං තත්ත්වයද පොල් නිෂ්පාදනයට බලපා ඇත. අස්වැන්න තවදුරටත් අඩුවීමට හේතුවක් වූයේ 2012 ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ දැඩි නියඟය (දෙසැම්බර් ජල ගැල්මට පෙර) වියළි කලාපයේ මේරු පොල් වගාවට නිරන්තරයෙන් බලපාන පාරිසරික ප්‍රතිඵල එනම්, වියළීම, සුළඟ සහ ආයු කාලය ආදිය නිසා එලදරන වැඩුණු ගස් 19,239 විනාශ වීමයි.

අතීත නිෂ්පාදන වාර්තා වලින් පෙන්නුම් කරන්නේද පොල් වගාවට බලපාන චක්‍රකාර මෙවැනිම නියඟ කාලයන් තුලදී ද නිෂ්පාදනයට එය බල පෑ ආකාරය සහ 2005 වසරේ අස්වැන්න වැඩුන මේරු ගස් 408,006 කින් ගෙඩි මිලියන 14.3 ක් අඩු පලදාවක් ලැබූ බව යි.

## නියඟ හානි (2012)



2012 ජනවාරි සිට නොවැම්බර් අවසානය දක්වා වූ ඉතා අඩු වර්ෂාපතනය හේතු කොට ගෙන පොල් වගාවට ගෙඩි සැදීම, පොහොර යෙදීම, වගා කිරීම, කෘෂිකාර්මික පුරුදු ආදියට අහිතකරව දීර්ඝකාලීන බලපෑම් ඇති කරමින් ඔක්තෝබර් අවසන් වන විට (වර්ෂාවට/දෙසැම්බර් ජල ගැලීමට පෙර වයස මේරු පොල් ගස් සහ පැල ගස් විශාල ප්‍රමාණයක් (උඩු වියන) කඩා වැටීමෙන් විනාශ විය. එවායේ මුළු ගණන 38,140 කි.

# කළමනාකරණ විමර්ශනය...

2012 දී පැවති නියඟයෙන් (1986 න් පසු දරුණුම නියඟය) විනාශයටපත් විශාල වැඩුණු ගස් ප්‍රමාණය නිසා 2013 සිට ඉදිරි වසර 03 ක පමණ කාලයක් පොල් නිෂ්පාදනයට බලපෑම් ඇති වනු ඇත. එබැවින් කළමනාකරණය අගය එකතු කළ කර්මාන්ත (පොල් තෙල්, කජු පිරිසකර කිරීම, තවාන්, දැව අස්වැන්න ආදී) සහ වෙනත් සම්පත් තුලින් ආදායම වැඩි කිරීමටත් බලාපොරොත්තු ලාභ ලැබීමටත් පියවර ගනිමින් සිටියි. එලදායි ගස්වගාවන් ආයු කාලය, නියඟය, හෙණ ගැසීම් සහ සුළඟ වැනි කරුණු නිසා විනාශ වීම සෑම පොල් වගා වතු යායකටම පොදු දෙයකි. 2008 වසරේ 378,333 වූ පොල් ගහණය 2012 වන විට 312,456 දක්වා අඩු වී ඇත.

අහිතකර බලපෑම් වලට යම්කිසි සහනයන් වශයෙන් කොළ රොඩු වැසීම, DFR-CRI පැකේජ වැනි අවශ්‍ය පෝෂ්‍යපදාර්ථ යෙදීමෙන් කෘෂිකාර්මික කළමනාකරණ තාක්‍ෂනයන් යොද ගැනීමෙන් ලබා ගන්නා ලදී.

**මැරුණ, වයස්ගත, වැඩුණු සහ ළපටි ගස් - 2012 දෙසැම්බර් 31 වැනි දිනට**

| වතුයාය | මේරූ එල දරණ ගස් | නොමේරූ ගස් | මුළු එකතුව |
|---|---|---|---|
| තම්බපණ්ණි ප්‍රදේශ වතුයාය | 10,898 | 2,225 | 13,123 |
| බිංගිරිය ප්‍රදේශ වතුයාය | 4,714 | 8,168 | 12,882 |
| නිකවැරටිය | 1,107 | 361 | 1,468 |
| පලුගස්වැව | 2,111 | 1,147 | 3,258 |
| හලාවත | 409 | 4,416 | 4,825 |
| මාදම්පේ | | 2,501 | 2,501 |
| දිවුලපිටිය | | 83 | 83 |
| එකතුව | 19,239 | 18,901 | 38,140 |

## අවම වර්ෂාපතනය සහ වැසි වැටුනු දින (2012)

2012 හවැස වතු පිහිටි ප්‍රදේශ වලට ලැබුනු වාර්ෂික වර්ෂාපතනය පැහැදිලිව පසු ගිය වසර වලට වඩා 20% 40% ක පමණ අඩුවක් පෙන්වයි.



# කළමනාකරණ විමර්ශනය...

**වර්ෂාපතනය සහ 2012 වැසි වැටුනු දින**
**අවම (තෙත් - වැසි දින)**

| වතුයාය | 2012 ජනවාරි - දෙසැම්බර් වර්ෂාපතනය මි.මී. | 2012 ජනවාරි - දෙසැම්බර් තෙත් දින | 2012 දෙසැම්බර් වර්ෂාපතනය මි.මී. | 2012 දෙසැම්බර් තෙත් දින |
|---|---|---|---|---|
| බිංගිරිය | 1,689 | 93 | 308 | 11 |
| හලාවත | 1,453 | 82 | 325 | 10 |
| දිවුලපිටිය | 1,814 | 110 | 98 | 04 |
| මාදම්පේ | 1,854 | 69 | 506 | 08 |
| නිකවැරටිය | 1,128 | 54 | 112 | 06 |
| පලුගස්වැව | 1,870 | 97 | 454 | 13 |
| තම්බපණ්ණි | 1,359 | 60 | 374 | 15 |
| තම්බපණ්ණි | 1,275 | 55 | 264 | 09 |

පස හා පාංශු ජලයේ ස්වභාවය, නියඟය, උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාවය, පලිබෝධ හා ව්‍යාධීන්, පරාග නය හා පොහොර යෙදීමේ ක්‍රියාවලිය, කුරුම්බැට්ටි ඇද හැලීම, නොමේරූ ගෙඩි හැලීම හා පුහු ගෙඩි සෑදීම යනාදී සාධකයන් මත පොල් නිශ්පාදන පරිමාව වෙනස් වියහැක.

මේරූ පොල් ගෙඩියක් නිෂ්පාදනය වීමට ගතවන ආයු කාලය මාස 48 ක් පමණ ගතවේ.
එය අදියර තුනකින් සිදු වේ.

**අදියර I** (අග්‍රස්ථ විබාජකය තුළ සැඟ වී - මූලාරම්භක අදියර) :
මූලාරම්භක අවස්ථාවේ සිට පොල් මල විවෘත වන තෙක් මාස 24 ක් පමණ කළද තුළ

**අදියර II** (අර්ධ වශයෙන් පෙනෙන මල් හට ගන්නා අදියර) :
තවත් මාස 12 ක් මල් විවෘත වීමේ සිට ස්ත්‍රී ලිංගික ගෙඩියක්
පරාගනය මගින් සංසේචනය වීම දක්වා

**අදියර III** (දෘෂ්‍යමානයි ගෙඩි මෝරන අදියර) :
ගෙඩි සෑදීම ආරම්භයේ සිට පොල් ගෙඩිය මෝරන්නට මාස 12 ක් පමණ ගතවනු ඇත.

එසේ හෙයින්, ජල සංවේදී වැඩෙන අවධියේදී මෙම අදියර තුනෙන් කවර එකකදී වුවද ජල ඌනතාවය (නියඟය හෝ වියළි කාලගුණය)මේරූ පොල් අස්වැන්න අඩු වීමට හේතු කාරක වේ.

පර්යේෂණ වලින් අනාවරණය වී ඇත්තේ මෙම වර්ධනය වන අවස්ථාවලදී නියඟය හේතුවෙන් අස්වැන්න 30% කින් පමණ අඩුවන බව යි.

## විවිධ කෘෂි-දේශගුණික කලාප වල පිහිටි හවැස පොල් වතු

හවැස පොල් වතු බොහොමයක් වියළි කලාපයේ කෘෂි දේශගුණික කලාප (DL3 වතු 32% ක්ද IL3 වතු 59% in), වතු 9% ක් පමණක් අන්තර කලාපයේ පිහිටා ඇති අතර අහිතකර බලපෑම්වලට යටත් වේ. (IL1),

# කළමනාකරණ විමර්ශනය...




| CPL Estates : ha | IL 1 | IL 3 | DL 3 |
|---|---|---|---|
| Palugaswewa | | 670.22 | |
| Chilaw | | 782.59 | |
| Madampe | | 655.86 | |
| Divulapitiya | 510.55 | | |
| Bingiriya | | 1109.74 | |
| Nikaweratiya | | 399.92 | |
| Puttalam | | | 1825.43 |
| % on Total | 9% | 59% | 32% |
| CPL Total - ha 5954.31 | | | |

**'Drought' Water Deficit :** Adversely Affects Subsequent 3 Yrs Yield. - Irrigation Expensive ROI.
Limited Perennial Ground water
**Coconut Nut :** 03 Physio. . Dev Stages... 1 Year 'Inside' Stem. 1 Year 'Out' to Flower Open.
1 Year 'Flowering' to Mature Nut

**Un-Controllable :** 'Drought' - Environment (T, RH,..), 'Diseases' MLO Phyto - plasma, 'Blocking', !!!.

**Controllable :** MULCH, DFR K>Mg>N>P Fertilizer - Husk Pits, N - Cover, Alleviate Drought (Limited Postpone), Pest & Disease Mgt (Hygienic - Biological - Chemical, Predators), Scientific CRI Recommend.

# කළමනාකරණ විමර්ශනය...

## විද්‍යානුකූල ප්‍රතිපත්ති : වැවිලි කළමනාකරණය සහ සංවර්ධනය

### පොහොර ප්‍රතිපත්තිය :

**පොල් පර්යේෂණ ආයතනය මගින් විවිධමය පොහොර නිර්දේශිත (DFR) පැකේජය**

අප සමාගම 2010 ජූනි සිට DFR පොහොර පැකේජය යෙදීම ආරම්භ කළ අතර දැනටමත් එහි සාර්ථක ප්‍රතිඵල සෞඛ්‍යය සම්පන්න හරිත පත්‍ර සහිත ගස් වලින් සහ ඉහළ අස්වැන්නෙන් පෙන්නුම් කරයි.
එසේම, පො.ප.අ. නිර්දේශවලට අනුකූලව අප සමාගම ඇමෝනියම් සල්ෆේට් (20.6% N; $[NH_4]_2SO_4$) වෙනුවට යූරියා (46% N; $CO[NH_2]_2$) භාවිතා කරන අතරම දේශීයව ලබා ගත හැකි සුදුසු සහ මිලෙන් අඩු, සමාන ප්‍රමාණවලින් ඩොලමයිට් ($MgCO_3.CaCO_3$; 20% MgO) සහ එප්පාවල රොක් පොස්ෆේට් (ERP: 30% $P_2O_5$) ඡමූලාශ්‍ර ලෙස යොදවමින්, මිලෙන් අධික, ආනයනය කරන සැෆොස් පොස්ෆේට් හෝ ට්‍රිපල් පොස්ෆේට් වෙනුවට සියලුම වැඩුණු පොල් වගාවන්ට යොදන අතර ඒ මගින් විදේශ විනිමය ඉතිරියත් සාර්ථක ප්‍රතිඵලත් ලබයි.



පත්‍ර පාංශු රසායනික පෝෂක විමර්ශනය මත පදනම් වූ පොල් පර්යේෂණ ආයතනය මගින් නිර්දේශ කර ඇති DFR පැකේජය තිරසාර ඉහළ අස්වනු හා ලාභ අත්පත් කර ගැනීමට අවශ්‍ය කරන ක්ෂේත්‍ර පෝෂණ පමණක් පොහොර ලෙස ලබා දෙන අතර, විය හැකි පෝෂක අඩුපාඩු හා වැඩිවීම් සඳහා ප්‍රතිකාරය සලසයි. තිරසාර උසස් අස්වැන්නක් ලබා දීමට හෝ ඕනෑම අයහපත් තත්වයක් (නියඟයක්) දරා ගැනීමට හැකිවීම සඳහා පොල් වගාවන්ට ප්‍රමාණවත් පෝෂක මට්ටම් ලැබිය යුතු වේ. තවද, වැඩි ලාභයක් සඳහා තිරසාර වර්ධනයක් හා ඵලදායිතාවක් සඳහා අවශ්‍ය පෝෂක පමණක් සැපයීම අත්‍යවශ්‍ය වේ. ප්‍රමාණවත් පත්‍ර පෝෂක මට්ටම් (උදා: නයිට්‍රජන් N 1.9 - 2.1%, පොස්ෆරස් P 0.11 - 0.13%, පොටෑසියම් K 1.2-1.4%, මැග්නීසියම් Mg 0.25-0.35%, ක්ලෝරීන් Cl 0.3-0.6%, සල්ෆර් S 0.15-0.20%, බෝරියම් B මිලියනයකට කොටස් 810 වැනි දෑ අඩංගුය,) සඳහා උපරිම පොල් වර්ධනය හා නිෂ්පාදනය පොල් පර්යේෂණ ආයතනය සහතික කර ඇත. එමගින් හිඟව හෝ ප්‍රමාණවත් නොවන හෝ සැපයුම අධිකව ඇති විශේෂිත පෝෂක/ය කුමක්දැයි තීරණය කිරීමට හැකියාව ඇති වේ. ඉලක්කකර ඇති අස්වැන්නකට අදාලව පෝෂකයක් වැඩි වී ඇති අවස්ථාවක, අදාළ පොහොර ප්‍රමාණය ඒ අනුව අඩු කිරීමට හෝ අත් හිටවීමට කටයුතු කෙරේ. එමෙන්ම අදාල පෝෂකය අඩු වන විට ඒ පෝෂකයේ අනුපාතය වැඩි කරන ඇත.



**හලාවත වැවිලි සමාගම - පොහොර භාවිතය**

| වර්ෂය | NPK මෙ.ටො. | ඩොලමයිට් + කීසරයිට් මෙ.ටො. | YPM සහ වෙනත් මෙ.ටො. | පොහොර එකතුව මෙ.ටො. |
|---|---|---|---|---|
| 2006 | 966 | 603 + 69 | 43 | 1'828 |
| 2007 | 1'004 | 658 + 106 | 32 | 1'891 |
| 2008 | 227 | 632 + 57 | 39 | 970 |
| 2009 | 998 | 10 + 2 | 61 | 1'116 |
| 2010 | 955 | 690 | 68 | 1,713 |
| 2011 | 1,167 | 1,005 | 347 | 2,518 |
| 2012 | 1,065 | 1,061 | 194 | 2,820 |

# කළමනාකරණ විමර්ශනය...

## වගා කිරීමේ ප්‍රතිපත්ති :

**පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශිත උසස් ජානමය පොල් පැල භාවිතා කිරීම - NPs/UPs**



පොල් ගස යනු බද්ධ පරාගන ශාකයකි. ඒ හෙයින් උසස් අස්වැන්නක් ඇති මව් ශාකයකින් ගන්නා බීජ ගෙඩියක වුවද එය අසල අඩු අස්වැන්නක් දෙන ශාකයක 'දුර්වල' පරාගනයකින් ප්‍රජනනය වී ඇත්නම් මව් ශාකයේ උසස් ජානමය විභවය නොතිබෙන්නට පුළුවන. එබැවින් පොල් පර්යේෂණාගාරයේ විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක ආධාර ඇතිව අප සමාගම විසින් පලුගස්වැව වතුයායේ තෝරා ගත් මව් ශාක සඳහා අත් පරාගන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී.

එහිදී පිරිමි කොටස් ඉවත් කළ පොල් මල් 'සැන්රාමන්' පරාග සමග පරාගනය කර ඉහළ අස්වැන්න, නියං ඔරොත්තු දෙන, වැඩි කොප්පරා සහ තෙල් ලබා දෙන වැනි ලක්‍ෂණ වලින් පිරි උසැති ඔඩීසෘ වර්ගයේ බීජ



ගෙඩි සකසා ගැනේ. තවාන් වලදී මාස 05 ක් ඇතුලත පැල නොවූ සියලු බීජ (15% ක් පමණ)ඉවත් කර පුළුස්සා දැමේ. තවද, මාස 07 ක් ගත වූ කළ මනා වර්ධනයක් හා හැකියාවක් ඇති පැල නැවත තෝරා ගැනෙන අතර එහිදි තත්වයෙන් බාල පැල ඉවත් කර (10% පමණ) පුළුස්සා දැමේ. තෝරා ගත් උසස් තත්ත්වයේ පැල ජානමය ලෙස උසස් පොල් පැල වැඩි ප්‍රමාණයක් නිපදවා ගැනීම පිණිස අදාළ කාලයේ වැඩි පොල් ඵලදායිත්වයක් හා ලාභයක් අරමුණු කර ගෙන පලුගස්වැව වත්ත තුළම පැල කරනු ලබේ.

පොල් වගාවක අඩු ගෙඩි නිෂ්පාදනයකින් පැහැදිලි වන්නේ වියපත් බව සහ නැවත වගාව තුළින් වගාව තිරිහන් කිරීම ප්‍රමාදයකින් තොරව සිදු කළ යුතු බවත්ය. එසේ නැවත වගා කිරීමේදී වයස, අස්වැන්න, උස, සෙවණ, තරගකාරිත්වය සහ අක්කරයකට ඇති ගස් ගණන ආදී කරුණු කෙරෙහි ප්‍රධාන වශයෙන් සැළකිලි මත් විය යුතුයි.

එබැවින්, වතු වල වර්තමාන පොල් ගහණය සැළකිල්ලට ගෙන හවැස කළමනාකරණය වයස පාදක කර ගෙන යටි වගා කිරීම ක්‍රියාත්මක කරන අතර වයස පමණක්ම නොව ඉහළ වියන් පරාසය, සෙවණ, භූ දර්ශනය හා පස ආදී කරණු ගැනද සැළකිල්ලක් දක්වයි.

ඒකාකාරී මේරූ පොල් වගාවක් පවත්වා ගැනීමේ අරමුණෙන් අවුරුදු 20 දක්වා දුර්වල පැල සහ ළපටි ගස් උදුරා ඒ වෙනුවට ගුණාත්මක පැල යටි වගාවක් ලෙස යොදනු ලැබේ. කෙසේ වුවද, අවුරුදු 30 වැඩි මේරූ වගා වල යටි වගාව, අඩු හිරු එළිය, ජලය සහ පෝෂක සඳහා වන තරගකාරිත්වය, ආදිය නිසා ඇතිවන පාණ්ඩුකරණය හේතුවෙන් දික්වූ කඳ සහ ගෙඩි නැති හෝ අඩු වියනත් සහිත වන බැවින් එතරම් ප්‍රතිලාභයක් ගෙන නොදේ.

**පොල් - යටි වගා සහ නැවත වගා කිරීම්**

| වර්ෂය | වගා කළ ප්‍රමාණය (අක්කර) | පොල් පැල (අංකය) |
|---|---|---|
| 2000 | 90 | 5,773 |
| 2001 | 4 | 237 |
| 2002 | 76 | 4,878 |
| 2003 | 43 | 2,766 |
| 2004 | 71 | 4,569 |
| 2005 | 134 | 8,592 |
| 2006 | 110 | 7,035 |
| 2007 | 0 | 0 |
| 2008 මැයි 31 රාජ්‍ය පාලනය | 109 | 6,946 |
| 2009 | 250 | 15,982 |
| 2010 | 276 | 17,694 |
| 2011 | 317 | 20,261 |
| 2012 | 796 | 50,970 |
| 2013 අපේක්ෂිත | 950 | 65,000 |

**හලාවත වැවිලි සමාගම - පොල් ගස් වයස විශ්ලේෂණය**

| වයස් ප්‍රභේදය | අවරුදු 50 වැඩි | අවුරුදු 20 - 49 | අවුරුදු 10 - 19 | අවුරුදු 5 - 9 |
|---|---|---|---|---|
| ගස් ගණන | 144,952 | 261,788 | 24,027 | 7,586 |
| % - එකතුව | 33% | 60% | 5% | 2% |

# කළමනාකරණ විමර්ශනය...





පොල් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දෙන කෘෂි ක්‍රමවේද වන තෙතමනය සඳහා ආවරණ බෝග, නයිට්‍රජන් ලබා දෙන ගිරිසීඩියා වැනි වගා, විශාල සමෝච්ච කාණු වල ලෙලි වැළලීම, පශු සම්පත් (එළ ගවයින්. මී ගවයින්. බැටළුවන්) මීමැසි පාලනය, අතුරු භෝග වගාව (කජු, කුරුඳු, ඩ්‍රැගන් ෆෘට්, රඹුටන්, ගම්මිරිස්, ඉඟුරු, සියඹලා සහ කෙසෙල් වැනි) අදාල සෑම පොල් වත්තකම ආරම්භ කිරීම.

**බහුවාර්ෂික සහ කෙටි කාලින අතුරු වගාවන්**

| භෝග වර්ගය | වගා ප්‍රමාණය (අක්කර) | ගස් ගණන | භෝග වර්ගය | වගා ප්‍රමාණය (අක්කර) | ගස් ගණන |
|---|---|---|---|---|---|
| බහුවාර්ෂික භෝග | | | කෙටි කාලීන භෝග | | |
| | | | | | |
| කජු | 2,020 | 59,754 | ෂැන්ඩ්‍රියානා | 0.12 | 5,000 |
| රඹුටන් | 76 | 1,250 | සියඹලා | 8 | - |
| ගම්මිරිස් | 22 | 10,349 | මඤ්ඤොක්කා | 3 | 10,500 |
| ඩ්‍රැගන් ෆෘට් | 27 | 3,750 | තල | 17 | - |
| සියඹලා | 17 | 53,700 | ඞ් | 1,228 | - |
| තේක්ක | 50 | 16,300 | | | |

අතුරු භෝග ප්‍රතිපත්තිය, කෘෂි දේශගුණික සහ භූ දර්ශනය (පස, අස්වැන්න නෙළීම, සහ පරිසර විද්‍යාව) සැළකිල්ලට ගෙන සුදුසුම අතුරු භෝග තීරණය කිරීම ද පවතින ප්‍රායෝගික ප්‍රශ්න, එනම් අලෙවිකරණය සේවක හිඟය, අස්වැන්න නෙළීම, සොරකම්, ගැන ද සලකා තිරසාර ආයෝජන ප්‍රතිලාභ ලැබෙන ආකාරයට තීරණය කළ යුතුවේ.



# කළමනාකරණ විමර්ශනය...

එසේ හෙයින්, දිවුලපිටියප්‍රදේශ වතුයාය පොල් ආශ්‍රිත වගාවන් පශු සම්පත් සහ වාර්ෂික සහ බහුවාර්ෂික අතුරු භෝග වගා සංවර්ධනය පිණිසද, පලුගස්වැව ප්‍රදේශ වතුයාය පොල් ආශ්‍රිත වගාවන් සහ පශු සම්පත් (මී ගවයින්) මගින් ලැබෙන එලදායි විභවය සැළකිල්ලට ගෙන අගය එකතු කරන්නාවූ කර්මාන්ත පිහිටු වීමටද, හලාවත, මාදම්පේ, බිංගිරිය සහ නිකවැරටිය ප්‍රදේශ වතුයාය පොල් වගාව සංවර්ධනය සහ බහුවාර්ෂික අතුරු භෝග වන සියඹලා, අඹ, කජු සහ පොහොර වැඩි කරන, නයිට්‍රජන් තිර කරන බහුකාර්ය ගස් වන ග්ලිරිසිඩියා සිටුවීම ද, අනාගත ඩෙන්ඩෝ විදුලි ජනනය සඳහා ද වෙන් කර ඇත.

තම්බපණ්ණි (පුත්තලම හා මංගලඑළිය) වතුයාය වියළි කලාප කෘෂි දේශගුණික අංක 01 හි පිහිටා ඇති බැවින් පොල් පර්යේෂණ ආයතනයේ පස් වර්ගීකරනයට අනුව ඒවා තෝරා ගෙන ඇත්තේ පොල්වගාව සහා විශාල පරිමාණ කජු හා ග්ලිරිසීඩියා වගාවටත් තම්බපණ්ණි වතුයායේ පිහිටුවීමට තීරණය කර ඇති ඩෙන්ඩ්‍රෝ විදුලි බලාගාර ව්‍යාපෘතියත්, පුත්තලම දැනටමත් පිහිටුවා ඇති ගල් අඟුරු බලාගාරයට නුදුරින් පිහිටා ඇති අතර ජාතික විදුලි ජාලයට සම්බන්ධ වීමටත් ය.

**දැව වගා කිරීම**

2010 වර්ෂයේ ආරම්භ කර අඛණ්ඩව 2012 වර්ෂයේත් විශාල පරිමාණයේ දැව වගාකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. වතුයාය සීමා වල, වැටවල් අවට, පොල් පර්යේෂණ ආයතනයේ පස් වර්ගීකරණයට අනුව පොල් වගාවට නුසුදුසු S5 සහ S6 පස ඇති ස්ථාන වල විවිධ ප්‍රතිලාභ සහ වැඩි ආදායමක් ලබා දෙන, විශේෂයෙන්ම වතුයාය තුල 'ක්ෂේම භූමි' ක්ශුද්‍ර දේශගුණික තත්වයක් ලබා දෙන, වතු සේවා නියුක්තයින්ට පළතුරු සහ දර ලබා දෙන, පරාගනය වැඩි කරන මී මැස්සන්, සමනලයින් ගේ ප්‍රවර්ධනය ට සුදුසු පරිසරයක් ඇති කිරීම වැනි ප්‍රතිලාභ ලබා දෙන දැව වර්ග වගාව කෙරී ගෙන යයි. දැනට සමාගම සතුව ඇති දැව වර්ග තේක්ක (9722), මාගෝසා (2225), කොස් (1196), කුඹුක් (356), මැහගනි (338) ටර්පන්ටයින් (319) බුරුත (89) ක් හා ග්ලිරිසිඩියා (50000) ක් ද වේ.

අවට ගම්වැසියන්ට කුඹුරු වාරික ක්‍රමයට බදු දී ඇති අතර එහි ප්‍රතිඵලය වන්නේ වතු ගම් සහ සම්බධතාවය වර්ධනය වීමයි.

## පලිබෝධ හා රෝග කළමනාකරණ ප්‍රතිපත්ති :

*Aceria Gurreronis* **Mite Management**

2010 හවැස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පලිබෝධ රෝග කළමනාකරණ ප්‍රතිපත්ති වලට අනුකූලව පොල් පර්යේෂණාගාර විද්‍යාඥයින් සමග සමීපව වැඩ කරමින් පලිබෝධ/රෝග වලට සහන ලබා ගැනීම සිදු කරන ලදී.



ලොව ප්‍රථම ඇසරියා මයිටා පාලන විලෝපිත බෝ කිරීමේ රසයනාගාරය සමාගම විසින් තම හලාවත, පරකදලුවේ, පලුගස්වැව වත්තේ දී පොල් පර්යේෂන ආයතනයේ විද්‍යඥයින් සමග ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස පිහිටුවා එය 2011 අප්‍රේල් මස 26 දින ගරු පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා විසින් විවෘත කරන ලදී.

දෙවන රසායනාගාරය ද හවැස දිවුලපිටිය, බැද්දේගම, කටුකෙන්ද වත්තේ දී 2011 නොවැම්බර් 11 විවෘත කරන ලදී. 2012 වර්ෂය වන විට රසායනාගාර දෙකම සාර්ථකව කටයුතු කරමින් ඇති අතර පොල් පර්යේෂණාගාර විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක මගපෙන්වීම යටතේ තොරාගත් සමගම් පොල් ඉඩම් වලට විලෝපිතයන් මුදා හරිමින් පවතින අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් හානි වූ ගෙඩි අඩු වීමක් පෙන්වමින් අනාගත ප්‍රතිලාභ පෙන්වා දේ.



# කළමනාකරණ විමර්ශනය...



සැළකිය යුතු හානියක් සිදු කරන ඇසරියා මයිටා පොල් ගෙඩියේ තැරිය කොටසේ සිට සාරය උරා බොන බැවින් කුඩා ප්‍රමාණයේ ගෙඩි, විරූපතාවය ඇතිවීම සහ පිට පොත්ත වියළීම සමග ඉරිතැලීයාම් සහිතව පුල්ළි මතුවීම දක්නට ලැබේ. පියවි ඇසටනොපෙනෙන ඇසරියා මයිටා,දිගින් මයික්‍රෝන 205 ත් 255 පමණද පළලින් මයික්‍රෝන 36 ත් 52 ක් පමණ වන අතර ගෙඩියේ තැරිය ඇතුළත ජීවත් වේ.

පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් විසින් සිදු කරන ලද වසර ගණනක ඒකාබද්ධ සහ දැඩි පර්යේෂනවලින් අනතුරුව ඇසරියා පොල් මයිටා මත යැපෙන නියෝසෙයිලුස් බරකි ඇසරියා මයිටා පාලනය කිරීම සඳහා, ඇසරියා මයිටා හා විලෝපිත නියෝසෙයිලුස් බරකි අතර ස්වාභාවික සමබරතාවයක් ඇති කළ යුත වේ. එහෙයින් විලෝපිත මයිටා ප්‍රමාණය වැඩිකරලීම සඳහා හානියට ලක්වී ඇති පොල් වගාවලට දෙමසකට වරක් මුදා හැරීම සඳහා රසායනාගාරවල විලෝපිතයන් විශාල ප්‍රමාණයක් බෝ කිරීම සාර්ථක ක්‍රමවේදයක් ලෙස හඳුනා ගෙන ඇත.

## අගය එකතු කීරීමේ කර්මාන්ත සහ නව නිපැයුම් ප්‍රතිපත්ති :

අප සමාගමේ නව නිපයුම් ප්‍රතිපත්ති,පොල් සහ අතුරු භෝග ආශ්‍රිත, අගය එකතුකළනිෂ්පාදිත භාණ්ඩ කෙරෙහි යොමු වී ඇතත් වෙළඳපොළ තත්වය, ආයෝජනයට ප්‍රතිලාභය, අවදානම් විමර්ශනය හා තිබෙන්නාවූ මානවසම්පත් මත රඳා පවතී. 2012 වර්ෂයේදී ද මී කිරි සහ යෝගට්, කජු, කොප්පරා, කොහු ආදී කර්මාන්තද අඛණ්ඩව සිදු කරන ලදී.

2012 වර්ෂයේදී, අප සමාගමේ පලුගස්වැව වත්තේ හොඳම කොප්පරා යොදා ගනිමින් පොල් තෙල් නිෂ්පාදනයට අවතීර්ණ විය. සමාගම ඉදිකළ යන්ත්‍ර මගින් දැනට මෙම ක්‍රියාවලිය අත්හදා බැලීම් මට්ටමේ පවතී. අපගේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකිකයින්ගේ සෞඛ්‍ය තත්වය වර්ධනය කරන, ගුණාත්මක තත්ත්වයෙන් පිරිසිදු තෙල් දැරිය හැකි මුදලකට ලබා දීමයි.

එම ක්‍රියාවලියේදී දැනට වෙළඳපොළේ තිබෙන බොහෝ පොල් තෙල් නිපදවන රසායනිකව පිරිපහදු සුදු කළ දුගඳ ඉවත් කළ (RBD) ක්‍රම වලින් නිපදවූ තෙල් වලට විකල්ප වශයෙනි. මෙම තෙල් බොහෝ විට මිල ගණන් අවම කිරීම පිණිස ආනයනය කළ එළවළු තෙල් සමග මිශ්‍ර කරන බැවින් තාපාංකය ඉහළ යෑමත් (මුළුතැන් ගෙයි අත්විඳින පපඩම් පිපෙන්නේ නැති තත්වය), අපේ මුළුතැන්ගෙවල නිතර සිදුවන දෙතුන්වර බැදීමේදී අසන්තෘප්ත මේද හේතුවෙන් එකතු වන නිදහස් ද්‍රව්‍ය නිසා මතු වන විවිධ සෞඛ්‍ය ගැටලු වලට පිළියමක් වශයෙනුත් ය.

සියලුම වතු වල පොල් කැඩීමේදී ඇතිවන සේවක හිඟයට පිළියමක් වශයෙන් සමාගම තරුණ පරම්පරා අතර ඇති විරැකියාව, අමතර ආදායමක් ඉපදවීමේ ක්‍රමයක් ලෙස, අර්ධකාලීන රැකියාවක් ලෙස හෝ විනෝදාංශයක් වශයෙන් 'පොල්ගස් නගිනය', දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙස එළි දක්වන ලදී.

නවීකරණය කළ පොල් ගස් නගින ක්‍රමවේදය පොල් පර්යේෂණ ආයතනය විසින් අතීත ඉන්දියානු ක්‍රමයකට අනුව සකස් කරන ලද අතර (CRI: 1995 - 1996) පසුකාලීනව පොල් සංවර්ධන මණ්ඩලය (CCB : 1995 - 2001) මගින් දැනුවත් කිරීමේ වැඩසටහක් වශයෙන් ද වෘත්තිය පුහුණු අධිකාරිය මගින් පුහුණු පාඨ මලා ලෙස ද පවත්වන ලදී.

(පළමු පාඨමාලාව 1996 මැයි 12 සිට 16 දක්වා වැලිගමදී පවත්වන ලදී)



# කළමනාකරණ විමර්ශනය...

## මානව සම්පත් ප්‍රවර්ධනය ප්‍රතිපත්ති :

අගය එකතු කළ උසස් කෘෂිකාර්මික නිෂ්පාදන හා තිරසාර ලාභ අත්කර ගැනීම සඳහා අදාල වැවිලි කළමනාකරණයේ හා සංවර්ධනයේ නිරත අප සමාගමේ මානව සම්පත වටිනාම සම්පත හා වත්කම ලෙස සමාගම සලකනු ලැබේ. වතු අධිකාරිවරු, සහකාර වතු අධිකාරිවරු, ක්ෂේත්‍ර නිලධාරීන්, වතු ලිපිකරු සහ සහය සේවා කාර්ය මණ්ඩල, මුරකරුවන්, කම්කරුවන් ඇතුළු සෑම මට්ටමකම සේවානියුක්තියන්ට අවශ්‍ය දැනුම සහ හැකියා සංවර්ධන පුහුණු වැඩසටහන් සහ වැඩ මුළු පවත්වා ඇති අතර වතු වල පදිංචි වීම සඳහා සියලු යටිතල පහසුකම් වලින් සමන්විත ක්ෂේත්‍ර බංගලා සහ නිල නිවාස ලබා දී ඇත.

## 31/05/2012 - CPL ප්‍රධාන කාර්යාලයේදී
### ප්‍රගති සමාලෝචන පද්ධතියට දත්ත කැවීම පුහුණු වෙමින්





ප්‍රතිපත්තිමය වශයෙන් පුද්ගල අවංකභාවය, ඒකාග්‍රතාවය, අගයන් සහ සාරධර්ම, චරිතය ආදියද, වෘත්තිමය වශයෙන් ධනාත්මක ආකල්ප, දැනුම, බුද්ධිය,හැකියාව , කුසලතා, ඉගෙනීමේ මානසිකත්වය කණ්ඩායම් ක්‍රියාකරිකම්, බැඳීම්, කැපවීම් සහ වගකීම් පිළිබඳ සමාගම විසින් තම සේවානියුක්තියන්ට අවධාරණය කර ඇත.,

අදාල වතුයායේ ලාභය අනුව එහි කාර්යයේ නියුතු සේවානියුක්තිකයන්ට සියයට දහයක ලාභ ප්‍රමාණයක් සෑම දෙනා අතර සම සමව බෙදී යන සේ නොවැම්බර් මස දීපාවලී උත්සවට පෙර සහ දිරිදීමනා පැකේජයක් දෙසැම්බර් මස නත්තල් උත්සවයට පෙරද ලබා දුනි.

ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර සහ අමාත්‍යංශ ලේකම් නිහාල් සෝමවීර මහතුන්ගේ ප්‍රධානත්වයෙන් දෙසැම්බර් මස 06 දින "සිටි විලව් හෝටලයේ" පැවති උත්සවයේදී දිරිදීමනා චෙක් පත් ප්‍රදානය කෙරුණි.



## 06/12/2012 - විලව් සිටි හෝටලයේ දී පැවති
### සේවාදායක කාර්යඵල ඇගයුම හා සුහද හමුව - 2012







# අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව ද විගණනය කරන ලද විගණන වාර්තාව සමග සංසන්දනාත්මක ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

## සාරාංශගත ඒකාබද්ධ මූල්‍ය දර්ශක :

| | 31.12.2012 න් අවසන් වසර සඳහා (රු.) | 31.12.2011 න් අවසන් වසර සඳහා (රු.) |
|---|---|---|
| **පොල් නිෂ්පාදනය (ගෙඩි)** | 15,807,753 | 14,527,770 |
| | | |
| අයභාරය | 339,050,649 | 322,908,950 |
| අලෙවි වියදම් | (215,317,782) | (159,680,875) |
| **දළ ලාභය** | 123,732,868 | 163,228,075 |
| | | |
| වෙනත් මෙහෙයුම් ආදායම සහ ඉපයීම් | 56,977,730 | 30,418,505 |
| පරිපාලන වියදම් | (94,649,771) | (92,453,554) |
| වෙනත් මෙහෙයුම් වියදම්* | (12,315,133) | (15,351,844) |
| **මෙහෙයුම් වලින් ලාභය** | 73,745,695 | 85,841,182 |
| | | |
| මූල්‍ය අදායම් | 37,463,655 | 33,128,217 |
| මූල්‍ය වියදම් | (24,984,006) | (23,198,183) |
| | | |
| **බදුපෙර ලාභය** | 86,225,344 | 95,771,216 |
| බදු වියදම් | (8,250,457) | (18,101,554) |
| | | |
| වසරේ ශුද්ධ ලාභය/(ශුද්ධ පාඩුව) | 77,974,847 | 77,669,662 |
| | | |
| මූලික කොටසක ඉපයීම් | 3.90 | 3.88 |
| | | |
| | | |
| කොටස් ප්‍රාග්ධනය | 200,000,010 | 200,000,010 |

| *වෙනත් මෙහෙයුම් වියදම් පිලිබඳ විස්තරය | 2012 (රු.මිලියන) | 2011(රු.මිලියන) |
|---|---|---|
| Aceria Mite කලමනාකරණ විද්‍යාගාරය (CPL, CRI ඒකාබද්ධ දැයට කිරුළ විද්‍යාගාරය) | 1.1 | 0.4 |
| ජාතික මට්ටමේ පොල් සංවර්ධන වැඩසටහන | 2.9 | 5.1 |
| බොල්ණය (වයඹ වැවිලි සමාගම) | 2.1 | - |
| 10% සේවක ලාභාංශ වෙන්කිරීම (RPC ගිවිසුම) | 4.7 | 7.6 |
| පෙර වර්ෂ ගැලපුම (හිඟ සහ පාරිතෝෂිත ගෙවීම්) | 1.4 | 1.9 |
| **එකතුව** | 12 | 15 |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව...

## ප්‍රධාන ක්‍රියාකාරකම්

පොල් සහ වෙනත් කෘෂි භෝග සහ පශු සම්පත්වගාකිරීම, නිෂ්පාදනය, පිළිසකර කිරීම, අලෙවිකරණය සහ භෝග නොවන මූලාශ්‍ර විවිධාංගීකරණය.

## අඛණ්ඩ පැවැත්ම

සමාගමේ ක්‍රියාකාරකම් ඉදිරියට චිරස්ථිතව ගෙනයාම සඳහා අවශ්‍ය තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්ව ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව" යන සංකල්පය මත සකසා ඇත.

වර්ෂය තුළ සමාගමට සේවය කළ අධ්‍යක්ෂවරුන් මෙහි පහත දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ සංක්ෂිප්ත විස්තරයක් පෙර පිටුවල සඳහන් විය.

## අධ්‍යක්ෂ මණ්ඩලය

පසුගිය වර්ෂය තුල ආයතනයෙහි අධ්‍යක්ෂමණ්ඩලය සංක්ෂිප්ත ව පහත පරිදි වේ. මේ පිළිබඳ පූර්ණ විස්තර අධ්‍යක්ෂ මණ්ඩලය ශීර්ෂය යටතේ මෙයට ඉහත දක්වා ඇත.

**ආචාර්ය සුනිල් ජයසේකර**
සභාපති/ප්‍ර.වි.නිළධාරී සහ සාමාජික
**ඒ. එම්. චන්ද්‍රපාල මහතා**
විධායක අධ්‍යක්ෂ සහ සාමාජික
**කේ. ඒ. ශාන්ත ආර්.ඩයස් මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ සහ සාමාජික
**ප්‍රියංගනි ලියනගේ මහත්මිය**
මහා භාණ්ඩාගාර නියෝජිත සහ සාමාජික
**එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා** සාමාජික
**අයි. එම්. ආර්. විදානගමගේ මහතා** සාමාජික
**ඩී. ඒ. ඩී. රුවන් දනන්සූරිය මහතා** සාමාජික
**එම්. එස්. එම්. සකුල්ලා මහතා** සාමාජික

## විගණන කමිටුව

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුව නියෝජනය කළ අතර වසර තුළ ඇගයීම් 06 ක් සිදු කරන ලදී.

**ප්‍රියංගනි ලියනගේ මහත්මිය** සභාපති
**ඒ.එම්,චන්ද්‍රපාල මහතා** සාමාජික
**අයි.එම්.ආර්.විදානගමගේ මහතා** සාමාජික
**ඩී.ඒ.ඩී. රුවන් දනන්සූරිය මහතා** සාමාජික

## මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තා

නිත්‍යානුකූලව විගණකවරුන්ගේ වාර්තාව සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කොට අත්සන් තැබූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන මේ සමග අමුණා ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේදි යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ සමග අමුණා ඇති අතර පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී කිසි වෙනසක් සිදු කර නොමැත.

## ප්‍රගති විමර්ෂණ

වර්ෂය තුල සමාගමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සභාපතිතුමාගේ හා කළමනාකරණ විමර්ශන හි අඩංගුවේ.

## අයභාරය

වසර තුල සමාගමේ අයභාරය රුපියල් මිලියන 339 ක් වු අතර විස්තර විගණන මූල්‍ය ප්‍රකාශන වල දැක්වේ.

## මූල්‍ය ප්‍රතිඵල සහ විසර්ජනය

සමාගමේ බදු පසු ලාභය රු. මිලියන 77.9 කි. (2011 දී රු. මිලියන 77.6) විගණන මූල්‍ය ප්‍රකාශනයේ විස්තර දක්වා ඇත. මුළු ලාභාංශ රුපියල් මිලියන 30 ක්වන සේ එක් කොටකට රුපියල් එකයි ශත පනහක ලාභාංශ සමාගමේ එකම කොටස්කරු වන මහා භාණ්ඩාගාරයට ගෙවීමට ප්‍රථම හා අවසන් තීරණය ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කරනු ලබයි. (2011 දී එක් කොටසකට රුපියල් තුනයි ශත හැත්තෑපහ බැගින් මහ භාණ්ඩාගාරයට රුපියල් මිලියන 75 ක් ගෙවන ලදී.)

## ප්‍රාග්ධනය හා ස්ථාවර වත්කම්

2012 වර්ෂයේදී සමාගම රුපියල් මිලියන 72 ක් (2011 : රු.මි. 101 ක්) ස්ථාවර වත්කම් වෙනුවෙන් ආයෝජනය කරන ලදී. ඉන් රු.මි. 64 ක් නොමේරු වගාව වෙනුවෙන්ද රු.මි. 8 ක් පිරියත සහ යටිතල පහසුකම් වෙනුවෙන්ද විය.

(2011 : රු.මි. 60) 2012 ශේෂපත්‍රට අනුව අවසන් වන දින දෙසැම්බර් 31 වැනි දිනට ජංගම නොවන වත්කම් (දේපල, වගා, සහ පිරියත)වල පොත් අගය රුපියල් මිලියන 602 කි. විස්තර විගණන මූල්‍ය වාර්තාවේ දක්වා ඇත. (2011 එය රු.මි. 560 කි)

## කෙටි කාලීන ආයෝජන

වර්ෂ 2011 රු. මි. 245 ට සාපේක්ෂව වර්ෂ 2012 සමාගමේ කෙටිකාලීන ආයෝජනය රු. මි. 199ක් විය. එසේ අඩුවීමට හේතුව නව වගාවලට සහ ජංගම නොවන වත්කම් වලට කළ ප්‍රාග්ධන ආයෝජන ඇතුළුව මහා භාණ්ඩාගාරයට ගෙවූ රු.මි. 75 ක ලාභාංශයි.

## සංචිත

සමාගමේ ඇති සම්පූර්ණ සංචිත රඳවා ගත් ලාභයෙන් දැක්වේ. එය 2012 දෙසැම්බර් 31 වැනි දිනට රු. මිලියන 587 ක් වන අතර ඊට සාපේක්ෂව 2011 දී රු. මිලියන 584 ක් විය.

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව...

## කොටස් ප්‍රාග්ධනය

බලයලත් ප්‍රාග්ධනය සහ සම අගය සංකල්පය 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ බල රහිත කරන ලදී. 2012 දෙසැම්බර් මස 31 වැන දිනට සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනය රුපියල් 200,000,010 ක් විය.

සමාන්‍ය කොටස් 20,000,000 කින් සහ එක් ස්වර්ණමය කොටසකින් සමන්විතවිය. කිසිදු ආකාරයකක කොටස් නිකුත් කිරීමක් 2012 වසර තුළ සිදු කර නැත.

## වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්

අනිශ්චිත වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් විගණන වාර්තාවේ සටහන් වල අන්තර්ගත කර ඇත.

## මූල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනයේ සිට මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාව දක්වා ගිණුම් ප්‍රකාශන සංශෝධනය කිරීමට හෝ එසේ නැතහොත් ඒ තුල ගැලපීම් හෝ අනාවරණය කිරීමට හෝ අවශ්‍ය තරම් ප්‍රමාණවත් සිද්ධි සිදු වී නොමැත.

## ගිවිසුම් සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සමාගමේ ගිවිසුම් සම්බන්ධව සෘජුව හෝ වක්‍රව අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුවක් නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්

කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ ඔහුගේ/ඇයගේ කාලයාත්‍රිකයෙකු සමාගමේ කොටස් හිමිකම් දරන්නේ නැත.

## සේවානියුක්තිය

සමාගමේ තිරසාර උන්නතිය සඳහා, රජයේ නීති වලට අනුකූලව, සේවා සැපයීම, පුහුණුව, උසස්වීම්, විනයානුකූල තීරණ ආදී කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට එක හා සමානව සලකනු ලබයි. එසේම, සමාගම සම තත්ව පදනම මූලික කර ගනිමින් සෑම සේවානියුක්තිකයකුට, ලිංග බේදය, ජාති බේදය, ආගම, විවාහක තත්ත්වය, දේශපාලන පසුබිම හෝ කායික දුබලතාවන් නොසලකා සම අවස්ථාවන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

## ව්‍යවස්ථාපිත දීමනා

සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු සහ සමාගමේ සේවා නියුක්තියන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ඇතිකර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

## විගණකවරු

2012 වසර සඳහා වූ ගිණුම් අයියර් සහ සමාගම (වරලත් ගණකාධිකාරීවරු) විසින් විගණනය කරන ලදී.

## වාර්ෂික වාර්තාව

මූල්‍ය වාර්තා 2012 මැයි මස 03 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## වාර්ෂික මහා සභා රැස්වීම

හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2013 ජූනි මස 27 වන බ්‍රහස්පතින්දා, පස්වරු 2,30 ට, අංක 23, පළවෙනි මහල, CDA ගොඩනැගිල්ල, කොළඹ 01 ස්ථානයේ පැවැත්වීමට නියමිතය,

මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය මේ සමග අමුණා ඇත.

මෙම වාර්තාව හලාවත වැවිලි සමගාමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

.........................................
ආචාර්ය සුනිල් ජයසේකර
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

.........................................
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම
ලේකම්වරු හලාවත වැවිලි සමාගම
05 ජූනි 2013
කොළඹ.

# මූල්‍ය සමාලෝචනය

වාර්ෂික වාර්තාවේ කොටසක් වන මූල්‍ය ප්‍රකාශනය,සමාගමේ මූල්‍ය ප්‍රගතිය සහ මූල්‍ය තත්වය පිළිබිඹු කරයි.මූල්‍ය සමාලෝචනය සමගමේ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ දල විශ්ලේෂණයක් සාකච්ඡා කරයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මූල්‍ය වාර්තාකරණය පිළිබඳ නව ගිණුම්කරණ ප්‍රමිතීන් සකසා ඇත. එම ප්‍රමිතින් 2012 ජනවාරි 01 සිට හෝ ඉන් පසු සිට ක්‍රියාත්මක වේ. මෙම නව ප්‍රමිති භාවිතයේදී පැවතුන ප්‍රමිතියත් අතර සැලකියයුතු වෙනසක් ඇති වෙනු ඇත. 2012 වර්ෂ අවසානයේ සමාග මේ මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය හඳුන්වා දුන් නව ගිනුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවයි.

**මෙහෙයුම් ප්‍රතිඵල**

| | 2012 | 2011 | Difference |
|---|---|---|---|
| පොල් ගෙඩි මිලියන) | 15.8 | 14.5 | 1.3 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍ය (NSA) (ගෙඩියට/රු.) | 21/= | 25/= | (4/=) |
| අයභාරය රු: මිලියන (පෙර ගිණුම්කරණප්‍රමිති අනුව) | 330 | 368 | 38 |
| අවසන් තොග ගැලපුම (නව SLFRS ප්‍රමිති අනුකූලව) (රු මිලියන) (සටහන 4, - E සහ F) | 9 | (45) | |
| අයභාරය (විගණනය කරන ලද ගිනුම් වලට අනුව) | 339 | 323 | 16 |
| නිෂ්පාදන පිරිවැය (රු. මිලියන) (පෙර ගිණුම්කරණ ප්‍රමිති අනුව) | 206 | 205 | 1 |
| අවසන් තොග ගැලපුම (නව SLFRS ප්‍රමිති අනුකූලව) (සටහන 4, - E සහ F) | 9 | ( 45) | |
| අලෙවිවියදම (රු මිලියන) | 215 | 160 | 55 |
| දල ලාභය (රු මිලියන) | 124 | 163 | (39) |
| ශුද්ධ ලාභය (බදු පසු) (රු මිලියන) | 77.9 | 77.6 | 0.3 |

## අයභාරය

සමාලෝචනය වන වර්ෂය තුළසමාගම රුපියල් මිලියන 339 ක පිරිවැටුමක් ලැබීය. එය පසුගිය වසරේ පිරිවැටුම වන රුපියල් මිලියන 323 හා සංසන්දනය කිරීමේදී රුපියල් මිලියන 16 ක වර්ධනයකි. පොල් නිෂ්පාදනය පසුගිය වසරට සාපේක්ෂව 9%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

2012 දී නෙළු අස්වැන්න ගෙඩි 15,807,753 ක් වන අතර 2011 දී එය 14,527,770 ක් වුවද ශුද්ධ අලෙවි මිල සාමාන්‍ය ගෙඩි 1000 ක් සඳහා 2011 දී රු: 25,331/- සිට 2012 රු: 20,906/- දක්වා පහත වැටිණි.



# මූල්‍ය සමාලෝචනය...

## නිෂ්පාදන වියදම්

2011 දී රුපියල් මිලියන 205 ක්ව පැවති නිෂ්පාදන වියදම 2012 දී රුපියල් මිලියනකින් වැඩිවී රුපියල් මිලියන 206 දක්වා ඉහළ ගියේය. නියඟය නිසා එලදාව අඩුවීමත් ගස් මැරියාමත් ආදිය සැලකීමට ගෙන කළමනාකරණය වියදම් කපා හැරීමට පියවර ගන්නා ලදී.

## පරිපාලන වියදම්

සේවා වියදම් සහ කාර්ය මණ්ඩල වියදම් ඉහළ යාම හේතුකොට ගෙන 2011 දී මිලියක 92 ක්ව තිබූ පරිපාලන වියදම් රුපියල් මිලියන 94 ක දක්වා ඉහළ ගොස් ඇත.

## වෙනත් මෙහෙයුම් ආදායම්

සමාගම රුපියල් මිලියන 57 ක් අමතර ආදායමක් වෙනත් මෙහෙයුම්, එනම් කප්‍රු, මැරී ගිය පොල් ගස්, දැව, කුඹුරු බද්දට දීම්, පැරණි වාහන අලෙවියෙන් ආදියෙන් උපයා ගත් අතර එම ආදායම 2011ට සාපේක්ෂව 90% ක වර්ධනයකි.වෙනත් මෙහෙයුම් ආදායම සවිස්තරාත්මකව මූල්‍ය වාර්තාවේ 24 වැනි සටහනේ දැක්වේ.

මූල්‍ය ආදායම් මගින් කෙටි කාලීන ස්ථාවර තැන්පතු වලින් ලද ආදායම පෙන්නුම් කරයි. පසුගිය වසරේ මිලියන 33 ක් වූ එම ආදායම 2012 දී මිලියන 37 දක්වා වැඩිකරමින් 11% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

## ශුද්ධ ලාභය

පසුගිය වසරේ උපයාගත් ශුද්ධ ලාභය වන රුපියල් මිලියන 77.6 ට සාපේක්ෂව මෙම වසරේදී රු. මිලියන 77.9 ක් උපයාගෙන ඇත. පසුගිය වසරේ පොල් ගෙඩියක සාමාන්‍ය විකුණුම් මිල වන රු. 25 ට සාපේක්ෂව මෙම වසරේ සමාන්‍ය විකුණුම් මිල වන රු. 21 වැනි අඩු මිලක් යටතේ මෙම ලාභය උපයාගෙන ඇත.




## මහා භාණ්ඩාගාරයට දුන් ලාභාංශ

බොහෝ රාජ්‍ය ආයතන මහා භාණ්ඩාගාරයේ අරමුදල් මත යැපෙන අතර 2008 මැයි මස රජයට පවරා ගැනීමෙන් පසු හලාවත වැවිලි සමාගම රුපියල් මිලියන 180 ක් එහි ස්වර්ණමය කොටස් හිමිකරු/මහා භාණ්ඩාගාරයට ලාභාංශ වශයෙන් ගෙවා ඇත. 2012 වසර අවසන් වන විට මහ භාණ්ඩාගාරයට ගෙවා ඇති මුළු ලාභාංශ රුපියල් මිලියන 341.6 ක්වේ.

**මහා භාණ්ඩාගාරයට දුන් ලාභාංශ**

| වර්ෂය | 1995 | 2002 | 2005 | 2009 | 2011 | 2012 | Total |
|---|---|---|---|---|---|---|---|
| ලාභාංශ රු. මිලියන | 11.6 | 100 | 50 | 30 | 75 | 75 | 341.6 |

# මූල්‍ය සමාලෝචනය...

## මානව සම්පත් සේවා දායකත්වය ඇගයීම

වටිනාම සම්පත මානව සම්පත බව අවබෝධ කර ගෙන ඇති සමාගම අභිප්‍රේරණයේ උත්තේජකයක් වශයෙන් 2012 වසරේ සේවක කාර්ය සාධන දිරි දීමනා ලෙස රුපියල් මිලියන 13 ක් ගෙවා ඇත. පසුගිය වසරේ දිරිදීමනාව රුපියල් මිලියන 13 ක් විය. මීට අමතරව, හලාවත වැවිලි සමාගම ඇතුළුව, 1992 පළාත් වැවිලි සමාගම් පිහිටුවේමේ ගිවිසුමේ එකගවූ පරිදි සේවානියුක්තියන්ට ලාභයෙන් 10% ක කොටසක් බෙදා දීම වශයෙන් රුපියල් මිලියන 4.6 ක් 2012 වර්ෂයේද වැය කර ඇත.

## යටි වගා හා අලුත් වගා සඳහා ප්‍රාග්ධන ආයෝජන

පොල් යටි වගාවන්, අලුත් වගාවන් සහ නොමේරූ වගාවන් විද්‍යාත්මකව කළමනාකරණය පිණිස සමාගම 2011 වර්ෂයේ වැය කළ රුපියල් මිලියන 41 ට සාපේක්ෂව 2012 වර්ෂයේදී කළ ආයෝජනය රුපියල් මිලියන 61 දක්වා වැඩි විය. එය අක්කර 2189 ක ඇති නොමේරූ වගාවන්, නව වගාවන්, යටි වගාවන්, වෙනුවෙන් කළ ආයෝජනය වේ. හලාවත වැවිලි සමාගම තවත් රුපියල් මිලියන 3 ක් වෙනත් බහුවාර්ෂික බෝග සඳහා 2012 දී ආයොජනය කරන ලදී.




## මූල්‍ය ප්‍රවාහය

මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනනය කළශුද්ධ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 81 කින් වැඩි විය. එය 2011 දී රුපියල් මිලියන 12 ක්ව පැවති අතර 2012 වර්ෂය රුපියල් මිලියන 93 දක්වා වැඩි වූ අතර සමාලෝචනයට භාජනය වන වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ, එනම් ලංකා බැංකු, මහජන බැංකු, භාණ්ඩාගාර බිල් පත්, ස්ථාවර තැම්පත් සහ අතැති මුදල් වශයෙන් රුපියල් මිලියන 204 ක් විය.

## කොටසකට ඉපයීම්

2012 වර්ෂයේ කොටසකට ඉපයීම් රු: 3.90 ක් විය, 2011 වර්ෂයේදී කොටසකට ඉපයීම් රු:3.88 කි.




## ජංගම අනුපාතය

2010 වර්ෂයෙන් පසු ජංගම වගකීම් හා ජංගම වත්කම් අතර අනුපාතයේ ඉහළ යාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි. 2012 අනුපාතය 7.5 ක් වීම කෙටිකාලීන ද්‍රවශීලතාවට මුහුණදීමට සමාගමට අතිශයෙන්ම ප්‍රමාණවත් වේ.

# ආයතනික පාලන ප්‍රකාශනය

හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියා කරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා හේතු වී ඇත.

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන්, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා වගකිවයුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

## වගකීම

මූලික ප්‍රතිපත්තීන් හා උපායශිලී අරමුණු සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සඳහාද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

## සංයුතිය

සභාපති සහ විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය 2012 වර්ෂයේ අධ්‍යක්ෂවරුන් අටදෙනෙකුගෙන් යුක්ත වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2012 වසර මුලදී සම්පාදනය කළ වාර්ෂික සිද්ධි කාලරාමුවට අනුකූලව මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියලු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා මූලධන වියදම් විමසීමට ලක් කිරීම මෙම රැස්වීමේදී සිදු වේ.

සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

## විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ඇතුලු අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් යුක්තය. මහා භාණ්ඩාගාර නියෝජිතවරිය සහ විධායක නොවන අධ්‍යක්ෂවරිය වන ප්‍රියංගනි ලියනගේ මහත්මිය විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුල ඇගයීම් 06 ක් සිදු කර ඇත.

කාර්තු පදනම මත රැස්වීම් සැලසුම් කර ඇත. සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි, අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි ආරාධිත අවස්ථා වලදී මෙම කමිටු රැස්වීම් වලට සහභාගී වේ.

## නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංගමික සංස්ථාපත්‍රය, සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබයි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වගකීම පිලිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන පනත යටතේ සමාගමේ මූල්‍ය වාර්තාකරනය පිළිබඳව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම වගකීම තහවුරු කරයි. සමාගමේ විගණකවරුන් වන අයියර් සහ සමාගම ඔවුන්ගේ වගකීම් පිළිබඳව සිය වර්තාවේ සංක්ෂිප්තව දක්වා ඇත.

මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ගිණුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු එමගින් දක්වා ඇත. සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති බවටත්, එම ක්‍රමවේදයන් සහ ගිණුම් ප්‍රමිතිකරණයන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී නිරතුරුවම භාවිතා කළබවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙම ප්‍රමිතීන්ට වෙනස් වන අවස්ථා ඇතොත්, ඒවා නිසියාකාරව පෙන්වා දී ඇති අතර ඊට හේතු දක්වා ඇත. යථාර්ථවාදී අන්දමින් හා සාධාරණ ලෙස සියලුම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කටයුතු කර ඇති බවත් සනාථ කෙරේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගත් තීරණ හා ඇස්තමේන්තු නිවැරදි හා සත්‍ය ඒවා බවටද වන වගකීම අධ්‍යක්ෂවරු පිළිගනී. සමාගම තම මූල්‍ය තත්ත්වය හා නිරවද්‍යතාව පෙන්නුම් කරවන ගිණුම් වාර්තා නිසි ලෙස පවත්වාගෙන යාමටද අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන මගින්සමාගමේ එදිනෙදා කර්යයන්සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටී.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව සම්පූර්ණ වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ද්‍රව්‍යාත්මක අවප්‍රකාශ හා වංචා සම්පූර්ණයෙන් වළක්වාලන අභ්‍යන්තර ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ක්‍රියාත්මක අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මගින් වියහැකි ද්‍රව්‍යාත්මක අවප්‍රකාශ හා වංචා වළක්වා හෝ සාධාරණ කාලයක් තුළ දැන ගැනීමට හැකි වන පරිදි සියලුම වත්කම් ආරක්‍ෂා කරලීමටත් ගනුදෙනු නිසිලෙස සිදුකර දැක්වීමට හැකිවන පරිදි සකසා ඇති බව සනාථ කරයි. ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මූල්‍ය ප්‍රකාශන සැකසීමේදි අඛණ්ඩ පදනම නොවෙනස්ව අනුගමනය කරනු ඇත.

සමාගමේ විගණකවරුන් වන වරලත් ගණකාධිකරුවන් වන අය්යර් සහ සමාගමට ඔවුන්ගේ වගකීම් ඉෂ්ට කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත.
විගණකරුවන් විසින් සියලුම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තා හා අදාළ දත්ත පරීක්ෂාකර ඔවුන්ගේ නිදහස් අදහස් පල කර ඇති අතර, එම වාර්තාවද මෙහි අඩංගු කර ඇත.

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු හා සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂමණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්(පුද්) සමාගම
ලේකම්වරු - හලාවත වැවිලි සමාගම
05 ජූනි 2013

AIYAR & CO.
Chartered Accountants

"Charter House"
3rd Floor,
No. 65/2, Sir Chittampalam A. Gardiner Mawatha,
Colombo 02, Sri Lanka.

**P.O.Box** : 1029
**Telephone** : +94-11-2423725 - 26
**Telefax** : +94-11-2423727
**E-mail** : aiyar@slt.lk

## ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

**සීමාසහිත හලාවත වැවිලි සමාගමේ සාමාජිකයින් වෙත,**

මේ සමග ඇති සීමාසහිත හලාවත වැවිලි සමාගමේ මුල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලද අතර, 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව විස්තරය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් සහ විස්තරාත්මක සටහන් වලින්ද මුල්‍ය ප්‍රකාශය සමන්විත වේ.

**මුල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මුල්‍ය ප්‍රකාශන සකස් කොට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාරිත්වය වගකීම දරුනු ලැබේ. එසේම ප්‍රමාණාත්මක වරදවා දක්වීම් වලින් නිදහස්ව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලනයන් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරාගෙන ඒවා ක්‍රියාවට නැංවීමත් වාතාවරණයට සුදුසු වගකිව යුතු ගිණුම් තක්සේරු සිදු කිරීම කෙරෙහිද කළමනාකාරිත්වය වගකීම දරයි.

**විගණනකරුවන්ගේ වගකීම**

අපගේ වගකීම වනුයේ අපගේ විගණන කටයුතු පාදක කරගෙන මෙම මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණන කාර්යන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පවත්වන ලදී. මෙම ප්‍රමිතීන්වල අවශ්‍යතාවය වනුයේ විගණනය නිසි පරිදි සැලසුම් හා ක්‍රියාත්මක කර මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක වැරදි දැක්වීම්වලින් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීමය.

මුල්‍ය ප්‍රකාශනයේ දත්ත සහ අනාවරණය කිරීම් සාධක සමග නියැදි පදනම මත පරීක්ෂා කර බැලීම අපගේ විගණන ක්‍රියාවලියට ඇතුලත් වේ. සමස්ථ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය සකස් ලද වැදගත් ඇස්තමේන්තු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති තක්සේරු කිරීම සහ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීම විගණනයට ඇතුලත් වේ.

අපගේ විගණනය සඳහා අපගේ ප්‍රශස්ථ දැනුම සහ විශ්වාසය පරිදි අවශ්‍ය වූ තොරතුරු සහ විස්තාවරණයන් අප ලබා ගෙන තිබේ. එම නිසා අපගේ නිගමනයන්ට අනුව විගණනය කිරීම් තුළින් සාධාරණ මතයක් ප්‍රකාශ වන බව අපගේ විශ්වසයයි.

**නිගමනය**

අපගේ නිරීක්ෂණය වලින් අනාවරණය වන පරිදි 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මෙම සමාගම නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ඇති බව අපගේ මතයයි. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගමේ ක්‍රියාකාරි කටයුතු පිලිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් මුල්‍ය ප්‍රකාශයන් තුළින් පෙන්නුම් කරන අතර එකී කටයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකර ඇත.

**අනෙකුත් නිත්‍යානුකූල සහ පාලන අවශ්‍යතා ගැන වාර්තාව**

මෙම මුල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151(2) වගන්තියට අනුකූල බව ප්‍රකාශ කරමු.

වරලත් ගණකාධිකාරිවරු
කොළඹ
2013 මැයි 03

AIYAR & CO.
COLOMBO
Chartered Accountants

**Partners** : E. Ruwan J. Perera A.C.A., A.C.M.A., A.C.P.M. Joseph Jayaseelan B.B.Mgt., A.C.A., ATII
**Consultant** : Lal Nanayakkara B.A. (CEY), F.C.A.

*" An independent Firm, in association with Moore Stephens International Limited, members in principal cities throughout the World"*

AIYAR
70th Anniversary

# විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා

| | සටහන් | 2012 රු. | 2011 රු. |
|---|---|---|---|
| අයභාරය | 23 | 339,050,649 | 322,908,950 |
| විකුණුම් පිරිවැය | | (215,317,782) | (159,680,875) |
| **දළ ලාභය** | | 123,732,868 | 163,228,075 |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලැබීම් | 24 | 56,977,730 | 30,418,505 |
| පරිපාලන වියදම් | | (94,649,771) | (92,453,554) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (12,315,133) | (15,351,844) |
| **මෙහෙයුම් තුලින් ජනනය වූ ලාභය** | | 73,745,695 | 85,841,182 |
| මූල්‍ය ආදායම | | 37,463,655 | 33,128,217 |
| මූල්‍ය වියදම | 25 | (24,984,006) | (23,198,183) |
| **බදු පෙර ලාභය** | 26 | 86,225,344 | 95,771,216 |
| බදු වියදම් | 27 | (8,250,497) | (18,101,554) |
| **වර්ෂයේ ලාභය** | | 77,974,847 | 77,669,662 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | - | - |
| **වර්ෂයට මුළු විස්තීර්ණ ආදායම බදු පසු** | | 77,974,847 | 77,669,662 |
| කොටසක ඉපැයුම (රු.) | 28 | 3.90 | 3.88 |

වරහන් තුල ඇත්තේ අඩු කිරීම් ය.
පිටු අංක 06 සිට 37 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**හලාවත**
**2013 මැයි 03**



# මූල්‍ය තත්ව ප්‍රකාශනය

## 2012 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2012 රු. | 2011 රු. | 2011 රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | ජනවාරි 01 දිනට |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම් | 05 | 87,243,593 | 89,932,315 | 92,621,037 |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස දේපල පිරයත හා උපකරණ හිමිකම් (භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම්, බදු දී ඇති ජෛව හිමිකම් හැර) | 06 | 5,635,000 | 6,765,412 | 8,014,271 |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස කල්බදු ජෛව වත්කම් | 07 | 44,357,591 | 47,795,464 | 51,233,337 |
| ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර) | 08 | 369,375,094 | 310,819,874 | 274,585,084 |
| දේපල පිරයත හා උපකරණ හිමිකම් | 09 | 95,998,453 | 105,012,777 | 56,433,152 |
| | | **602,609,732** | **560,325,842** | **482,886,882** |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 10 | 82,605,641 | 94,295,259 | 24,838,720 |
| අලෙවියට තබා ඇති වත්කම් | 11 | 4 | 134,707 | - |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 12 | 43,256,800 | 46,722,748 | 56,484,308 |
| සම්බන්ධිත සමාගම් වලින් ලැබීමට නියමිත මුදල් | 13 | - | 2,157,952 | 2,157,952 |
| රාජ්‍ය ආයතන වලට මුල්‍ය පහසුකම් සැපයීම | 14 | 119,757,808 | 113,357,808 | 106,957,808 |
| වෙනත් ජංගම වත්කම් | | 4,678,016 | 12,595,745 | 19,013,033 |
| කෙටි කාලින ආයෝජන | 15 | 199,377,169 | 244,813,796 | 409,727,277 |
| මුදල් හා බැංකු ශේෂයන් | | 4,556,010 | 4,941,327 | 4,963,190 |
| | | **454,231,447** | **519,019,342** | **624,142,288** |
| **මුළු වත්කම්** | | **1,056,841,179** | **1,079,345,184** | **1,107,029,170** |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | | |
| කොටස් ප්‍රාග්ධනය | 16 | 200,000,010 | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ඉපයීම් | | 587,622,892 | 584,648,044 | 581,978,383 |
| මුළු ස්කන්ධය | | **787,622,902** | **784,648,054** | **781,978,393** |
| **ජංගම නොවන වගකීම් සහ විලම්බිත ආදායම්** | | | | |
| විලම්භිත බදු බැරකම | 17 | 32,669,159 | 27,382,429 | 22,920,257 |
| විලම්භිත ආදායම්, ප්‍රදාන හා ආධාර | 18 | 8,477,900 | 8,877,638 | 9,215,515 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් පාරිතෝෂිත | 19 | 52,645,432 | 50,730,900 | 46,845,687 |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් - ජනවසම | 20 | 115,277,115 | 117,100,799 | 118,854,340 |
| | | **209,069,607** | **204,091,766** | **197,835,799** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ | 21 | 54,477,057 | 52,401,434 | 54,849,907 |
| බීජ පොල් ව්‍යාපෘතිය සඳහා ලද අත්තිකාරම් | 22 | - | 27,203,347 | 60,550,000 |
| ආදායම් බදු බැරකම් | | 3,847,930 | 9,247,041 | 9,449,908 |
| වසරක් තුල ගෙවිය යුතු කල්බදු බැඳියාවන් | | - | - | 679,066 |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් ජනවසම ජංගම වගකීම් | 20 | 1,823,684 | 1,753,542 | 1,686,098 |
| | | 60,148,671 | 90,605,364 | 127,214,979 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **1,056,841,179** | **1,079,345,184** | **1,107,029,170** |

අඩු කිරීම් වරහන් තුල දැක්වේ.
පිටු අංක 06 සිට 37 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

සනාථ කිරීම
2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනකූලව මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර ඇත බව සනාථ කරමි.

රොහාන් රත්නායක
ජ්‍යේෂ්ඨ ගණකාධිකරු

මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබනු ලැබේ.

ආචාර්ය සුනිල් ජයසේකර
සභාපති

හලාවත - 2013 මැයි 03

ප්‍රියංගනි ලියනගේ මිය
අධ්‍යක්ෂිකා

# ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා

| | සටහන් | කොටස් ප්‍රාග්ධනය රු. | සම්මුච්ත ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| **2011 ජනවාරි 01 දිනට ශේෂය** | 35 | 200,000,010 | 581,978,383 | 781,978,393 |
| සංක්‍රාන්ති අනුඵලය | | - | - | - |
| **2011 ජනවාරි 01 දිනට ශේෂය** (SLFRS/LKAS පරිදි) | | 200,000,010 | 581,978,383 | 781,978,393 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | | - | 77,669,662 | 77,669,662 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - | - |
| මුළු විස්තීර්ණ ආදායම් | | - | 77,669,662 | 77,669,662 |
| ලාභාංශ ගෙවීම් | | | (75,000,000) | (75,000,000) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 200,000,010 | 584,648,044 | 784,648,054 |
| **2012 ජනවාරි 01 දිනට ශේෂය** | | 200,000,010 | 584,648,044 | 784,648,054 |
| වර්ෂයේ ලාභය | | - | 77,974,847 | 77,974,847 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - | - |
| මුළු විස්තීර්ණ ආදායම් | | - | 77,974,847 | 77,974,847 |
| ලාභාංශ ගෙවීම් | | - | (75,000,000) | (75,000,000) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | 200,000,010 | 587,622,892 | 787,622,902 |

වරහන් තුල ඇත්තේ අඩු කිරීම් ය.
පිටු අංක 06 සිට 37 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**හලාවත**
**2013 මැයි 03**



# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා

| | 2012 රු. | 2011 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/සඳහා (යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු පෙර ලාභය | 86,225,344 | 95,771,216 |
| **ගැලපීම්** | | |
| - ක්ෂයවීම්/ක්‍රමක්ෂයවීම් | 29,737,646 | 22,692,714 |
| - සේවක ලාභ කොටස් සඳහා වෙන් කිරීම් | 4,659,781 | 7,692,910 |
| - ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂයවීම් | (399,738) | (455,634) |
| - රාජ්‍ය කල්බදු සඳහා ගාස්තු | 24,984,006 | 23,198,183 |
| - මූල්‍ය ආදායම් | (37,463,655) | (33,128,217) |
| - විශේෂිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 5,035,583 | 6,137,838 |
| - දේපල පිරියත හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් අලාභය | (9,984,481) | - |
| - සම්බන්ධිත අදාල පාර්ශවයන්ගෙන් අයවිය යුතු ලියා හැරි ශේෂය | 2,157,952 | - |
| - ලියා හරින ලද දේපල පිරියත හා උපකරණ | 263,196 | - |
| | **105,215,633** | **121,909,009** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| - තොගවල (වැඩිවීම්)/අඩුවීම් | 11,689,618 | (69,456,539) |
| - කිරි පශු සම්පත් | 203,000 | (216,000) |
| - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම්)/අඩුවීම් | 4,406,261 | 5,198,655 |
| - වෙනත් ජංගම වත්කම් | 7,917,729 | 6,417,289 |
| - බීජ ගෙඩි ව්‍යාපෘති සඳහා ලත් අත්තිකාරම් | (27,203,347) | (33,346,653) |
| - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | (2,030,626) | (3,209,020) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **100,198,268** | **27,296,741** |
| - විශේෂිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් | (3,121,051) | (2,252,625) |
| - සේවක ලාභ කොටස් සඳහා ගෙවීම් | (7,576,006) | (8,441,523) |
| - කල්බදු ගෙවීම් | (17,961,532) | (17,126,117) |
| - මූල්‍ය ආදායම් ලැබීම් | 30,123,342 | 26,728,217 |
| - අය බදු ගෙවීම් | (8,362,878) | (13,842,249) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **93,300,144** | **12,362,444** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| - දේපල පිරියත හා උපකරණ එකතු කිරීමෙන් | (8,087,807) | (58,662,810) |
| - ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | (64,399,924) | (41,387,572) |
| - දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලැබීම් | 10,119,184 | - |
| - ලැබුනු ප්‍රදාන | - | 117,756 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(62,368,547)** | **(99,932,625)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| - ලාභාංශ ගෙවීම් | (75,000,000) | (75,000,000) |
| - මෝටර් රථ කල්බදු සඳහා ප්‍රාග්ධන පියවීම් | - | (679,066) |
| - රාජ්‍ය කල්බදු සඳහා ප්‍රාග්ධන පියවීම් | (1,753,542) | (1,686,097) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(76,753,542)** | **(77,365,163)** |
| - මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (45,821,946) | (164,935,344) |
| - වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන අ) | 249,755,123 | 414,690,467 |
| - වසරාවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන ආ) | **203,933,178** | **249,755,123** |
| **සටහන අ** | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසරාම්භයේ | | |
| - කෙටි කාලීන ආයෝජන | 244,813,796 | 409,727,277 |
| - මුදල් හා බැංකු ශේෂය | 4,941,327 | 4,963,190 |
| | 249,755,123 | 414,690,467 |
| **සටහන ආ** | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසරාවසානයේ | | |
| - කෙටි කාලීන ආයෝජන | 199,377,169 | 244,813,796 |
| - මුදල් හා බැංකු ශේෂය | 4,556,010 | 4,941,327 |
| | 203,933,178 | 249,755,123 |

වරහන් තුල ඇත්තේ අඩු කිරීම් ය.

පිටු අංක 06 සිට 37 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

# ගිණුම්කරණ සටහන්

## 01. ආයතනික තොරතුරු

### 1.1 වාර්තා කරන ස්ථිතිය

#### 1.1.1 පිහිටුම සහ නෛතික ව්‍යුහය

හලාවත වැවිලි සමාගම (සමාගම) 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක. 17 දරණ සමාගම් පනත යටතේ පිහිටවූ සීමාසහිත සමාගමකි. (2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ප්‍රතිලියාපදිංචි කළ සමගමකි).

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම පාරේ අංක 165 ස්ථානයේ සහ කොළඹ කාර්යාලය කොළඹ 01, ඩියුක් පාර, අංක 01 CDA ගොඩනැගිල්ල යන ස්ථානයේ පිහිටා ඇති අතර වතු, හලාවත, පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්ක වල පිහිටා ඇත.

#### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ පොල් වගාව, කොප්පරා නිෂ්පාදනය සහ ලෙලි පොල් සහ කොප්පරා අලෙවිය යි.

#### 1.1.3 මව් ආයතනය සහ අවසන් මව් ආයතනය

සමාගමේ මව් ආයතනය වනුයේ ශ්‍රී ලංකා රජය යි.

### 1.2 නිකුත් කිරීමට අවසර දී ඇති දිනය

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2013 මැයි 03 වෙනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව ප්‍රකාරව සිදු කරන ලදී.

# ගිණුම්කරණ සටහන්...

## 02. ඉදිරිපත් කිරීමේ පදනම

### 2.1 සංගත බව පිළිබඳ පදනම

මෙම මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ 1995 අංක 15 දරණ පනත යටතේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණආයතනය (CASL), විසින් ප්‍රසිද්ධ කරන ලද (SLFRS/LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව සකසා ඇත.
2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන දින දක්වා සමාගම තුළ මුල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවය (SLAS). SLFRS/LKAS ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව පිලියෙල කළ සමාග මේ ප්‍රථම මුල්‍ය ප්‍රකාශන වන්නේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මුල්‍ය වර්ෂය සඳහා පිළියෙල කළ ප්‍රකාශන යි. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මුල්‍ය වර්ෂය සඳහා සංසන්දනාත්මක දත්ත ද ඇතලත් කර ඇත. සමාගම ඊට පිවිසුණු ආකාරය සටහන් අංක 04 දක්වා ඇත.

### 2.2 සැකසීමේ පදනම

මෙම මුල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය පදනම මත, ප්‍රති අගය කළ ජනවසම සහ ශ්‍රීලංරාවැස දේපල සටහන් අංක 05, 06 සහ 07 හි විස්තර කර ඇති ආකාරයට පිළියෙල කර ඇති අතර උද්ධමනය සඳහා වන ගැලපීමක් මුල්‍ය ප්‍රකාශන වල සිදු කර නොමැත.

### 2.3 භාවිතාකරණ හා ඉදිරිපත් කරන ව්‍යවාහාරික මුදල්

මුල්‍ය ප්‍රකාශන සමාගම භාවිතා කරන ශ්‍රී ලංකා ව්‍යවාහාරික රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර සෑම මුල්‍ය තොරතුරක්ම ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ආසන්න අගයට වටයා ඇත.

### 2.4 ඇස්තමෙන්තු සහ තීන්දු භාවිතය

සමගමේ මුල්‍ය ප්‍රකාශන SLFRS/LKAS ප්‍රමිතිකරණය අනුකූලව සැකසෙන විට යොදා ගන්නා ගිණුම් ප්‍රතිපත්තියට ඉවහල් වන තීරණ ගැනීමට, ඇස්තමේන්තු සහ කල්පිතයන් සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ කළමනාකාරීත්වයට අවශය කෙරේ. තින්දු හා ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් හා ඇතිවන ඇති තත්ත්වයන් යටතේ සාධාරණ යැයි සැලකෙන බලාපොරොත්තු හා වෙනත් සාධක මත පදනම් වන බැවින් නිශ්චිත අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.
ඇස්තමේන්තු හා ඒ හා බැඳුනු උපකල්පන අඛණ්ඩ පදනමක් මත විශ්ලේෂණය කෙරේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා වන සංශෝධන එම කාලයට පමණක් අදාළ වන්නේ නම් හෝ කිසියම් හෝ ඉදිරි කාලයකට බලපාන්නේ නම් ඇස්තමේන්තු සංශෝධනය කළ කාලය තුළ ඒවා හඳුනාගැනේ.

### 2.5 අඛණ්ඩ බව

දුරදක්නා නුවණින් අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට සීමාසහිත හලාවත වැවිලි සමාගමට හැකියාවක් ඇති බව අධ්‍යක්‍ෂවරුන්ගේ තක්සේරුව වන අතර, එහි ව්‍යාපාර කටයුතු නවතා දැමීමට හෝ ද්‍රවශීලිකරණයට ලක් කිරීමට ඔවුන් අදහස් නොකරයි. එබැවින් මුල්‍ය ප්‍රකාශන ඒ අනුව සකසා ඇත.

### 2.6 සංසන්දනාත්මක තොරතුරු

සමාගම ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩබව යොදා ගෙන ඇති අතර පසුගිය වසරේ ගිණුම් ඉදිරිපත් කිරීමේදි වඩාත් පැහැදිලි, උචිත හා ප්‍රවර්තන වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන හා ගැලපෙන පරිදි ඉදිරිපත් කිරීමේ අභිප්‍රායෙන් පෙර වර්ෂයේ තොරතුරු අවශ්‍ය අවස්ථාවන්හිදී සංශෝධනය කර හෝ නැවත සැකසීම් කර ඇත.

### 2.7 මුල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මුල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට පසුව, සිදුවූ සියලු ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා මුල්‍ය ප්‍රකාශන තුළ අදාළ ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

# ගිණුම්කරණ සටහන්...

## 03. සාරාංශගත සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1 වත්කම් හා ඒවායේ ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් නම්, මුදල් සහ වාර්තා කරන දින සිට වසරක් තුළ හෝ වසරට අඩු කාලයක් තුල සමාගමේ මෙහෙයුම් චක්‍රය තුළ මුදල් ජනනය කරන වත්කම් වේ. ජංගම නොවන වත්කම් යනු වාර්තා කරන දින සිට වසරකට වැඩි කාලයක් සමාගම රඳවා ගැනීමට බලාපොරොත්තු වන වත්කම් වේ.

#### 3.1.1 දේපල, පිරියත හා උපකරණ

##### 3.1.1.1. හඳුනාගැනීම හා මැනීම

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්ෂය වෙන් කිරීම් හා අපහානයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

**(a) සන්තක දේපල**

දේපළ,පිරියත හා උපකරණ එය සන්තක කර ගැනීමේදී දැරූ සෘජු පිරිවැයයි. ස්වයං නිෂ්පාදිත වත්කමක් නම් එම භාණ්ඩය අදාළ කාර්යට සුදුසු තත්ත්වයට ගෙන වීමට දැරූ සියලු පිරිවැය එනම් ද්‍රව්‍ය,සෘජු ශ්‍රමය යනාදියද ඇතුළත් වේ. උපකරණ ක්‍රියාකාරිත්වයට මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපල, පිරියත හා උපකරණ වල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාලසීමා වලදී මාරු කිරීම් සිදු කරන අවස්ථාවලදී පිළිවෙලින් එම කොටස් ඵලදායි ආයු කාලයක් හා ක්ෂය කල හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම ප්‍රධාන පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී සියලු නිර්නායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය හඳුනාගනු ලබන්නේ පිරියත හා උපකරණ පවත්වාගෙන යන ප්‍රමාණයට ප්‍රතිස්ථාපනයක් සේ සළකනු ලැබීමෙන්ය. අනිකුත් සියලුම අලුත්වැඩියා හා නඩත්තු විස්තීර්ණ ප්‍රකාශනයේ වියදම් ලෙස දැක්වේ. නොනිම් ප්‍රාග්ධන, ඊට අදාළ වත්කම් වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය.

**(b) කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපල, පිරියත හා උපකරණ (බදු ගත් භාණ්ඩ යහිමි කරගැනීමෙන් සමාගමට අවදානමක් හෝ වාසියක් සෘජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම වර්ථමාන කල්බදු වටිනාකමින් අඩු අගය මත ප්‍රග්ධනිතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි.

බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොලී ප්‍රමාණය එම වර්ෂයේ වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කරනු ඇත. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොලී ගණනය වීම සිදුවේ.

බදු දේපල වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාලපරිච්ඡේදය තුළ ක්ෂය කරනු ලබයි.

##### 3.1.1.2. පසුකාලීන පිරිවැය

දේපල, පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදී දරණ පිරිවැය එම කොටස පවත්වාගෙන යන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය නිශ්චිතව මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ඇත. පවත්වාගෙන යන ප්‍රතිස්ථාපන කොටස් පහත දක්වා ඇති ප්‍රතිපත්තියට අනුව නොහැදිනීම් ලෙස හඳුන්වයි. දේපල, පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

# ගිණුම්කරණ සටහන්...

### 3.1.1.3. වත්කම් ලෙස හඳුනා නොගැනීම

දේපල, පිරියත හා උපකරණ වල යම් කිසි කොටසක් බැහැර කිරීමේදී හෝ කොටස මත අනාගත ආර්ථික ප්‍රතිලාභ නැතැයි හැඟෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනී. නොහැඳිනීම් තුළින් ලැබෙන ලැබීම් හා පාඩු, ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයභාරය ලෙස වර්ගීකරණය නොකරයි.

### 3.1.1.4. ක්ෂයවීම් සහ ක්‍රමක්ෂයවීම්

(a) **ක්ෂයවීම**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ පිරිවැය හෝ තක්සේරු වටිනාකම ඇස්තමේන්තු ඵලදායි කාලය පුරා සාධාරණ පදනමක් මත බෙදා හැරීමේ අරමුණින් පහත ඇති ආකාරයට ක්ෂය කිරීම් ගණනය කර ඇත:

| | **වසර ගණන** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.50 |
| පිරියත හා යන්ත්‍ර | 15 | 6.67 |
| ගෘහ භාණ්ඩ හා මෙවලම් | 10 | 10.00 |
| රථ වාහන | 05 | 20.00 |
| උපකරණ | 08 | 12.50 |
| තිරසාර ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වැට සැකසීම | 03 | 33.33 |
| ජල සැපයුම් | 20 | 5.00 |

යම් වත්කමක ක්ෂයවීම් ආරම්භ වන්නේ එම වත්කම ප්‍රයෝජනයට ගැනීමට යෙදවූ දින සිට එම වත්කම විකිනීම සඳහා තබා ගන්නා දිනය දක්වා හෝ වත්කමක් ලෙස හඳුනා නොගැනීමට තීරණය කල දින දක්වා ය.

(b) **ක්‍රමක්ෂයවීම**

කල්බදු කාලය අවසානවීමත් සමගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දන්නා විට හැරෙන්නට, කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ ඵලදායි ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි, ජනවසමෙන් හා ශ්‍රීලංරාවැස වෙන් බදු ගත් වත්කම් වල බදු කාලය 2045 න් අවසන් වනු ඇත.

ජනවසම හා ශ්‍රීලංරාවැස වෙන් කල්බදු ක්‍රමයට පවරා ගත් වත්කම් කල්බදු කාලය හෝ ඵලදායි ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ සමාන ප්‍රමාණයන් තුළ ක්‍රමක්ෂය කිරීම් පහත ආකාරයට සිදු කර ඇත:

| | **වසර ගණන** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| හිස් ඉඩම් සඳහා කල්බදු අයිතිය | 53 | 1.89 |
| ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වෙනත් පවරා ගත් වත්කම් | 30 | 3.33 |
| ගොඩනැගිලි | 25 | 4.00 |
| යන්ත්‍ර සූත්‍ර | 15 | 6.67 |
| ජල සැපයුම් | 20 | 5.00 |

# ගිණුම්කරණ සටහන්...

## 3.1.2 ජෛව වත්කම්

### 3.1.2.1. නොමිරූ හා මේරූ වගා

**(a) නිශ්චල ජෛව කල්බදු වත්කම් (නොමේරූ හා මේරූ වගා)**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනයේ වගා ඉඩම් පුද්ගලීකරණය කළ අවධියේ පැවති UITF නියෝගයට අනුව ජනවසම/ශ්‍රීලංරාවැස ට හිමි කල්බදු ජෛව වත්කම් (නොමේරූ සහ මේරූ වගා) 1992 ජුනි 22 දින සිට බලපවත්නා ආකාරයට සමාගමේ ලේඛන වලට ගනු ලැබීය.

කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් සරල මාර්ග පදනම යටතේ විස්තීරණ මූල්‍ය ප්‍රකාශණය තුල වර්ථමානය සහ ඇස්තමේන්තු කළ ඵලදායි ජීවකාලය පුරා සංසනාදනාත්මකව පහත සඳහන් ආකාරයට ක්‍රමක්ෂය කර ඇත :

| | **වසර ගණන** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| මේරූ වගා | 30 | 3.33 |

**(b) කල්බදු දේපල සංවර්ධනය (නොමේරූ සහ මේරූ වගා)**

වගා කරන කාලය තුළ එනම්, භූමිය සකස් කිරීම, පුණරුත්ථාපනය, අලුත් වගා කිරීම. නැවත වගා කිරීම,අන්තර වගා කිරීම්, සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙලීම දක්වා (වගාව මේරූ තත්වයට පත් වන තුරු) වූ පිරිවැය නොමේරූ වගා යටතට ගැනේ. ඵල දැරීම ආරම්භ වන වර්ෂයේදී මේරූ වගා යටතට මාරු කරනු ඇත.මෙම නොමේරූ වගා සෘජු පිරිවැය සහ අන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්යය පිරිවැය වලින් සමන්විත වේ.

කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීර්ණ ආදායම් වල සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලය අවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායි ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙස හඳුනා ගනු ඇත.

ඇස්තමේන්තු ගත වර්තමාන සහ සංසන්දනාත්මක ඵලදායි ආයු කාලය පහත දක්වා ඇත :

| | **වසර ගණන** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| පොල් | 50 | 2.00 |
| කජු | 25 | 4.00 |
| වෙනත් | 20 | 5.00 |

### 3.1.2.1 ගව පශු සම්පත්

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය නිශ්චිත කරනු ඇත.

## 3.1.3 විකිණීමට ඇති ජංගම නොවන වත්කම්

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් එසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය සේ සැලකේ. පවතින තත්ත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාව්‍යතාවයක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත.

“විකිණීමට වෙන්කර ඇතිදෑ” ලෙස වර්ගීකරණය කළ දේපල, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

# ගිණුම්කරණ සටහන්...

### 3.1.4 තොග

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත අභාවිත හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්වයෙන් විකිණිය හැකි තලයට පරිවර්තන පිරිවැයට සිදු කර සමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

වත්මන් ස්ථානයන්ට හා තත්ත්වයන් වෙතට පත් කිරීමේදී පිරිවැය පහත සඳහන් සූත්‍රය භාවිතා කර ගණනය කර ඇත.

| පාරිභෝජන හා අමතර ද්‍රව්‍ය යෙදවුම් | FIFO පදනම මත සත්‍ය පිරිවැය අගයට |
|---|---|
| වැඩෙන භෝග පැල තවාන් | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, පිරිවැය හා සෘජුව අදාළ වන පොදු වියදම් අනුපාතය |
| නෙළා ගත් අස්වැන්න | ජෛව වත්කම්වලින් නෙලාගත් කෘෂි නිෂ්පාදන ඒවායේ සාධාරණ වෙළඳපල වටිනාකමින් විකිණීම් වියදම් අඩු කර නෙලාගත් සථානයේදීම අගය කරයි.<br><br>නිමකළ හො අර්ධ නිමකළ කෘෂි නිෂ්පාදන ඒවා පරිවර්තනය කිරීමට වැයවූ පිරිවැය එකතු කිරීමෙන් අගය කරයි. |
| පශු සම්පත් | ගව සම්පත් තොග මිනිනු ලබන්නේ සාධාරණ වෙළඳපල අගයෙන් විකුණුම් වියදම් අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛයට අනුව සාධාරණ අගය නිශ්චිත කරනු ඇත. |

### 3.1.5 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 (LKAS 39) යටතට ගැනෙන මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ මත වෙළඳපල වටිනා කම් ඇති මූල්‍ය වත්කම්ල ණය හෝ ලැබිය යුතු දෑ හෝ, කල්පිරෙන තෙක් තබා ගෙන ඇති ආයෝජන හෝ විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස දැක්විය හැක.

සමාගමේ මූල්‍ය වත්කම් යනු මුදල්, කෙටිකාලීන තැන්පතු, ආයෝජන, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ, සේවකයින්ට දී ඇති ණය, රාජ්‍ය ආයතන වලට ලබාදී ඇති ණය ආදිය වේ.

#### 3.1.5.1. ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගය ඇති මූල්‍ය වත්කම්

විකිණීමට වෙන් කළ වත්කම් හා මුල් අවදියේම ලාභ හෝ පාඩු මත හඳුනා ගත් වත්කම් මීට ඇතුළත්ය. ගනුදෙනුවලට වෙන් කළ දෑ යනුවෙන් වර්ගීකරණය කරනුයේ නුදුරු කාලයේදී විකිණීමට හෝ නැවත මිලදී ගැනීම පිණිස අත්පත් කර ගන්නා දෑය.

මූල්‍ය තත්වය ප්‍රකාශනයේ ලාභ හෝ පාඩු හරහා වෙළඳපල අගය ඇති මූල්‍ය වත්කම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදම් හෝ මූල්‍ය ආදායම් යටතේ වර්ගීකරණය කර ඇත.

සමාගම ලාභ හෝ පාඩු හරහා වෙළඳපල අගය හරහා කිසිවක් මූල්‍ය වත්කම් ලෙස නම් කර නැත.

#### 3.1.5.2. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ ස්ථාවර හෝ නිශ්චිත වාරික ගෙවීමක් සහිත ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් යටතට අයත්වන අතර ක්‍රියාකාරී වෙළඳපොළ හරහා මිල ගණන් නියම වී නැත. මෙම මූල්‍ය වත්කම් පළමු ඇගයීමෙන් පසුව ඒවා ලබා ගැනීමේදි හෝ භාරදීමේදී, සාධාරණ අගයට ගනුදෙනුවේ වියදම හඳුනා ගන්නා අතර සාධනීය පොළී අනුපාත ක්‍රමය මත පිරිවැය ක්‍රමක්ෂය කිරීමෙන් ඇගයීම කරනු ලබයි.

# ගිණුම්කරණ සටහන්...

මෙහිදි වටිනාකමෙහි නිත්‍ය අඩුවීමක් සිදුවී ඇත්නම් එය අඩුකිරීමට කටයුතු කරනු ලබයි.

මෙම ක්‍රමක්‍ෂය කිරීමේ පිරිවැය ගණනය කරනු ලබන්නේ වට්ටම්, අත්පත් කරගන්නා අවස්ථාවේ වූ අධි මිල, ගාස්තු හෝ යම් වියදමක් වේ නම් ඒවා සරල පොලී අනුපාත ක්‍රමයේ සංඝටනීය කොටස් ලෙස සැලකිල්ලට ගනු ලැබීමෙනි.

සරල පොලී අනුපාත ක්‍රමය යටතේ ක්‍රමක්‍ෂය ප්‍රමාණය මූල්‍ය ආදායම් යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන ඇත. වටිනාකමෙහි නිත්‍ය අඩුවීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය වියදම් යටතේ හඳුනා ගෙන ඇත.

සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ, තැන්පතු, අතිකාරම් සහ වෙනත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදල් සමාන දෑ, ණය සහ ලැබිය යුතු දෑ ලෙස සළකනු ලබයි.

**වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ**
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ යනු පහත සඳහන් අවස්ථාවන් හැර, එහි සාධාරණ අගය මත ප්‍රථමයෙන් හඳුනා ගැනීමෙන් පසු ක්‍රමක්‍ෂය වටිනාකමෙන් ඉවත් කිරීම මත පිරිවැය සැළකිල්ලට ගැනීමෙන් පසු ලැබිය යුතු දෑ වේ.

- සම්බන්ධිත පාර්ශවයන්ට නැවත ගෙවීමේ නිශ්චිත ක්‍රමයක් රහිතව ලබා දෙන පොලී රහිත ණය ඇස්මේන්තු ගත උපලබ්ධි වටිනාකම මත බොල් හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනයන්ට යටත්ව වෙළඳ ලැබිය යුතු දෑ, ඇත්නම්,
- ප්‍රකාශිත පොලි පදනමක් රහිත සහ වට්ටම බලපෑමකින් තොරව කෙටි කාලීන ලැබිය යුතු දෑ උපලබ්ධි වටිනාකම මත බොල් හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනයන්ට යටත්ව වෙළඳ ලැබිය යුතු දෑ, ඇත්නම්

**මුදල් හා මුදල් සමාන දෑ**
මුදල් ප්‍රවාහය ප්‍රකාශනයේ අතැති සහ බැංකුවේ ඇති මුදල්, ස්ථාවර හා ඉතිරි කිරීමේ තැන්පතු මුදල්, මුදල් හා මුදල් සමාන දෑ ලෙස හැඳින්වේ.

# ගිණුම්කරණ සටහන්...

## 3.2 බැරකම් හා වෙනත් වෙන් කිරීම්

මූල්‍ය තත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනයේ සිට වසරක කාලයක් ඇතුළතදී ගෙවිය යුතු හෝ ඉල්ලූ විටදී ගෙවිය යුතු හෝ බැරකම්, ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත. ශේෂපත්‍ර දින සිට වසරකට පසුව ගෙවිය යුතු බැරකම් ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනා ගත් සියලුම දන්නා වගකීම් සහ බැරකම් ගිණුම් ගත කර ඇත. අතීත හේතූන් මත සමාගම වෙත පැවරී ඇති නෛතික හා සාධනීය බැඳීම් හඳුනා ගෙන ඒවා පියවීම සඳහා මූල්‍ය කැප කිරීමක් අවශ්‍ය වන නීතිමය බැඳීම් සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය වෙන් කිරීම් සිදු කර ඇත.

### 3.2.1. මූල්‍ය වගකීම්

**මූලික හඳුනාගැනීම සහ මැනීම**

LKAS 39 ට අනුව මූල්‍ය වගකීම් වර්ගීකරණය කර ඇත්තේ ලාභ සහ පාඩු හරහා සාධාරණ අගය, ණය සහ ණයට ගැනීම, යනුවෙනි. සමාගම මූලික අවස්ථාවේදීම තම මූල්‍ය වගකීම් හඳුනා ගනු ඇත. මූලික අවස්ථාවේ සාධාරණ අගය මත හඳුනා ගත් ණය සහ ණයට ගැනීම් පිරිවැය ක්‍රමක්ෂය කරනු ලබයි. මෙයට ගණුදෙනුව වෙනුවෙන් සෘජුව දරණ ලද වියදම් ඇතුළත්වේ. සමාගමේ මූල්‍ය වගකීම් වලට වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ ද ඇතුලත්ය.

#### 3.2.1.1. සාධාරණ අගය මත ලාභ හෝ පාඩු මත මූල්‍ය වගකීම්

සාධාරණ අගයේ ලාභ හෝ පාඩු මත ඇති මූල්‍ය වගකීම් වලට වෙළඳාම පිණිස ඇති මූල්‍ය වගකීම් ද ප්‍රථම හඳුනා ගැනීමේදී වෙළඳපල අගය මත ලාභ හෝ පාඩු මත මූල්‍ය වගකීම් ද ඇතුළත්ය. මූල්‍ය වගකීම් වශයෙන් වර්ගීකරණය කර ඇත්තේ, නුදුරු අනාගතයේදී වෙළඳාම පිණිස අත්පත් කර ගත් වත්කම් ය. වෙළඳාම පිණිස වෙන්කර ඇති වගකීම් වල ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශණයේ පෙන්වා ඇත. සාධාරණ අගය මත ලාභ හෝ පාඩු මත මූල්‍ය වගකීම් කිසිවක් සමාගම සතුව නැත.

#### 3.2.1.2. ණය සහ ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසු පොලිය මත ණය සහ ණයට ගැනීම් පසුව සඵල පොලි අනුපාත ක්‍රමයට අනුව පිරිවැය ක්‍රමක්‍ෂය කිරීමෙන් අනතුරුව ලාභ සහ පාඩු ආදායම් ප්‍රකාශනයේ පෙන්වා ඇත. අනෙකුත් මූල්‍ය වගකීම් වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ, ගෙවිය යුතු ආදායම් බදු වලින් සමන්විත වේ.

### 3.2.2. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් වනුයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ සහ අයබදු වගකීම වේ. මෙම මූල්‍ය වගකීම් සමාගමේ මෙහෙයුම් කර ගෙන යාමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා යෙදවේ. සමාගම ණය සපයා ඇත්තේ රාජ්‍ය ව්‍යවසාය වලට සහ වාණිජ හා වෙනත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ කෙටි කාලීන තැන්පතු සහ සෘජුවම මෙහෙයුම් වලින් ලැබෙන ආකාරයට ය.

එබැවින් සමාගම මූල්‍ය මෙවලම් භාවිතයේදී ණය අවදානම්, ද්‍රවශීලී අවදානම්, මුදල් අවදානම් සහ පොලී අනුපාත අවදානම් ආදියට මුහුණ පානු ඇත.

මෙම සටහන සමාගම මුහුණපාන එම අවදානම් ගැන තොරතුරු සපයන අතර ඒවා කළමනාකරණය පිණිස සමාගමේ අරමුණු සහ ප්‍රතිපත්ති මගින් පැහැදිලි කරයි.

#### 3.2.2.1. ණය අවදානම

ණය අවදානම යනු සමාගම විසින් ණය සපයා ඇති පාරිභෝගයෙක් හෝ සම්බන්ධිත පාර්ශවයක් තම ගිවිසුම්, බැඳීම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ විට සමාගමට ලැබිය යුතු දෑ නොලැබීමෙන් ඇතිවන මූල්‍ය අලාභය යි.

# ගිණුම්කරණ සටහන්...

3.2.2.2. **ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලි අවදානම යනු සමාගම තම මූල්‍ය වගකිම් මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් තුළින් පියවීමට යාමේදි එය අපොහොසත්විම මත ඇති වන අවදානම යි.

සමාගම වගකිම් පියවීමට යාමේදි සමාගමේ කිර්ති නාමයට හානියක් නොවන ආකාරයෙන් හා වෙනත් අලාභයක් නොවන ආකාරයෙන් වගකිම් පියවීමට ප්‍රමාණවත් ද්‍රවශිලතාවයක් පවත්වා ගනි.

**3.2.3. සේවකයින්ගේ ප්‍රතිලාභ**

(a) **නිර්ණය කල දායකත්ව ප්‍රතිලාභ සැලසුම - අර්ථසාධක සහ සේවා භාරකාර අරමුදල්**
නිර්ණය කළ දායකත්ව සැලසුම පසු සේවා ප්‍රතිලාභ සැලසුමක් වශයෙන් සේවා යෝජක විසින් සේවකයින් වෙනුවෙන් නිශ්චිත දායකත්වයක් ලබා දෙන අතර ඊට වඩා වැඩි ගෙවිමකට නෛයිතිකව හෝ සාධනියව බැදි නැත. සේවකයින් විසින් ලබා දෙන සේවය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා භාරකාර අරමුදලට සියලුම සේවකයින් සඳහා කරන ගෙවීම් වියදමක් සේ ලාභ අලාභ ප්‍රකාශනයේදි සැලකේ.

සමාගම සේවකයින්ගේ දල වැටුපෙන් 12% ක් හා 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා භාරකාර අරමුදලට ද මාසිකව ගෙවනු ලබයි.

(b) **නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම**
නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම, නිර්ණය කළ දායකත්ව සැලසුම හා සමාන පසු සේවා ප්‍රතිලාභ සැලසුමකි. නිර්ණය කල ප්‍රතිලාභ පිරිවැය ගණනය කිරිමේදි ආයුගණක අගය කිරිම (Acturial valuations) පදනම භාවිත කරයි. ආයු ගණක අගය කිරිමේදි වට්ටම් අනුපාතය අනාගත වැටුප් වැඩිවිම වැනි කල්පිතයන් ඇති කරගනියි. භාවිතා කළ කල්පිතයන් පිළිබඳ විස්තර 16 වැනි සටහනේ දැක්වේ.ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු මගින් අරමුදල් වෙන්කර ඇත.

## 3.3. විලම්බිත ආදායම්

**ප්‍රදාන සහ ආධාර**
නිශ්චිතව ලැබෙතැයි විශ්වාස කළ හැකි රාජ්‍ය ප්‍රදාන ඊට අදාළ කොන්දේසි සහිත වනු ඇත. ප්‍රදානය වියදමක් ලෙස සැලකෙන විට, එක්තරා කාලසීමාවක් තුළ එයින් පියවීමට බලාපොරොත්තු වන අරමුණ ක්‍රමවත් පදනමක් මත ලැබෙන්නාවු ආදායමක් ලෙස සැලකේ. එම ප්‍රදානය වත්කමකට අදාළ නම් එය වත්කමේ ආයු කාලය තුළ සමාන වාර්ක විලම්බිත අදායමක් සේ වෙන් කෙරෙනු ඇත.

ප්‍රදානය දේපල, පිරියත හෝ උපකරණ සඳහා නම් එම ප්‍රදානය දේපල, පිරියත හෝ උපකරණ වල ඵලදායි ආයු කාලය තුළ විලම්බිත ආදායමක් සේ වෙන් කෙරනු ඇත.

වත්කම් ඒවායේ ඵලදායි ආයු කාලය හෝ පියවීමට ඇති කල්බදු කාලය යන දෙකෙන් අඩු එකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| ජල සැපයුම් | වසර 20 |
| මොටර් රථ | වසර 05 |
| ගෘහ භාණ්ඩ හා මෙවලම් | වසර 10 |
| උපකරණ | වසර 08 |

## 3.4. ආදායම් සහ වියදම්

ආදායම් ප්‍රකාශනයේ අරමුණෙන්, සමාගමේ ක්‍රියා කළාපය සාධණීයව ඉදිරිපත් වන හෙයින් වියදම් ක්‍රමවේදය යොදාගනු ඇත.

# ගිණුම්කරණ සටහන්...

### 3.4.1. අයභාරය

සමාගමට ගලා එන ආර්ථික ප්‍රතිලාභ තුළින් අයභාරය හඳුනා ගත හැකි වන අතර ගෙවන්නේ කුමන වෙලාවකද යන්න ප්‍රශ්නයක් නොවී එය මැන ගැනීමට හැකි විය යුතුයි. අයභාරය මනිනු ලබන්නේ යමකට ලැබුනු හෝ ලැබීමට නියමිත සාධාරණ අගය සහ ඒ සඳහා ඇති කර ගත් බැඳුම්කර ගිවිසුම් පදනම් කර ගෙනයි.

a) භාණ්ඩ අලෙවියෙන් ලබන අයභාරය හඳුන්වන්නේ යම්කිසි භාණ්ඩයක හිමිකම සහ ලඟ තබා ගැනීමේ ප්‍රතිලාභය හා අවදානම භාණ්ඩ විසර්ජනය තුළින් ගැණුම්කරු වෙත මාරු කිරීමෙනි. අයභාරය වාර්තාකරන්නේ බිල් පත් වටිනාකමින් තැරව් ගාස්තු, අලෙවි වියදම් හා අයභාරයට අයත් වෙනත් ගාස්තු අඩු කිරීමෙනි.

b) දේපල, පිරියත හා උපකරණ අපහරණයෙන් ලබෙන වාසි සහ අවාසි ගණනය කරන්නේ දළ විකුණුම් අගය හා පවත්වා ගෙන යන දේපල, පිරයත හා උපකරණ සංසන්දනය කිරීමෙනි. වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

c) පොලී ආදායම් LKAS 39 සාධනීය පොලි ක්‍රමය යටතේ දක්වා ඇත.

d) වෙනත් ආදායම් හඳුන්වන්නේ උපචිත පදනම යටතේ ය.

### 3.4.2. වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදි දරණ සියලු වියදම් සහ සියලුම දේපල, පිරයත හා උපකරණ කාර්යක්‍ෂම ව පවත්වාගෙන යාමට දරණ සියලූ වියදම් වර්ෂයේ ලාභ/අලාභ ගණනය කිරීමේදි අයභාරයට එරෙහිව අයකරයි.

## 3.5. ආදායම් බදු

අයබදු, ජංගම බදු සහ විලම්බිත බදු යන දෙකොටසකින් සමන්විතයි. ස්කන්ධයට සම්බන්ධිත ස්කන්ධය මත හදුනා ගන්නා අයිතමය හැර ආදායම් බදු වියදම් ලාභ අලාභ ප්‍රකාශයේ හදුනා ගනි.

(a) **ජංගම බදු**

වර්ෂයේ බදු අයකල හැකි ආදායම මත වාර්තා කරන දිනට පවත්නා බදු ආනුපාතයන් පදනම් කරන ලද අතර හා පසුගිය වසරට අදාල ගැලපුම් වෙතොත් ඒවා අදාල වේ.

මූල්‍ය ප්‍රකාශන වල පවතින ආදායම් සහ වියදම් පදනම් කර ගනිමින් හා අදායම් බදු පනතේ විධිවිධාන හා සංශෝධන වලට අනුකූලව අදායම් බදු වෙන්කිරීම් සිදුකරයි.

(b) **විලම්බිත බදු**

මුල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා ශේෂපත්‍රය පදනම් කර ගනිමින් පවත්වාගෙන යන වත්කම් සහ වගකීම් අතර ඇති කාලින වෙනස්කම් සහ අයබදු සඳහා ප්‍රමාණයන් පදනම් කර ගෙන විලම්බිත බදු හඳුනාගනී. පහත සඳහන් තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හදුනා නොගනි. ගණුදෙනුවක් ලෙස මූලික හඳුනා ගැනීමේදී වත්කම් හා වගකීම් ව්‍යාපාරයට ඒකාබද්ධ නොවන විට හා එයින් ගිණුම්කරණයට හෝ බදු අය කල හැකි ලාභයට බල නොපාන අවස්ථාවකදී සහ වෙනත් උප වෙළඳ ආයෝජනයකදි පෙනෙන නුදුරු අනාගතයේදී කිසියම් ආපසු හැරීමක් නෙපෙනෙන අවස්ථාවකදී ද මීට අමතරව, හොඳහිත මත බදුවන තාවකාලික වෙනස් වීම් වලදී. විලම්බිත බදු කාලින වෙනස්කම් වලදි යොදා ගැනිමට බදු අනුපාතයන්ට මනිනු ලබයි. විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කිරීමට නෛතික හැකියාවක් ඇත්නම් පමණක් එනම් වත්කම් හා වගකීම් සඳහා එකම ආයතනයකින් අයබදු ද අය කර ඇත්නම් පමණක් ය.

විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ අනාගත බදු ගෙවිය යුතු ලාභය භාවිතා කිරීමට හැකිවන සේ කාලින වෙනස් පවතින්නේ නම් පමණි. සෑම වාර්තාකරණයකදීම විලම්බිත බදු සම්බන්ධ අවධානය යොදවා අදාළ බදු සහන තවදුරටත් නොලැබෙන්නේ නම් අවම කිරීම සිදු කරනු ඇත.

# ගිණුම්කරණ සටහන්...

## 3.6. ඛණ්ඩ වාර්තාකරණය

සමාගමේ විවිධ ව්‍යාපාරික ඛණ්ඩ සඳහා ඛණ්ඩ වාර්තාකරණයකට ඉඩ ඇත. වතුයාය වල භූගෝලීය පිහිටීම අනුව ඛණ්ඩ ගත කරනු ඇත. මූල්‍ය ප්‍රකාශනයේ සටහන් 20 හි ඛණ්ඩ ක්‍රියාකාරිත්වය විස්තර කර ඇත.

## 3.7. SLFRS/LKAS පළමු වර යොදා ගැනීම

SLRFS ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව පිළියෙල කළ සමාගමේ ප්‍රථම මූල්‍ය ප්‍රකාශන වන්නේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන යි. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය ඇතුළත්ව මීට පෙර වර්ෂ සඳහා පිලියෙල කළ මූල්‍ය ප්‍රකාශන SLAS - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිලියෙල කරන ලදි.

ගිණුම්කරණප්‍රතිපත්ති වල දක්වා ඇති ආකාරයට, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ඊට අදාළ වන සංසන්ධනාත්මක තොරතුරු ද ඇතුළත්ව, (2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂයට අදාළ තොරතුරු SLRFS ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදි, මූල්‍ය තත්ත්වය පිළිබඳ ආරම්භක ප්‍රකාශය, SLRFS - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වලට සංක්‍රාන්ති වූ දිනට එනම්, 2011 ජනවාරි 01 වැනි දිනට පිළියෙල කර ඇත.

2011 ජනවාරි 01 දිනට SLAS ප්‍රමිතිකරණයට අදාළව සැකසූ මූල්‍ය තත්ව ප්‍රකාශනය 2011 ජනවාරි 01 දිනට ප්‍රතිප්‍රකාශ කිරීමේදී සහ ඉන් පෙර ප්‍රකාශයට පත් කළ 2011 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂ ප්‍රකාශන සඳහා සමාගම යොදා ගත් ප්‍රධාන ගැලපීම් 04 සටහනේ දක්වා ඇත.

### 3.7.1.නිදහස් කිරීම් සහ ප්‍රත්‍යලෝකන යෙදීම් වලින් නිදහස් කිරීම

#### 3.7.1.1. අනුගම්‍ය ප්‍රත්‍යලෝකන අයදුම්වලින් නිදහස් කිරීම

පළමුවරට SLFRS ප්‍රමිතිකරණය යොදා ගන්නා සමාගම්වලට පහත සඳහන් අනුගම්‍ය නිදහස් කිරීම් ලබා දී ඇත. කෙසේ වෙතත්,ඇස්තමේන්තු භාවිතය හැර අනෙකුත් දෑ සමාගම් වලට අදාළ නැත.

- ඇස්තමේන්තු භාවිතය
- මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් නොහැඳිනීම
- හෙජ් ගිණුම්කරණය
- පොලී අව පාලනය

**• ඇස්තමේන්තු භාවිතය**

GAAP කළමනාකරණය යටතේ සැකසූ ඇස්තමේන්තුීඛජඍ භාවිතය නිසා වෙනස් නොකළ යුතුයි. කළමනාකරණය පහත සඳහන් දෑ පසු දැකිය යුතු නැත.

වැදගත් ඇස්තමේන්තු වන්නේ,
- අයබදු
- සේවක ප්‍රතිලාභ සැලසුම යටතේ ඇති සේවක වගකීම්
- දේපල පිරියත උපකරණ වල ඵලදායි ජිවිත කාලයයි
- විලම්බිත බදු තක්සේරු

#### 3.7.1.2. විකල්ප නිදහස් කිරීම්

**සමාගම පහත සඳහන් නිදහස් කිරීම් සඳහා අයදුම් කරන ලදී:**
පළමු වරට SLFRS භාවිතා කරන්නන්ට, SLFRS වලට අදාල අතීතයට බලපාන පරිදි කලයුතු සමහර ගැලපුම් වලින් නිදහස් වීමට අවසර ලබාදි ඇත.

# ගිණුම්කරණ සටහන්...

**• සාධාරණ අගය හෝ ප්‍රතිතක්සේරු අගය සත්‍ය අගය ලෙස සැලකීම :**
යම්කිසි දේපලක, පිරියතක හෝ උපකරණයක වෙළඳපල අගය SLFRS සංක්‍රාන්ති දිනයේ සත්‍ය අගය ලෙස සැළකීම සමාගම වෙළඳපල අගය සත්‍ය අගය ලෙස සැලකීම තෝරාගත්තේ නැත.

**• සේවක ප්‍රතිලාභ**
මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ සකසා ඇත්තේ SLAS ක්‍රමයටයි. සමාගම ඒ වෙනුවට Corridor Approach ක්‍රමය භාවිතා කර නොමැත.

**පහත සඳහන් නිදහස් කිරීම් සමාගමට අදාළ නැත**
• ව්‍යාපාර ඒකාබද්ධ කිරීම
• සමුච්චිත පරිවර්තන වෙනස්
• පෙර නම් කර තිබූ මූල්‍ය මෙවලම්
• පරිපාලිත, සම්බන්දිත සහ බද්ධ ව්‍යාපාර වල වත්කම් සහ වගකීම්
• කල්බදු
• වගකීම් දේපල ඇතුලු වගකීම් පැවරීම
• මූල්‍ය මෙවලම් සංයෝග කිරීම
• රක්‍ෂණ කොන්ත්‍රාත්
• සේවා පහසුකම් සැපයීම
• ණයට ගැනීමේ පිරිවැය

## 3.8. දැනට නිකුත්කර ඇති නමුත් ක්‍රියාත්මක නොකළ ප්‍රමිති

දැනට නිකුත් කර ඇතත් තවමත් ක්‍රියාත්මක නොකළ ප්‍රමිති පහත දක්වා ඇත. මෙම ප්‍රමිති ක්‍රියාත්මක වූ විට සමාගම එම ප්‍රමිති උපයෝගි කර ගනු ඇත. එහෙත් ඒ එමගින් ඇතිවන මූල්‍යමය බලපෑම් සම්බන්ධව විස්තරාත්මක සමාලෝචනයකින් පසුවයි.

(i) SLFRS 09 - මූල්‍ය මෙවලම්
වර්ගීකරණය සහ මැනීම SLFRS 09 : LKAS 39 ඉවත් කිරීමේ ප්‍රථම අදියර ලෙස නිකුත් කර ඇත.

(ii)SLFRS 13 - සාධාරණ අගය මැනීම
සියලුම සාධාරණ අගයන් මැනීම පිණිස නිකුත් කර ඇති එකම මූලාශ්‍රය යි.

SLFRS 09 බලාත්මක වන්නේ 2015 ජනවාරි 01 වන අතර SLFRS 13 2014 ජනවාරි 01 සිට බලාත්මක වනු ඇත.

# ගිණුම්කරණ සටහන්...

## 04. SLFRS/LKAS සංක්‍රාන්තියට විවරණ

SLAS සිට SLFRS වලට සංක්‍රාන්තවීමේදී සමාගම විවරණක් දක්වයි. මෙම විවරණය මාරු වීමට පසු බිම සහ සුදුසු කම් සාකච්ඡා කරන අතර සංක්‍රාන්ති දිනය වන 2011 ජනවාරි 01 දා සහ සමාගමේ ස්කන්ධය 2011 දෙසැම්බර් 31 දිනට එම අගයන්ගේ සංසන්දනයක් සිදු කරයි.

### 4.1. 2011 ජනවාරි 01 දිනට ස්කන්ධය සංසන්දනය කිරීම (SLFRS/LKAS සංක්‍රාන්ති දිනය)

| 2011 දෙසැම්බර් 31 දිනට | සටහන් | SLFRS/LKAS 2011 ජනවාරි 01 දිනට රු. | සංක්‍රාන්තියේ බලපෑම් රු. | SLAS 2011 ජනවාරි 01 දිනට රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම් | | 92,621,037 | - | 92,621,037 |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස දේපල පිරයත හා උපකරණ හිමිකම් | | | | |
| (භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම්, බදු දී ඇති ජෛව හිමිකම් හැර) | A | 8,014,271 | (51,233,337) | 59,247,609 |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස කල්බදු ජෛව වත්කම් | A | 51,233,337 | 51,233,337 | - |
| ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර) | B / 35 | 274,585,084.02 | 3,687,000 | 270,898,084.02 |
| දේපල පිරයත හා උපකරණ හිමිකම් | | 56,433,152 | - | 56,433,152 |
| | | **482,886,882** | **3,687,000** | **479,199,882** |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | C | 24,838,720 | (3,687,000) | 28,525,720 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | D | 56,484,308 | (19,013,033) | 75,497,341 |
| සම්බන්ධවූ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණය | | 2,157,952 | - | 2,157,952 |
| රාජ්‍ය ආයතන වලට ලබා දුන් මූල්‍ය පහසුකම් | | 106,957,808 | - | 106,957,808 |
| වෙනත් ජංගම වත්කම් | D | 19,013,033 | 19,013,033 | |
| කෙටි කාලීන ආයෝජන | | 409,727,277 | - | 409,727,277 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | | 4,963,190 | - | 4,963,190 |
| | | **624,142,288** | **(3,687,000)** | **627,829,288** |
| **මුළු වත්කම්** | | **1,107,029,170** | **-** | **1,107,029,170** |
| | | | | |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධන සංචිත** | | | | |
| කොටස් ප්‍රාග්ධනය | | 200,000,010 | - | 200,000,010 |
| රඳවා ගත් ආදායම් | 35 | 581,978,383 | - | 581,978,383 |
| මුළු ස්කන්ධය | | **781,978,393** | **-** | **781,978,393** |
| | | | | |
| **ජංගම නොවන වත්කම් සහ විලම්බිත බදු** | | | | |
| විලම්බිත බදු වගකීම් | | 22,920,257 | - | 22,920,257 |
| විලම්බිත ප්‍රදාන සහ සහනාධාර | | 9,215,515 | - | 9,215,515 |
| විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම | | 46,845,687 | - | 46,845,687 |
| ජනවසම/ශ්‍රීලංරාවැස ට කල්බදු ගෙවීමට ඇති වගකීම් | | 118,854,340 | - | 118,854,340 |
| | | **197,835,799** | **-** | **197,835,799** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | | 54,849,907 | - | 54,849,907 |
| බීජ පැල ව්‍යාපෘතිය සඳහා ලැබූ අත්තිකාරම් | | 60,550,000 | - | 60,550,000 |
| අයබදු ගෙවීම් | | 9,449,908 | - | 9,449,908 |
| වසරක් තුල කල්බදු ගෙවිය යුතු ණයකරුවෝ | | 679,066 | - | 679,066 |
| ජනවසම/ශ්‍රීලංරාවැස ට කලබදු ගෙවීමට ඇති වගකීම් | | 1,686,098 | - | 1,686,098 |
| | | **127,214,979** | **-** | **127,214,979** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **1,107,029,170** | **-** | **1,107,029,170** |

# ගිණුම්කරණ සටහන්...

## 04. SLFRS/LKAS සංක්‍රාන්තියට විවරණ (සම්බන්ධයි)

### 4.2. 2011 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය සංසන්දනය

| | සටහන් | SLFRS/LKAS 2011 දෙසැම්බර් 31 දිනට රු. | සංක්‍රාන්තියේ බලපෑම් රු. | SLAS 2011 දෙසැම්බර් 31 දිනට රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම් | | 89,932,315 | - | 89,932,315 |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස දේපල පිරයත හා උපකරණ හිමිකම් | | | | |
| (භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම්, බදු දී ඇති ජෛව හිමිකම් හැර) | A | 6,765,412 | (47,795,464) | 54,560,876 |
| ජනවසම ඉඩමේ / ශ්‍රීලංරාවැස කල්බදු ජෛව වත්කම් | A | 47,795,464 | 47,795,464 | - |
| ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර) | B / 35 | 310,819,874 | 3,903,000 | 306,916,874 |
| දේපල පිරයත හා උපකරණ හිමිකම් | | **105,012,777** | - | **105,012,777** |
| | | **560,325,842** | **3,903,000** | **556,422,842** |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | C | 94,295,259 | (3,903,000) | 98,198,259 |
| විකිණීමට ඇති වත්කම් | | 134,707 | - | 134,707 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | D | 46,722,748 | (12,595,745) | 59,318,493 |
| සම්බන්ධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ප්‍රමාණය | | 2,157,952 | - | 2,157,952 |
| රාජ්‍ය ආයතන වලට ලබා දුන් පහසු කම් | | 113,357,808 | - | 113,357,808 |
| වෙනත් ජංගම වත්කම් | D | 12,595,745 | 12,595,745 | - |
| කෙටි කාලීන ආයෝජන | | 244,813,796 | - | 244,813,796 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | | 4,941,327 | - | 4,941,327 |
| | | **519,019,342** | **(3,903,000)** | **522,922,342** |
| **මුළු වත්කම්** | | **1,079,345,184** | **-** | **1,079,345,184** |
| **ස්කන්ධය සහ වගකීම්** | | | | |
| **ප්‍රාග්ධන සංචිත** | | | | |
| කොටස් ප්‍රාග්ධනය | | 200,000,010 | - | 200,000,010 |
| රඳවා ගත් ආදායම් | 35 | 584,648,044 | - | 584,648,044 |
| මුළු ස්කන්ධය | | **784,648,054** | - | **784,648,054** |
| **ජංගම නොවන වත්කම් සහ විලම්බිත බදු** | | | | |
| විලම්බිත බදු වගකීම් | | 27,382,429 | - | 27,382,429 |
| විලම්බිත ප්‍රදාන සහ සහනාධාර | | 8,877,638 | - | 8,877,638 |
| විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම | | 50,730,900 | - | 50,730,900 |
| ජනවසම/ශ්‍රීලංරාවැස ට කල්බදු ගෙවීමට ඇති වගකීම් | | 117,100,799 | - | 117,100,799 |
| | | **204,091,766** | - | **204,091,766** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | | 52,401,434 | - | 52,401,434 |
| බීජ පැල ව්‍යාපෘතියට ලද අත්තිකාරම් | | 27,203,347 | - | 27,203,347 |
| අයබදු ගෙවීම් | | 9,247,041 | - | 9,247,041 |
| ජනවසම/ශ්‍රීලංරාවැස ට කලබදු ගෙවීමට ඇති වගකීම් | | 1,753,542 | - | 1,753,542 |
| | | 90,605,364 | - | 90,605,364 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | **1,079,345,184** | **-** | **1,079,345,184** |

# ගිණුම්කරණ සටහන්...

## 04. SLFRS/LKAS සංක්‍රාන්තියට විවරණ (සම්බන්ධයි)

### 4.3 2011 දෙසැම්බර් 31 දිනට මුළු විස්තීර්ණ ආදායම් සංසන්දනය

| | සටහන් | SLFRS/LKAS 2011 දෙසැම්බර් 31 දිනට රු. | සංක්‍රාන්තියේ බලපෑම් රු. | SLAS 2011 දෙසැම්බර් 31 දිනට රු. |
|---|---|---|---|---|
| අයභාරය | E | 322,908,950 | (45,105,294) | 368,014,243 |
| අලෙවි වියදම් | F | (159,680,875) | 45,141,473 | (204,822,348) |
| **දළ ලාභය** | | **163,228,075** | **36,179** | **163,191,895** |
| වෙනත් ආදායම් සහ ලැබීම් | G | 30,418,505 | (33,128,217) | 63,546,722 |
| පරිපාලන වියදම් | | (92,453,554) | - | (92,453,554) |
| වෙනත් වියදම් | H | (15,351,844) | (36,179) | (15,315,664) |
| මෙහෙයුම් වලින් ලද ලාභය | | 85,841,182 | (33,128,217) | 118,969,399 |
| මූල්‍ය ආදායම් | G | 33,128,217 | 33,128,217 | |
| මූල්‍ය වියදම් | | (23,198,183) | - | (23,198,183) |
| **අයබදු වියදම් වලට පෙර ලාභය** | | **95,771,216** | **-** | **95,771,216** |
| අයබදු වියදම් (වෙන්කිරීම්) | | (18,101,554) | - | (18,101,554) |
| **වර්ෂයේ ලාභය** | | **77,669,662** | **-** | **77,669,662** |

# ගිණුම්කරණ සටහන්...

## 04. SLFRS/LKAS සංක්‍රාන්තියට විවරණ (සම්බන්ධයි)
**බදු දේපල, පිරියත උපකරණ**

### A. වර්ගීකරණයේ වෙනස් කිරිම

බදු ගිවිසුම යටතේ ජනවසම හා ශ්‍රීලංරාවැස වෙන් අතපත් කර ගත් මේරු/නොමේරු ඉඩම් වල වටිනාකම නැවත වර්ගීකරණය. ඒවා ජනවසම/ශ්‍රීලංරාවැස බදු හිමි නිශ්චල ජෛව වත්කම් වශයෙන් නම් කරන ලදී. මෙම වත්කම් මේරූ/නොමේරු ඉඩම් සඳහා කල ආයෝජනද ඇතුලත් ය.

**ප්‍රතිවර්ගීකරණය ට පෙර** - ජනවසම/ශ්‍රීලංරාවැස ට අයිත් (නිශ්චල බදුකර) දේපල,පිරියත හා උපකරණ (මුදු ඉඩම් හා ජෛව බදු කර හැර)
**ප්‍රතිවර්ගීකරණය ට පසු** - ජනවසම/ශ්‍රීලංවැරාස ජෛව බදු වත්කම ලෙස වර්ගීකරණය කර ඇත.

| | 2011 දෙසැම්බර් 31 රු. | 2011 ජනවාරි 01 රු. |
|---|---|---|
| SLAS යටතේ ජනවසම/ශ්‍රීලංරාවැස නිශ්චල බදු වතු (මුඩු ඉඩම් හැර) | 54,560,876 | 59,247,609 |
| අඩුකළා : | | |
| ජෛව බදු හිමිකම් වල වටිනාකම | (47,795,464) | (51,233,337) |
| SLFRS/LKAS යටතේ ජනවසම/ශ්‍රීලංරාවැස නිශ්චල බදු වතු (භාවිතයට අයිතියක් ඇති හා ජෛව බදු වත්කම් හැර) වත්කම් | **6,765,412** | **8,014,271** |

### B. ජෛව වත්කම් (ජෛව බදු වත්කම් ද ඇතුළුව)

**1. වර්ගීකරණයේ වෙනස් කිරිම**

ජනවසම/ශ්‍රීලංරාවැස ගෙන් බදු ගිවිසුම යටතේ අත්පත් කර ගත් මේරු/නොමේරූ වගා වලට අමතරව ජෛව බදු වත්කම් වලට LKAS 41 අනුකූලව කිරි පහු සමපත්ද අයත් වේ. තොග වශයෙන් වර්ගීකරණය කරන ලද මෙම සම්පත් ජෛව වත්කම් ලෙස ප්‍රතිවර්ගීකරණය කරන ලදී. ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද මෙම සම්පත් වල වටිනාකම පිළිවෙලින් 2011 ජනවාරි 31 සහ 2011 දෙසැම්බර් 01 දිනට රු. 3,903,000/ සහ රු. 3,700,000/ විය.

**ප්‍රතිවර්ගීකරණය ට පෙර** - තොග
**ප්‍රතිවර්ගීකරණය ට පසු** - ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් ඇතුලත්ව)

| | සටහන් | 2011 දෙසැම්බර් 31 රු. | 2011 ජනවාරි 01 රු. |
|---|---|---|---|
| SLAS යටතේ මේරූ සහ නොමේරු වගා | 30 | 306,916,874 | 270,898,084 |
| එකතු කළා : | | | |
| තොග වල ඇතුලත් කිරි පටිටිය පශු සම්පත්ද ඇතුළුව ප්‍රතිවර්ගීකරණය | | 3,903,000 | 3,687,000 |
| **SLFRS/LKAS** යටතේ ජෛව සම්පත් | | **310,819,874** | **274,585,084** |

**2. ජෛව වත්කම් වල සාධාරණ අගය**

SLAS ක්‍රමය යටතේ පොල් සහ සහ වෙනත් වගාවන් මනිනු ලැබුයේ ක්ෂවීම්, ක්‍රමක්ෂයවීම් හා යම් අපහානයක් ඇතොත් ඒවා පිරිවැයෙන් අඩු කිරීමෙනි. නමුත්, LKAS 41 යටතේ ජෛව වත්කම් සාධාරණ අගය ලෙස හඳුනා ගැනීමේදී වරලත් ගණකාධිකාරී ආයතනය 2012 මාර්තු 2 වැනි දින නිකුත් කළ නියෝගයට අනුව එම අගය වෙනස් නොවේ. එබැවින්, සමාගම ජෛව වත්කම් උදා: පොල් ක්ෂේත්‍රයේ භාවිතා කරන්නේ LKAS 16 දේපල, පිරියත හා උපකරණ ආකෘතිය තෝරාගෙන පවත්වාගෙන යන ලදී. මෙය 2011 ජනවාරි 01 දින හෝ 2011 දෙසැම්බර් 31 දින හෝ 2011 ජනවාර් 01 දින මූල්‍ය ප්‍රකාශන වලට හා 2011 දෙසැම්බර් 31 දිනට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට කිසිදු බලපෑමක් ඇති කර නොමැත.

# ගිණුම්කරණ සටහන්...

## 04. SLFRS/LKAS සංක්‍රාන්තියට විවරණ (සම්බන්ධයි)

C. තොග

1. වර්ගීකරණයේ වෙනස් කිරීම
**ප්‍රතිවර්ගීකරණය ට පෙර** - තොගය
**ප්‍රතිවර්ගීකරණය ට පසු** - ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් ඇතුලත්ව)

| | 2011 දෙසැම්බර් 31 රු. | 2011 ජනවාරි 01 රු. |
|---|---|---|
| SLAS යටතේ ඇති තොග | 98,198,259 | 28,525,720 |
| අඩුකලා: නව වර්ගීකරණ ජෛව වත්කම් | (3,903,000) | (3,687,000) |
| **LKAS / SLFRS යටතේ තොග** | **94,295,259** | **24,838,720** |

2. **නිෂ්පාදිත තොග**

LKAS 32 අනුව ජෛව නිෂ්පාදිත වත්කම් එනම්, පොල් ඒවායේ සෘජු අලෙවි වියදම් හැර තථ්‍ය මිලට හෝ ඇස්මේන්තු මිලට අගය කරන ලදී. නව ගිණුම් කරණ ප්‍රමිතා වලට පරිවර්තන වීමේදී, ජෛව වත්කම් වලින් අස්වද්දන කෘෂි නිෂ්පාදන, එනම්, පොල් අස්වන්න නෙලන ස්ථානයේදීම සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩු කර මැන ගැනීමට අවශ්‍ය යි.ඉන්පසු LKAS 2 ප්‍රමිතිය ව්‍යවහාර කරණ දිනට සාධාරන අගයේ පිරිවැය ලෙස සළකණු ඇත. අවසානයේ LKAS 2 ට අනුව තොග මැනීම කරන ලබන්නේ ඇස්මේන්තු කළ ලැබිය හැකි මුදල හා අවම පිරිවැය යන දෙකෙන් අඩු අගයටයි.

D. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ/වෙනත් ජංගම වත්කම්

1. වර්ගීකරණයේ වෙනස් කිරීම
**ප්‍රතිවර්ගීකරණය ට පෙර** - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ
**ප්‍රතිවර්ගීකරණය ට පසු** - වෙනත් ජංගම වත්කම්.

LKAS 32 & 39, ව්‍යවහාර කිරීම හේතුකොට ගෙන මුල්‍ය නොවන වත්කම් (අත්තිකාරම් සහ ගෙවීම්) වෙළඳ හා වෙනත් ලැබීම් යටතේ වෙනත් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

| | 2011 දෙසැම්බර් 31 | 2011 ජනවාරි 01 |
|---|---|---|
| SLAS යටතේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 59,318,493 | 75,497,340 |
| අඩුකළා: ප්‍රතිවර්ගීකරණය කළ අත්තිකාරම්, ගෙවීම් සහ වෙනත් ජංගම වත්කම් | (12,595,745) | (19,013,033) |
| **LKAS / SLFRS යටතේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | **46,722,748** | **56,484,307** |

E. අයභාරය

**නිෂ්පාදිත තොග අයභාරය ලෙස හඳුනා ගැනීම**

SLAS 32 අනුව බහු වාර්ෂික භෝග අස්වැන්න නෙලන මුල්‍ය කාලය තුළ ලාභ හා පාඩු ලෙස හඳුනා ගෙන ඇත. එබැවින් නොවිකුණු තොග අයභාරයේ කොටසක් ලෙස සැළකේ. LKAS 18 ට අනුව අයභාරය හඳුනා ගැනීම වෙනස් වී ඇත. එම නිසා අයභාරය හඳුනා ගනු ලබන්නේ වෙන්දේසි කළ දිනය අනුව වන හෙයින් වෙන්දේසි කල ප්‍රමාණය අලෙවි කළ ප්‍රමාණය ලෙස හඳුනා ගනු ඇත.මෙම වර්ගීකරණය 2011 ජනවාරි 01 දා හෝ 2011 දෙසැම්බර් මස 31 වැනදා මුල්‍ය ප්‍රකාශනයන්ට කිසිදු බලපෑමක් නොකරයි. කෙසේවුවද, වසරේ විස්තීර්ණ ප්‍රකාශනයේ අයභාරය රු. 45,141,474.26 ක අඩුවක් පෙන්නුම් කරයි.

| SLFRS/LKAS ගැලපීම් වල ස්වාභාවය | වසරේ විස්තීර්ණ ප්‍රකාශනයට ඇති බලපෑම් 2011 දෙසැම්බර් 31 රු. |
|---|---|
| අයභාරයේ කොටස් වූ නොවිකුණු තොග ඉවත් කිරීම | (56,256,333.26) |
| එකතු කළා: වසරේ උපලබ්ධිත ආරම්භක ශේෂය | 11,151,039.32 |
| එකතුව | **(45,105,293.94)** |

# ගිණුම්කරණ සටහන්...

